රළ සමග

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

ISSN 1391 - 1031
2018 සැප්තැම්බර්
24 වෙළුම 05 කලාපය

ආධාරය රු 40/=

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

*"රජය පරිපාලනය කිරීම සහ සමාජවාදී සමාජයේ සංවිධානාත්මක වර්ධනය මෙහෙයවීම කළ හැක්කේ ඊනියා උසස් පංතිවල අයට පමණක්ය, ධනවතුන්ට පමණක්ය, ධනවාදයේ පාසලෙන් ඉගෙනගත් අයට පමණක්ය යන පැරණි, අමන, වනචාරී, තුච්ඡ, පිළිකුල දනවන දුර්මතය කෙසේ හෝ බිඳ දැමිය යුතුය."*

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**07වැනි වෙළුම,**
**79 පිටුව**

**05**
**හුස්ම ගත්තු වසර...**



"ආණ්ඩුවේ බොරු පුරාජේරුවලට නොරැවටී ගෙවුණු වසර තුනක හවුල් පාලනය පමණක් නොව ගෙවුණු වසර 70ක ධනපති පාලනයට...

**07**
**සිංගප්පූරු + ශ්‍රී ලංකා...**



මෙම රටට හානිකර ගිවිසුමෙන් සේවා ක්ෂේත්‍රය යටතේම වෙනත් රටවල බැහැර කරන කැළිකසළ හා මලාපවාහන අපද්‍රව්‍යද...

**09**
**සමාජවාදය තුළ...**



සමාජවාදය තුළදී කලාවද එහි ජීවමය වස්තුවද තවදුරටත් සුඛෝපභෝගී භාණ්ඩයක්...

**11**
**සැබෑ ඉතිහාසය...**



මිනිස්සු සිය ඉතිහාසය දැන ගැනීමට කැමැත්තක් දක්වති. ඒ, එමගින් තමන්ගේම අතීතය දෙස බැලිය හැකි නිසාය. මිනිසාගේ සමාජීය ගමන්මඟ යනු අතීතයේ සිට වර්තමානය...

සංවාදය.......... 03
තරුණ.......... 04
ආවර්ජනා.......... 06
ජාත්‍යන්තර.......... 08
කාන්තා.......... 10
කාලීන.......... 12
වේදිකාව.......... 13
විශේෂාංග.......... 14

# රට දරුණු ආර්ථික අර්බුදයක

**රටේ නිෂ්පාදන ආර්ථිකයක් නොමැතිවීමත් නිෂ්පාදන මාර්ග ඵලදායී නොවීමත් අපනයන ආදායම් පහළයාමත් හමුවේ ආණ්ඩුවට කිසිසේත් පාලනය කර ගත නොහැකි ආකාරයකට රටේ ආර්ථිකය භයානක ලෙස කඩාවැටෙමින් ඇතැයි ආර්ථික විශ්ලේෂකයෝ අනතුරු අඟවති.**

මේ වන විට ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය 162/-ද ඉක්මවා පහත වැටී ඇති අතර 2018 වසරේ මේ දක්වා රුපියල 5%කින් අවප්‍රමාණය වී තිබීම මෙම ආර්ථික කඩාවැටීමේ ප්‍රකාශනයක් බව පෙන්වා දෙන ඔවුහු රටේ විදෙස් වත්කම් කඩාවැටීම හා ආනයන අපනයන හිඟය විශාල ලෙස පුළුල් වී තිබීම ඊට ආසන්නතම හේතු ලෙස පෙන්වා දෙති. මේ වන විට රටේ සමස්ත ණය බර රුපියල් කෝටි දශ ලක්ෂය ඉක්මවා ඇති අතර ඒක පුද්ගල ණය ප්‍රමාණය රුපියල් ලක්ෂ පහ ඉක්මවා ඇත. 2018 වසරේ ණය පොලී වාරිකය වෙනුවෙන් රටට ගෙවීමට සිදුව ඇති මුදල ඩොලර් කෝටි 400කි.

මෙම තත්වය හමුවේ පොදු ජනතාව මහත් ආර්ථික පීඩනයකට මුහුණදී සිටින අතර රුපියලේ අගය කඩාවැටීම නිසා ව්‍යාපාරික ක්ෂේත්‍රයද අර්බුදයට මුහුණ පා ඇත. විශේෂයෙන් ආණ්ඩුවේ ආර්ථික අර්බුදය පියවා ගැනීම සඳහා සියලු දෙනා මත විශාල බදු බරක් පැටවීම හේතුවෙන් අලෙවිය කඩා වැටී ඇති නිෂ්පාදන හා සේවා ක්ෂේත්‍රයන් පමණක් නොව වෘත්තිකයන්, ව්‍යාපාරිකයන්, සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයින් දැඩි අසීරුතාවයකට මුහුණ පා ඇතැයිද පැවසේ. ආණ්ඩුව විසින් මෑතදී අත්සන් තබන ලද සිංගප්පූරු ගිවිසුම තවදුරටත් රටේ නිෂ්පාදනයන් කඩා වැටීමට හේතු වන බැවින් මේ පිළිබඳව නිෂ්පාදකයෝ බියට පත්ව සිටිති.

කෙසේ වුවද ආණ්ඩුව මෙම අර්බුදය සැඟවීම සඳහා 'ගම්පෙරළිය', 'එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා' හා 'ග්‍රාම ශක්ති' නමින් විශාල ප්‍රචාරක වියදම් දරමින් ජනතාව රැවටීමේ ව්‍යාපෘති ත්‍රිත්වයක් දියත් කර තිබේ. මින් පළමු ව්‍යාපෘති ද්විත්වය හවුල් ආණ්ඩුවේ **02 වැනි පිටුවට**





## ව්‍යාපාරයක් බවට පත්කරගත් දේශපාලනය අවසන් කළ යුතුයි



### ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා

**පාලක කල්ලි 70 වසරක් රට හැදිය නොහැකි බව ඔප්පු කර තිබෙන බව කියා සිටි ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා ව්‍යාපාරයක් බවට පත් කර ගෙන තිබූ දේශපාලනය අවසන් කළ යුතුව ඇති බවත් රට ගොඩනැගීම සඳහා සියලු දෙනාගේ සහයෝගය ජ.වි.පෙ.ට අවශ්‍ය බවත් පෙන්වා දුන්නේය.**

අනුර දිසානායක සහෝදරයා මෙම අදහස් පළ කළේ 'රට රකින රට හදන ජනතාවාදී පාලනයක්' තේමාව යටතේ පවත්වන ජනහමු මාලාවේ බෙන්තොට ජනහමුව අමතමිනි. එහිදී වැඩිදුරටත් අදහස් පළ කළ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"මහින්දට විධායකය, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙක, පළාත් සභා, ප්‍රාදේශීය සභා, සියල්ලම තිබිලත් වසර දහයක් තිස්සේ රට හදන්න බැරි වුණා. රනිලුත් දැන් වසර තුනහමාරක් තිස්සේ තමන්ට රට හදන්න බැරි බව ඔප්පු කරමින් සිටිනවා. තවදුරටත් ඒ ගැන සංවාද තියලා වැඩක් නැහැ. හැබැයි, ජනතා විමුක්ති පෙරමුණ ගැන සාමාන්‍ය ජනතාව හිතන්නේ වෙනස් විදියකට. හොරකම් කරන්නේ නැහැ. නාස්ති කරන්නේ නැහැ. ඒ දෙකටම විරුද්ධයි. ජනතාවට ප්‍රශ්නයක් ආවාම ඒකටත් මැදිහත්වෙනවා. ඒත් ජ.වි.පෙ. ගැන එහෙම හිතුවට රට හදන්න දෙන්න අවස්ථාවක් ආවාම හිතන්නේ ඒක කරන්න පුළුවන් රනිල්ටයි, මහින්දටයි විතරයි කියලයි. මේ අදහස සම්පූර්ණයෙන් වැරැදියි.

මේ රටට පිටරටින් වසරකට බඩු ගේන්න යන වියදම ඩොලර් කෝටි 2000යි. ඒත් අපේ බඩු පිටරටට විකුණලා ලැබෙන ආදායම ඩොලර් කෝටි 1000යි. එවැනි විශාල ආනයන අපනයන පරතරයක් ඇති කිරීමේ පූර්ණ ගෞරවය ලැබෙන්නේ වසර හැත්තෑවක් රට කරවූ අයටයි. රටේ නිෂ්පාදන කඩා වැටිලා. රටට අවශ්‍ය මිරිස්වලින් 72%ක්, සීනිවලින් 93%ක්, කිරි හා කිරිපිටිවලින් 83%ක්, රෙදි සියල්ලත් පිටරටින් ගෙන්වනවා. වසර හැත්තෑවක් ගතවෙනකොට කිසිවක් නිපදවන්නේ නැති රටක් බවට පත් කර තිබෙනවා."

## රට වෙනස් කරන්න ජනතාව වෙනස් විය යුතුයි



### ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා

**රට වැටී ඇති අගාධයෙන් ගොඩගැනීමට නම් අලුත් මඟක යා යුතු බව අවධාරණය කළ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා ඒ වෙනුවෙන් මෙතෙක් දේශපාලනය නොකළ උගතුන් බුද්ධිමතුන්, වෘත්තීයවේදීන් තම නිහැඬියාව බිඳීමට තීන්දුවක් ගෙන, රටට අවශ්‍ය ප්‍රතිපත්ති හැදීමට සහ ඒවා ක්‍රියාත්මක කර රට ඉදිරියට ගෙනයෑමට සූදානම් බැවින් රට වෙනස් කිරීමට නිසැක ලෙසම ජනතාව වෙනස් විය යුතුව ඇති බව පෙන්වා දුන්නේය.**

ටිල්වින් සිල්වා සහෝදරයා මේ බව කියා සිටියේ ජනහමු මාලාවේ මීගහතැන්න ජනහමුව අමතමිනි. වැඩිදුරටත් අදහස් දක්වමින් ටිල්වින් සහෝදරයා මෙසේද පැවසීය.

"අද මේ රටේ සමාජ, ආර්ථිකය පමණක් නෙවෙයි දේශපාලනයත් මුළුමනින්ම පිරිහිලා ගිහිල්ලා. රුපියල් කෝටි ගණනක් වැය කරන පාර්ලිමේන්තුවෙ දවස ගාණෙ රණ්ඩු කරගන්නවා. කථානායකවරයාටත් 'ලොන්තපෝල්' කියන දේශපාලනඥයන් අද පාර්ලිමේන්තුවේ ඉන්නවා. රටේ උත්තරීතර යැයි කියන ආයතනය තුළ කතා වෙන්නෙ මොනවාද? දේශපාලනය ඒ තැනට පිරිහිලා. දේශපාලනඥයන්ගෙන් එක්කෝ හොරු. නැත්නම් වංචාකාරයෝ. නැත්නම් අපරාධකාරයෝ.

දේශපාලනයට සාපේක්ෂව සමාජයත් පිරිහිලා. අපරාධ වැඩිවෙලා. හොරකම් වැඩිවෙලා. දිවි නසාගැනීම් වැඩිවෙලා. කලින් තිබුණ රට අපට දැන් නැහැ කියලා හැමෝටම තේරෙනවා. අපේ රටේ දරුවකුට පාරෙ බැහැලා යන්න බැරි තත්වයක් අද උදා වෙලා. රට වටේටම පාතාලය පැතිරිලා. මත්ද්‍රව්‍ය පැතිරිලා. සදාචාරය අන්තයටම පිරිහිලා.

අපි මාරු කළ යුත්තේ මුහුණු නෙවෙයි. මාරු කළ යුත්තේ පක්ෂ නෙවෙයි. අපි මාරු කළ යුත්තේ මේ වැරැදි ක්‍රමවේදය. මේ වැරැදි සමාජ ආර්ථික ක්‍රමයයි."

**යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!**

# සටන් බිම

## මංකොල්ලකෑ ගුරු- විදුහල්පති හිඟ වැටුප් ගෙවනු!



ආණ්ඩුව නව ගුරු සේවා ව්‍යවස්ථාව මගින් 225,000ක් පමණ වන මෙරට ගුරුවරුන්ගේ උසස්වීම්වලට අදාළ හිඟ වැටුප් කප්පාදුවට එරෙහිව ගුරු විදුහල්පති පෙරමුණ මගින් මානව හිමිකම් කොමිසම වෙත කරන ලද පැමිණිල්ල පසුගියදා විභාගයට ගන්නා ලදී.

මෙම අවස්ථාවට සහභාගි වූ ගුරු විදුහල්පති පෙරමුණේ කැඳවුම්කරු මහින්ද ජයසිංහ සහෝදරයා අදහස් දක්වමින් කියා සිටියේ පසුගිය රාජපක්ෂ පාලන කාලය තුළත් ඊට පෙරත් ගුරු විදුහල්පතිවරුන්ට හිමිවිය යුතු හිඟ වැටුප් අහිමි කරමින් එය මංකොල්ලකා ඇති බැවින් වත්මන් ආණ්ඩුව සමස්ත ගුරු විදුහල්පතිවරුන්ට හිමි විය යුතු මෙම හිඟ වැටුප් ගෙවීමට කටයුතු කළ යුතු බවය. ඒ වෙනුවෙන් ඉදිරියේදී දැවැන්ත අරගලයක් රට පුරා දියත් කිරීමට කටයුතු යොදා ඇති බවද මහින්ද ජයසිංහ සහෝදරයා පැවසීය. මෙම අවස්ථාවට ලංකා ගුරුසේවා සංගමයේ සභාපති දම්මික අලහප්පෙරුම සහෝදරයාද සහභාගි විය.

## EPF කොල්ලකෑමට එරෙහිව ලංවිම සම්මන්ත්‍රණයක්




EPF කොල්ලකෑමට හා වැටුපෙන් බදු අයකිරීමට එරෙහිව සංවිධානය කරන ලද සම්මන්ත්‍රණයක් පසුගියදා රජයේ ලිපිකරු සංගම් ශාලාවේදී පැවැත්විණි. ලංකා විදුලි සේවක සංගමය විසින් සංවිධානය කරන ලද මෙම සම්මන්ත්‍රණය ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ ජාතික සංවිධායක වසන්ත සමරසිංහ සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවති අතර ලංකා විදුලි සේවක සංගමයේ ප්‍රධාන ලේකම් රංජන් ජයලාල් සහෝදරයා ඇතුළු වෘත්තීය සමිති නියෝජිතයෝ සහභාගි වී සිටියහ.

## ILO කලාපීය සමුළුවකට වසන්ත සමරසිංහ ඉන්දියාවට



ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවති ජාත්‍යන්තර කම්කරු සම්මේලනයේ කලාපීය සමුළුවක් වෙනුවෙන් අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ සහෝදරයා සහභාගි විය. කලාපීය සේවකයින්ගේ අවම වැටුප් සකස් කිරීම සම්බන්ධයෙන් පැවැත්වෙන වැඩමුළුවක් සඳහා පැවති මෙම වැඩමුළුවට රටවල් 15ක පමණ නියෝජිතයින් සහභාගි වී ඇත.

## EDCS සාමාජික දරුවන්ට රු.මි. 112ක ශිෂ්‍යත්ව



ලංකා ගුරු සේවා සංගමය මගින් පාලනය වන අධ්‍යාපන සේවකයින්ගේ සමුපකාර ණයදෙන සමිතියේ සාමාජිකයන්ගේ විශ්වවිද්‍යාල ප්‍රවේශය ලැබූ දරුවන්ට සිය අධ්‍යාපන කටයුතු සිදුකරගෙන යාම සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීමේ කටයුතු මේ දිනවල සිදුකරමින් පවතියි.

එහි 2018 වසර සඳහා විශ්වවිද්‍යාල වරම් ලැබූ දිවයිනේම දරුවන් 2110කට රුපියල් මිලියන 112ක් වටිනා ශිෂ්‍යත්ව පිරිනැමීම සිදුකරනු ලබන අතර එහි වයඹ පළාත් ශිෂ්‍යත්ව පිරිනැමීමේ කටයුතු පසුගියදා කුරුණෑගල නගර ශාලාවේදී පවත්වන ලදී. මේ වනවිට තවත් පළාත් රැසක මෙසේ ලංකා ගුරු සේවා සංගමය මගින් ශිෂ්‍යත්ව පිරිනැමීමේ කටයුතු සිදු කර තිබේ.

## වරාය සමුපකාර බැංකුව රටේ හොඳම බැංකුව වෙයි

ජ.වි.පෙ. සමස්ත ලංකා වරාය පොදු සේවක සංගමය මගින් පාලනය වන වරාය සේවක සමූපකාර බැංකුව රටේ හොඳම සමුපකාර බැංකුව ලෙස සම්මාන හිමිකරගෙන තිබේ. මේ වනවිට වසර 14ක පමණ කාලයක් පුරා වරාය සමුපකාරයේ බලය හොබවනු ලබන්නේ එම සංගමය විසිනි.

ගිණුම් ශේෂයන් නිවැරදිව පවත්වාගෙන යාම, සුභසාධන කටයුතු සිදු කිරිම, නිවැරදිව විගණනයන් සිදු කිරීම, ළමා ගිණුම් පවත්වාගෙන යාම, නියමිත කාලයට නියමිත වැඩ කටයුතු සිදු කර අදාළ වාර්තා සමූපකාර දෙපාර්තමේන්තුව වෙත නිසි පරිදි ලබාදීම ආදී නිර්ණායක රැසක් සැලකීමට ලක් කරමින් මෙම සම්මාන පිදීම සිදු කර ඇත.

මෙලෙස සම්මානයට පාත්‍රවීම සම්බන්ධයෙන් අදහස් දැක්වූ සමස්ත ලංකා වරාය පොදුසේවක සමිතියේ ප්‍රධාන ලේකම් චන්ද්‍රසිරි මහගමගේ සහෝදරයා සඳහන් කර සිටියේ විනිදභාවයකින් යුතුව මූල්‍ය කටයුතු පවත්වාගෙන යාමත් නිලධාරීන්ගේ සහ සේවකයන්ගේ කාර්යක්ෂම වැඩ රටාව සහ කැපවීමෙන් යුතුව නිවැරදිව වැඩ කිරීමත් නිසා වරාය සමුපකාර බැංකුව දිවයිනේ හොඳම බැංකුව ලෙස සම්මානයට පාත්‍රවූ බවයි.

# එතෙරින්...

## වෙනිසියුලාවට සහාය පළ කිරීමට ඔස්ට්‍රේලියාවේදී ජවිපෙ එක්වෙයි



වෙනිසියුලාවේ අධිරාජ්‍ය විරෝධී අරගලය සඳහා සුබ පැතීමට ඔස්ට්‍රේලියානු කොමියුනිස්ට් පක්ෂය සූදානම් කළ උද්ඝෝෂණ රැස්වීමකට ජ.වි.පෙ. ඔස්ට්‍රේලියානු කමිටුවේ නියෝජිතයෝ සහභාගි වූහ. පසුගිය අගෝස්තු 25 දින ඔස්ට්‍රේලියාවේ ඇඩිලේඩ්හි ෆිදෙල් කැස්ත්‍රෝ අනුස්මරණ ශාලාවේදී මෙම උත්සවය පැවැත්විණි. මෙහි ප්‍රධාන ආරාධිතයා ලෙස ඔස්ට්‍රේලියාවේ වෙනිසියුලානු තානාපතිවරයා සහභාගි විය.

## ඔස්ට්‍රේලියානු කොමියුනිස්ට් පක්ෂය හා ජවිපෙ අතර හමුවක්



ඔස්ට්‍රේලියාවේ කොමියුනිස්ට් පක්ෂය හා ජවිපෙ ඔස්ට්‍රේලියානු කමිටුව අතර හමුවක් පසුගියදා ඇඩිලේඩ්හිදී පැවැත්විණි. මෙහිදී දෙපාර්ශ්වය විසින් ජාත්‍යන්තර දේශපාලනයේ වර්තමාන ප්‍රවණතා පිළිබඳව දීර්ඝ සාකච්ඡාවක් කළ අතර ජවිපෙ නියෝජිතයින් විසින් ලංකාවේ වත්මන් තත්වය පිළිබඳවත් විධායක ජනාධිපති ධුරය අහෝසි කර රටට ප්‍රජාතන්ත්‍රවාදය දිනාදීමට ගනු ලබමින් තිබෙන ජ.වි.පෙ. ක්‍රියාමාර්ග පිළිබඳවත් දැනුවත් කර ඇත. ඉදිරියටත් සහයෝගයයෙන් කටයුතු කිරීමට දෙපාර්ශ්වය එකඟ වි ඇත.

## විදේශ රැකියා ඇමති හරීන් - ඕමාන 'එතෙර අපි' හමුවක්



ඕමානයේ 'එතෙර අපි' සංවිධානයේ නියෝජිතයන් සහ විදේශ රැකියා අමාත්‍ය හරීන් ප්‍රනාන්දු අතර හමුවක් පසුගියදා ඕමානයේ තානාපති කාර්යාලයේදී පැවැත්විණි. මෙම හමුවට ඕමානයේ ශ්‍රී ලංකා තානාපති එම්.කේ. පත්මනාදන් මහතා සහ විදේශ සේවා නියුක්ති කාර්යාලයේ නිලධාරීහුද සම්බන්ධ වූහ. මෙහිදී, විදේශ ගමන් බලපත්‍ර අලුත් කර ගැනීමේදී ඇතිවෙන ප්‍රමාදයන් පිළිබඳවත් ත්‍රිවිධ හමුදාවෙන් විශ්‍රාම ගෙන විදේශ ආරක්ෂක අංශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයන් හට එම සේවය තහවුරු කිරීමට අවශ්‍ය ඩිප්ලෝමා සහතිකයක් පිරිනැමීම පිළිබඳවත් තවත් විදේශ යන ශ්‍රී ලාංකිකයන් මුහුණ දෙන ගැටලු පිළිබඳවත් සාකච්ඡා කර ඇත.

## නේත්‍රා පරිගණක පාසලට ඕමානයේ සහෝදරත්වය...



රිදීමාලියද්ද විමුක්ති සංසදය පවත්වාගෙන යන පරිගණක පාසල සඳහා අවශ්‍ය උපකරණ පරිත්‍යාගයක් ඕමානයේ 'එතෙර අපි' සංවිධානය විසින් පසුගියදා සිදු කරන ලදී. මේ අවස්ථාවට ඕමානයේ 'එතෙර අපි' නියෝජිතයෝ සහ බදුල්ල දිස්ත්‍රික් ජ.වි.පෙ. සංවිධායක පළාත් සභා මන්ත්‍රී සමන්ත විද්‍යාරත්න සහෝදරයා ඇතුළු ජ.වි.පෙ. ක්‍රියාකාරීහු සහභාගි වූහ.

## ස්වීඩන් 'එතෙර අපි' ගිම්හාන ක්‍රියාකාරකම්...



'එතෙර අපි' සංවිධානයේ ස්වීඩන් ශාඛාව සංවිධානය කළ ගිම්හාන ක්‍රියාකාරකම් වැඩසටහන ඉතා සාර්ථක අයුරින් අගෝස්තු 18 දින ස්ටොක්හෝම්හිදී පැවැත්විණි. සංගීත වැඩසටහන්, නාට්‍ය වැඩසටහන් ඇතුළු විශේෂාංග රාශියක් පැවැති මෙම අවස්ථාවට ශ්‍රී ලාංකිකයෝ විශාල පිරිසක් සහභාගි වූහ.

## රට දරුණු...

පළමු පිටුවෙන්

එ.ජා.ප. පාර්ශ්වය විසින් ක්‍රියාත්මක කරන අතර තෙවැන්න ජනාධිපතිවරයා විසින් මෙහෙය වනු ලබයි. මෙම වැඩසටහන් පසුගිය රාජපක්ෂ පාලනයේ 'දැයට කිරුළ', 'අපි වවමු රට නගමු, 'ගම නැගුම' වැනි ප්‍රචාරක ව්‍යාපෘති හා සමාන වන අතර එම වැඩසටහන්ද ඒවා මෙහෙය වූ ප්‍රබලයින්ගේ සේප්පු පිරවීම හැරෙන්නට අවසාන විග්‍රහයේදී රටේ දළ ජාතික නිෂ්පාදිතය ඉහළ නැංවීමේලා අසමත් වී තිබිණි.

මේ තත්වය පිළිබඳව නියමුවා කරන ලද විමසුමකට පිළිතුරු දුන් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා කියා සිටියේ, පෙර පාලනයන් පරිදිම වත්මන් ආණ්ඩුවද අධිරාජ්‍යවාදී ආර්ථික වට්ටෝරුවම අනුගමනය කරමින් සිටින බවත් සිදුවෙමින් යන මෙම ආර්ථික විනාශයෙන් රට මුදා ගැනීමට නම් පැලැස්තර වෙනුවට ආර්ථික ක්‍රමයේ ගැඹුරු පරිවර්තනයක් සිදුවිය යුතුව ඇති බවත්ය. "පාලකයින් විවිධ නම්වලින් ගෙන එන ආර්ථික මල්වෙඩි සංදර්ශනවලින් මුලා නොවී රට තුළ සැබෑ සමාජ ආර්ථික වෙනසක් කිරීම සඳහා ජනතාව පෙළගැසිය යුතුයි" ටිල්වින් සහෝදරයා වැඩිදුරටත් අවධාරණය කළේය.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

## ජනාධිපතිවරණය, මහින්ද හා තුන්වැනි වාරයේ කථාව...

විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සඳහා වූ 20වැනි සංශෝධනය මේ වන විටත් ආරම්භයක් ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබ තිබේ. ඒ, ජනතා විමුක්ති පෙරමුණ විසිනි. එය පාර්ලිමේන්තුවේ සම්මත වී ජනමත විචාරණයකින්ද අනුමත වන්නේ නම් යළි රට තුළ ජනාධිපතිවරණයක් පැවැත්වෙන්නේ නැත. එහෙත් 20 සම්මත කර ගැනීම වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණ කටයුතු කරද්දී, අනෙක් ප්‍රධාන පක්ෂ එක් අතකින් 20 දෙස බලන අතරම අනික් අතින් ජනාධිපතිවරණයටද සූදානම් වෙමින් සිටී.

ජනාධිපතිවරණයක් පැවැත්වෙන්නේය යන උපකල්පනය මත කටයුතු කරන මහින්ද රාජපක්ෂ කණ්ඩායමේ පැත්තෙන් දැන් අලුත් තර්කයක් මතුව තිබේ. ඒ, මහින්ද රාජපක්ෂට තුන්වන වරටත් ජනාධිපතිවරණයකට තරග කළ හැකිය යන තර්කයයි. ඒ සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය විමසන බවක්ද පසුගියදා රාජපක්ෂ කණ්ඩායම විසින් ප්‍රකාශ කර තිබුණි.

වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ එක් පුද්ගලයෙකුට දෙවරකට වඩා ජනාධිපති ධුරය දැරීමට හෝ ඉදිරිපත්වීමට තිබූ නෛතික බාධාව 18වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් මහින්ද රාජපක්ෂ පාලනය විසින් ඉවත් කරනු ලැබීය. මහින්ද 2015 තුන්වන වරටත් තරග වැදුණේ ඒ අනුවය. එහෙත් 2015 ජනාධිපතිවරණයෙන් පසු දින 100 පාලනය තුළ ගෙන ආ 19වැනි සංශෝධනය මගින් යළිත් ජනාධිපති ධුරය සඳහා තේරී පත්වීමට එක් පුද්ගලයෙකුට ඇති අයිතිය අවස්ථා දෙකකට සීමා කරන ලදී. ඒ අනුව පැහැදිලිවම මහින්ද රාජපක්ෂට නැවත වරක් ජනාධිපතිවරණයකට තරග වැදිය නොහැක. එය කවුරුත් දන්නා සත්‍යයකි. එය මහින්ද රාජපක්ෂ මහතාද දනී. පසුගිය කාලය පුරාම (මේ වනතෙක්) ඔහු තමා නැවත ජනාධිපතිවරණයට තරග වදින බව නොකියා සිටියේ ඒ නිසාය. එහෙත් දැන් හදිසියේ තමන්ට නැවත වරක් තරග වැදිය හැකි බව ඔහු පවසයි. ඒ ඇයි? එය තේරුම් ගැනීම කාටත් හොඳය.

මහින්ද රාජපක්ෂ මහතා, තමන්ට නැවත වරක් ජනාධිපතිවරණයට ඉදිරිපත් විය හැකි බව දැන් පවසන්නේ එක් අතකින් ජනාධිපතිවරණයේදී නිශ්චිත නායකයෙක් නැතිකමින්, විපිළිසරවී දුර්මුඛවී සිටින තම පාක්ෂිකයන්ට යළි තාවකාලිකව හෝ බලාපොරොත්තුවක් ඇති කිරීම සඳහාය. දැන් නීතිය පිළිබඳව හෝ ව්‍යවස්ථාවේ රෙගුලාසි පිළිබඳ වැටහීමක් නැති මහින්දගේ පාක්ෂිකයන්ට බලාපොරොත්තුවේ සිහිනයක් තිබේ. ඒ, මහින්ද යළි ජනාධිපතිවරණයට එන්නේය යන්නය. එම සිහිනය තුළ ඔවුන්ට 2019 අග වෙනතුරු ජීවත් විය හැක. එයද මහින්දට සහනයකි. මහින්දවාදීන්ටද සිතට සහනයකි. ඒ ඇයි? ජනාධිපතිවරණයේ අපේක්ෂකත්වය පදනම් කරගෙන තම කණ්ඩායම තුළ මතුව තිබෙන අර්බුදය හා බෙදීම මේ මගින් තාවකාලිකව යටපත් කර ගත හැකි නිසාය.

මීළඟ ජනාධිපතිවරණයක් පැවැත්වෙන්නේ නම් ඒ සඳහා තරග වදින්නේ කවුරුන්ද යන ප්‍රශ්නය මත රාජපක්ෂ කණ්ඩායම තුළ පසුගිය කාලයේ ඇතිවූ අර්බුදය හා බෙදීම ඉතාම බරපතළ තත්වයක් දක්වා වර්ධනය විය. එයට හේතු වූයේ ජනාධිපතිවරණයකදී අපේක්ෂකයා වීමට මහින්දට නොහැකිවීමත්, වෙනත් කෙනෙකුට (රාජපක්ෂ පවුල තුළින් පවා) ජනාධිපති අපේක්ෂකත්වය දී, කැමැත්තෙන් පසුබැසීමට මහින්ද සූදානම් නොවීමත්, ඒ අතර මහින්ද වටා සිටින පිරිසක් මීළඟ ජනාධිපති අපේක්ෂකයා ලෙස ගෝඨාභය රාජපක්ෂ ගෙන ඒමට සූදානම් වීමත්, බැසිල් රාජපක්ෂද ජනාධිපති අපේක්ෂකත්වය ගැන සිහින මැවීමත් නිසාය. මේ තත්වය මත රාජපක්ෂ කණ්ඩායම තුනකට බෙදෙන තත්වයක් මතුවිය. සමහරු ගෝඨාභය වෙනුවෙන් කටයුතු කළ අතර සමහරු ඊට එරෙහිව 'මහින්ද හැර වෙනත් අය බැහැ' යන අදහසේ සිටියහ. ටිකදෙනෙක් බැසිල්ගේ පැත්තද ගෙන තිබුණි.

මෙම බෙදීම එළිපිට වාග් ප්‍රහාර දක්වා වර්ධනය වූ අයුරු අපි දුටුවෙමු. මහින්දානන්ද හා වෙල්ගම අතර ඇතිවූ ගැටුම ඊට එක් උදාහරණයකි. ඒ අතර තමන් නොසලකා ගෝඨාභය මතුවීම නොරිස්සූ මහින්ද අවස්ථා කීපයකදී ගෝඨාභයගේ 'ජනාධිපති හීනයට' බාධා කරන ලදී. එක් අවස්ථාවක මහින්ද කීවේ, වියත් මඟ යනුවෙන් දෙයක් නැති බවත්, ඉදිරියේ ක්‍රියාත්මක වන්නේද මහින්ද චින්තනයම බවත්ය. නැවත වරක් මහින්ද පන්සලකදී ප්‍රකාශ කළේ, තමා බලයට පත්වූ පසු ගෝඨාභයට තමා යටතේ වැඩ කළ හැකි බවය. ගෝඨාභයගේ ජනාධිපති අපේක්ෂක වීමේ උත්සාහයට මෙලෙස ප්‍රබල ප්‍රහාරයක් එල්ල කළ මහින්ද තාවකාලිකව ගෝඨාභය යටපත් කිරීමට සමත් විය.

එහෙත් අර්බුදය ඉන් විසඳෙන්නේ නැත. ඉදිරි දේශපාලනය සඳහා පාක්ෂිකයන් තම කණ්ඩායම වටා තබා ගැනීමට නම්, දැන් නායකත්ව කේන්ද්‍රයක් අත්‍යාවශ්‍යය. එය ජනාධිපති අපේක්ෂක ධුරයක් සමගද දැන් ගැටගැසී තිබේ. ගෝඨාභය යටපත් කළද ඒ වෙනුවට විකල්ප පුද්ගලයෙක් නැතිනම් පාක්ෂිකයා විසිරී යනු ඇත. විවිධ නම් විකල්ප ලෙස යෝජනාද වනු ඇත. එයද නැවත අර්බුදයකි. විසඳිය නොහැකි මෙම අභ්‍යන්තර අර්බුදය තාවකාලිකව යටපත් කර ගත හැක්කේ මහින්ද නැවත තරග කරන බව පැවසීමෙන් පමණි. මහින්දට තුන්වැනි වරටත් ජනාධිපතිවරණයට තරග කිරීමට හැකිය යන මතය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර ඇත්තේ මතුව ඇති මෙම අර්බුදය තාවකාලිකව හෝ සමනය කර ගැනීම සඳහාය. එසේ නැතිව මහින්දට තරග කළ හැකි නිසා නොවේ. එසේම ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය විමසීමටද මහින්දට නොපුළුවන. එය කළ හැක්කේ ජනාධිපතිවරයාට පමණි.

නැවත තරග වැදිය හැකිය යන ප්‍රකාශය මහින්ද තම කණ්ඩායම තුළ මතුවෙමින් ආ අර්බුදය තාවකාලිකව යටපත් කළද තව මාස කිහිපයකින් එය නැවත මතුවනු ඇත. දැන් මහින්ද ඉදිරියේ ඇත්තේ තෝරාගැනීම් දෙකකි. එක්කෝ මහින්ද වෙනත් පුද්ගලයෙකුට (සමහරවිට ගෝඨාභයට) අපේක්ෂකත්වය ලබාදී පසුබැසිය යුතුය. නැතිනම් 20වැනි සංශෝධනයට සහායදී ජනාධිපති ධුරය අහෝසි කරගත යුතුය. ව්‍යාජ සංකල්පවලින් දේශපාලන අර්බුද වැඩිකලක් සඟවා තැබීමට නොහැකි බව අවසාන වශයෙන් කිව යුතුය.

# රට හදන්න බුද්ධිමතුන්ගේ දායකත්වය ඉතිහාසයේ ප්‍රථම වතාවටයි



ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික
**බිමල් රත්නායක සහෝදරයා**

*නියමුවා:- ජනතා විමුක්ති පෙරමුණේ දායකත්වයද ඇතිව ජාතික විද්වත් සංවිධානය විසින් රට ගොඩනැගීම සඳහා වන වැඩපිළිවෙළක් සකස් කිරීම පසුගිය මාසයේ ආරම්භ කෙරුණා. ඉතිහාසයේ මෙතෙක් අත්නොදුටු මෙවැනි ජාතික ප්‍රතිපත්ති සම්පාදන වැඩපිළිවෙළක් සඳහා බුද්ධිමතුන්ගේ සහභාගිත්වය ලබාගැනීමට මුලපිරුණේ කෙහොමද?*

*බිමල් රත්නායක සහෝදරයා:-* පළමුවැනි ප්‍රශ්නය ගත්තොත් බුද්ධිමතුන් පැහැදිලිවම පංතිමය වශයෙන් කොටස් දෙකකට බෙදෙනවා. ධනේශ්වර බුද්ධිමතුන් සහ නිර්ධන පංතික බුද්ධිමතුන් කියලා. ඒ අතර පොදුවේ විශේෂයෙන් ධනේශ්වර සමාජයක මේ ධනේශ්වර බුද්ධිමතුන් අතරින්ම තමයි බහුතරයක් වාමාංශික ප්‍රගතිශීලී ව්‍යාපාරවලට සම්බන්ධ වෙලා සමහරවිට ඒවායේ නායකත්වයට පවා පත්වෙලා තිබෙන්නේ. උදාහරණයක් වශයෙන් ගත්තොත්, මාක්ස්, එංගල්ස්, ලෙනින් වගේ අය ගත්තත් ඔවුන් ධනේශ්වර උගතුන් පසුකාලීනව තමයි ඔවුන් නිර්ධන පාංතික බුද්ධිමතුන් බවට පත්වෙන්නෙ.

වර්තමානයේ ලංකාව තුළ සිදුවී තිබෙන දේ ගත්තොත් විශේෂයෙන්ම ලංකාවේ පැරණි වමේ ව්‍යාපාරය සමග ධනේශ්වර උගතුන් රාශියක් සම්බන්ධ වි සිටියා. පසුව ඔවුන් සමහරක් නිර්ධන පාංතික බුද්ධිමතුන් බවටත් පත් වුණා. මේ ව්‍යාපාරයේ ක්‍රියාධරයන් වුණා. නමුත් ඒ සම්ප්‍රදාය විශේෂයෙන් 1970න් 1980න් පස්සේ වමේ ව්‍යාපාරය පාවාදීම්, මර්දනය, විවෘත ආර්ථිකයේ මායාවට ගොදුරුවීම්, වරදාන සහ විශේෂයෙන්ම ගෝලීයකරණය මගින් ධනේශ්වර උගතුන්ට ලංකාවෙන් පිටත අවස්ථා විවර වීමත් එක්ක විශේෂයෙන්ම වාම ප්‍රගතිශීලී දේශපාලනය හා මේ ධනේශ්වර උගතුන් සම්බන්ධවීම 80 හා 90 දශකය තුළ පැහැදිලිවම අඩුවීමක් වුණා. ඒ වගේම තමයි 2000න් පස්සෙ අපේ රටේ මේ ධනේශ්වර උගතුන් සැලකිය යුතු ප්‍රමාණයක්, ඔවුන්ගෙන් වාම ප්‍රගතිශීලී අදහස් දරන අය පවා විශේෂයෙන්ම බෙදුම්වාදී යුද්ධයත් සමග කඳවුරු දෙකකට බෙදුණා. ඒ වගේම සමහර අවස්ථාවලදී නිෂ්ක්‍රීය තත්වයකට පත්වුණා. මොකද බෙදුම්වාදය සහ හා එයට අදාළ කරන යුද්ධය රටේ ප්‍රමුඛතම දේශපාලන කරුණ බවට පත්වී තිබුණ නිසා.

නමුත් ඒ අතර අනෙක් පැත්තට ගත්තොත් විශේෂයෙන්ම අපේ රටේ පාලක ධනපති කණ්ඩායම් දෙකේ ඉතාම දුර්දාන්ත අසාර්ථක පාලනය නිසා අපි දැකපු දේ තමයි විශේෂයෙන්ම 1980න් පස්සෙ ධනේශ්වර උගතුන් විශාල වශයෙන් දේශපාලනය පිළිකුල් කරන, දේශපාලනයෙන් ඈත්වුණු පිරිසක්

> "වර්තමාන ධනේශ්වර උගතුන්, වාමාංශික ප්‍රගතිශීලී බුද්ධිමතුන් ජ.වි.පෙ.ත් සමග මේ ක්‍රියාවලිය ආරම්භ කරන්නේ ජනවාරි 08 ජන අරමුණු මේ පාලක කණ්ඩායම තීරණාත්මකව පාවාදීමත් සමගයි. ඊට පෙර සිටම ජ.වි.පෙ. සමග සැලකිය යුතු වෘත්තික, බුද්ධිමතුන් ප්‍රමාණයක් සිටියත් මේක පැහැදිලි ගුණාත්මක වෙනසක් බවට පත්වෙනවා."

බවට පත්වුණා. ඒ වගේම වරින් වර මේ ධනේශවර උගතුන් අතර හිටපු යම් වාම ප්‍රගතිශීලී අදහස් දරන අයත් බොහෝ අවස්ථාවල එක් ධනපති කණ්ඩායමක් වෙනුවට තවත් ධනපති කණ්ඩායමක් පත්කරන්න දායකවෙලා පමණක් නොවෙයි ඒ සඳහා ජනතාව පෙළගස්වනවාටත් වඩා ඒ ආණ්ඩුවල තනතුරු වරප්‍රසාද ලබාගන්න, වැටුප් ලබා ගන්න, තනතුරු ලබාගන්න පිරිසක් බවට පත්වුණා. මෙන්න මේ තත්වය තමයි අපි 2010 වෙනකම්ම වගේ දැක්කෙ. සැලකිය යුතු උගතුන් ප්‍රමාණයක් රට හැර යාමත් තවත් ධනේශ්වර උගතුන් ප්‍රමාණයක් දේශපාලනය පිළිකුල් කර පැත්තකට වී සිටීමත් තවත් ධනේශ්වර උගතුන් පිරිසක් ආණ්ඩු හදන්න දායක වෙලා ඒවායේ තනතුරු ලබාගැනීමත් අපි දැක්කා.

2015 ජනාධිපතිවරණය අවස්ථාව වෙනකොට මේ තත්වය සැලකිය යුතු වෙනසකට පත්වුණා. රාජපක්ෂ රෙජීමය අති දැවැන්ත දේශපාලන බලයක් සහ දැවැන්ත රාජ්‍ය යාන්ත්‍රණයක් අත්පත් කර ගැනීමත් සමග එම පාලනය පෙරළා දැමීම සාම්ප්‍රදායික ධනපති පක්ෂය වූ එක්සත් ජාතික පක්ෂයට හෝ වමේ ව්‍යාපාරයට හැටියට ජනතා විමුක්ති පෙරමුණට තනිවම හෝ කර ගැනීමට නොහැකි තරම් බලවත් දේශපාලන බලවේගයක් බවට වැඩී තිබුණා. එම අවස්ථාවේදී විශේෂයෙන් රාජපක්ෂ පාලනයේ දුර්දාන්ත තත්වයට එරෙහිව ජ.වි.පෙ. විසින් ආරම්භ කරන ලද සහ වෙනත් අරගල තුළ මේ ධනේශ්වර උගතුන් අතර සිටින වාම ප්‍රගතිශීලී උගතුන් බුද්ධිමතුන් ප්‍රගතිශීලී කලා කණ්ඩායම් මේ රාජපක්ෂ ජාතිවාදී දූෂිත ඒකාධිපති පන්නයේ පාලනය පෙරළා දැමීම වෙනුවෙන් ඒකරාශි වීමක් අපි දැක්කා. ඔවුන් සමහර අය ජ.වි.පෙ. සමඟත් වැඩි පිරිසක් ජ.වි.පෙ.ට පිටිනුත් ක්‍රියාත්මක වෙන්න පටන් ගත්තා. ඒ අතර වෘත්තිකයන්, රාජ්‍ය නිලධාරීන්, විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් විශාල පිරිසක් වෙන වෙනමත් එකතුවෙලාත් යම් යම් කටයුතු කළා. ජනවාරි 08දා රාජපක්ෂ පාලනය බිඳවැටුණේ පැහැදිලිවම මෙම ධනේශ්වර බුද්ධිමතුන්ගෙන්, උගතුන්ගෙන් සහ ජ.වි.පෙ. ප්‍රමුඛ සහ අනෙකුත් දේශපාලන කණ්ඩායම්වල මැදිහත්වීම මතයි.

කොහොම වුණත් අපි දැක්ක දේ තමා ඒ කණ්ඩායම් විශේෂයෙන්ම උගතුන් කණ්ඩායම්, වෘත්තිකයින් කණ්ඩායම් ඒ ආණ්ඩු පෙරළිය තුළ සුවිශාල භූමිකාවක් ඉටුකළාට ඔවුන්ගෙන් අති බහුතරයක් මෛත්‍රී - රනිල් පාලනයේ තනතුරු තාන්න-මාන්න අරගන්න ගියේ නැහැ. ඔවුන් ඒ රෙජීමය තුළ දිය වුණේ නැහැ. ඔවුන් මේ දුර්දාන්ත පාලනයට හවුල් වුණේ නැහැ. ඔවුන්ගෙන් සැලකිය යුතු කොටසක් නිරීක්ෂකයන් ලෙස සිටිමින් මෛත්‍රී-රනිල් පාලනය අඩුම ගානෙ ජනවාරි 08 දුන්නු පොරොන්දු ඉටුකරන පැත්තට තල්ලු කිරීමේ වුවමනාවක සිටියා.

නමුත් පසුගිය 15 වැනි පිටුවට



YES WE CAN

# සාහිත්‍යය: සැප්තැම්බර් මාසයෙන් ඔබ්බට

සැප්තැම්බර් මාසය යනු සාහිත්‍ය මාසයයි. මෙම මාසයේ උදාවත් සමගම කාගෙත් අවධානය සාහිත්‍යය කෙරෙහි යොමු වන්නේ නිතැතිනි. සාහිත්‍යය උත්සව, පොත් ප්‍රදර්ශන, සාහිත්‍යය කෘති ඇගයීම් පැවැත්වෙන්නේ රටෙහි කොයි කාගෙත් අවධානය ඒ කෙරෙහි යොමුවන පරිද්දෙනි. සාහිත්‍යය වෙනුවෙන් මාසයක් වෙන්කර තිබීම තුළින්ම සාහිත්‍යය යන්න සමාජය තුළ කොතරම් වැදගත්කමක් උසුලන්නේද යන්න මනාව පෙන්නුම් කරන අතර සමාජය වඩාත් යහපත් සුන්දර තැනක් කිරීමට සාහිත්‍යයට ඇත්තේ අපූරු හැකියාවකි.

කවිය, කෙටිකතාව, නවකතාව, නාට්‍ය සාහිත්‍යාංගයන් පොදුවේ ගත් කල කලා කෘති වන අතර කලාව හා සාහිත්‍යය අතර නොබිඳෙන සම්බන්ධතාවක් පවතී. කලාව විසින් සොබාදහම සෞන්දර්යාත්මකව මිනිස් මනසේ ප්‍රතිනිර්මාණය පිළිබිඹු කරන්නාක් මෙන් සාහිත්‍යය තුළින් එය අක්ෂර මගින් සිදුවේ. සාහිත්‍යය ඇසුරු කරන්නා වඩාත් පරිපූර්ණ අයෙකු බවට පත්වන්නේ සාහිත්‍යය යනු සමාජ පිළිබිඹුවක් නිසාය.

සාහිත්‍යය කෘතියක් ගොඩ නැගෙන්නේ රටක සංස්කෘතික, ඓතිහාසික, ආර්ථික විවිධ බලවේගයන් පසුබිම් කරගෙනය. කවිය, කෙටිකතාව, නවකතාව යන කවර සාහිත්‍යය කෘතියකින් වුවද මිනිසා හා සොබාදහම අතරත්, මිනිසා හා මිනිසා අතරත් සමාජ ප්‍රතිවිරෝධතා අධ්‍යනය කරයි.

අත්දැකීම් පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය කිරීමට ඇති හැකියාවද සාහිත්‍යයේ විශේෂ ගුණයකි. සාහිත්‍යාංගයන්ට වෙනත් කවර හෝ මාධ්‍යයකටත් වඩා මිනිසාත් සමාජයත් සංවේදී කිරීමටත් කම්පනයට කිරීමට හැකියාව පවතී. එසේ වන්නේ, සෑම මනුෂ්‍යයෙක්ම තම මවගේ තුරුලේ මවගේ නැලවිලි ගීයට නැලවී එයට සංවේදී වන පුද්ගලයින් නිසාවෙනි.

සෑම මිනිසෙකුම පාහේ කවර හෝ සාහිත්‍යය කෘතියකට කැමැත්ත පළ කරන්නේ නිතැතිනි. එබැවින් සමාජය වෙත පණිවිඩයක් ගෙන යාමේදී සන්නිවේදන කාර්යයේදී මිනිසාට සමීප වීමට එයට ඇත්තේ විශේෂිත වූ හැකියාවකි. මිනිසා හා මිනිසා අතරත් මිනිසා හා සොබාදහම අතර ප්‍රතිවිරෝධයන් සහ දුක, සැප, ආදරය, තනිකම, ගැටලු, අසාධාරණය, පීඩනය, අසමානතාවය ආදියද සාහිත්‍යය කෘතිවලින් ගෙනහැර පායි. මේ හේතුව නිසාම රටෙහි හා ලෝකයේ පවතින ප්‍රශ්න ගැටලු අර්බුදයන් සමාජය වෙත ගෙන ඒමටත් ඒ මගින් ජනතාව ඥානනය කිරීමටත් සාහිත්‍යයට හැකියාව පවති. වර්තමාන සාහිත්‍යය මගින් මෙම කාර්යය ඉටුවුණත් වර්තමානයේ සාහිත්‍යයේ කාර්යය වනුයේ ඉන් නොනැවතී ඒ පිළිබඳ අවබෝධය වඩා පුළුල් කර සමාජය අවදියෙන් තැබීමත් සමාජය ඉදිරියට ගෙනයාමත්ය. එයට සාහිත්‍යය සතුව පුළුල් වගකීමක් ඇතුවා සේම එය ඉටු කිරීමද සාහිත්‍යය සතු කාර්යභාරයක් වන්නේය.

නමුත් අද දවස වන විට පරිභෝජනවාදී සමාජය තුළ සාහිත්‍යය එක රාමුවක කොටු වී ඉටු කරමින් තිබෙන නිර්මාණයන් මගින් සිදුවන්නේ හරසුන්, බොළඳ සම්බන්ධතාත් සිහින ලෝකවල අතරමන් වූවන් මෙන්ම කුහකත්වය, ඊර්ෂ්‍යාව, වෛරය, ක්‍රෝධයෙන් පිරි මිනිසුන් මෙන්ම අපේක්ෂාභංගත්වයට පත් වූවන් සියලු අසාධාරණකම් ඉවසමින් ජීවත්වන්නන් ගොඩ නැගීමයි. වත්මන් ධනපති සමාජය සාහිත්‍යය එතැනට පත්කොට ඇත. මේ පිළිබඳ ලියෝ තෝල්ස්තෝයි පවසා ඇත්තේ "මාතෘත්වය අපේක්ෂා කරන රූ සපුවෙන් අනූන කාන්තාවක් ඇගේ ශරීරය ලෝකාස්වාද රතිය අපේක්ෂා කරනවුන්ට විකුණයි. අපේ පන්තියේ ලෙසය.

සමාජ ප්‍රගමනය වෙනුවෙන් තම සාහිත්‍ය භාවිත ෘකළ සාහිත්‍යධරයින් අපට හමුවේ. මධ්‍යකාලීන යුගගේ ඉතාලියේ සිටි දාන්තේ කවියා එවැන්නෙකි. ඔහු යුග දෙකක් යා කළ සාහිත්‍යධරයෙක් ලෙස වැඩවසම් සමාජයේ අවසානයත් ධනවාදී සමාජයේ ආරම්භයත් සනිටුහන් කළේය.

රුසියාවේ සිටි මැක්සිම් ගෝර්කි සාහිත්‍යධරයාද එවැන්නෙකි. ඔහු වැඩවසම් හා ධනවාදී සමාජයත් සමාජවාදී සමාජයත් යා කළ සාහිත්‍යධරයෙකි. ඔවුන් ඔවුන්ගේ නිර්මාණ මගින් සමාජය ඥානනය කිරීම සිදු කළ අතර සමාජ සංවර්ධනය උදෙසාද තම නිර්මාණ ගොඩනඟන ලදී.

සමාජ අසාධාරණය, පීඩනය, දරිද්‍රතාවය, අසමානතාවය, කුසගින්න, යුද්ධ ආදී විවිධ සමාජ ගැටලුවලින් ඔඩුදුවා ඇති සමාජයක් අප ඉදිරිපිට ගොඩනැගී තිබේ. මේ පිළිබඳව වඩවඩාත් ගැඹුරු අවබෝධයක් සමාජයට ලබාදීමට සාහිත්‍ය කෘති යොදාගත යුතු සේම ඉන් නොනැවතී ඊට විසඳුම් ලැබෙන නව සමාජයක් ගොඩනැගීම උදෙසාද සාහිත්‍ය යොදාගත යුතුය. අද දවසේ කාර්යයභාරයය වන්නේ එයයි. යුග දෙකක් යා කළ දාන්තේලා, ගෝර්කිලා දස දහසින් අවැසි යුගයකය ඔබ අප ජීවත් වන්නේ. එම යුග වගකීම ඉටුකිරීම අප හමුවේ ඇති ප්‍රමුඛතම වගකීම වන්නේය.




# විශ්මි - සරෝජා රෙහාන් - ෆාතිමා



සමාජවාදී තරුණ සංගමය සහෝදරත්වය වෙනුවෙන් රට තුළ ජාතිවාදී සිදුවීම්වලදී ජාතික සමගිය උදෙසා වැඩකළ සජීවී මිනිසුන්ගේ අත්දැකීම් එකතු කරමින් එළිදැක්වූ 'අළු දූලි මතින් මිනිස්කම සොයා ගියෙමු' පොත 2018 ජූලි මස 23වැනි දින නුගේගොඩ දී "එක රටක් - මනු පවුරක්" තේමාවෙන් පැවති සහෝදරත්වයේ රැලියේදී දී එළිදැක්වුණි.

උතුර, දකුණ, නැගෙනහිර, බටහිර සිව්කොණ ජීවත්වන්නේ මිනිසුන්ය. ජාතිවාදී සිදුවීම්වලදී පීඩාවට පත්වන්නේද සිංහල, දෙමළ, මුස්ලිම් මිනිසුන්ය. එවැනි අවස්ථාවල තම දිවි පරදුවට තබා රැකවරණය ලබා දෙන්නේද මිනිසුන්ය. එහෙත් එවැනි මිනිසුන් විරලය. එවැනි දුලබ මිනිසුන්ගේ ආදර්ශයන් වර්තමාන සමාජයට වැදගත්ය. එම අරමුණ වෙනුවෙන් එවැනි මිනිසුන් සොයා අපි රටේ සිව්කොණ යෑමට ගමන් ඇරඹුවෙමු.

එහිදී පාලකයින්ගේ වුවමනාවට ඇතිකළ ජාතිවාදී ගිනිදැල්ගේ බිහිසුණු මතකයන්ද, එහිදී තම ජීවිතය බේරාගත් අනිකා පිළිබඳවත් ඔවුහු අපට මතකය ආවර්ජණය කළහ. තම රැකියාව වෙනුවෙන් දුෂ්කර පළාතකට ගොස් රැකියාව කරන සමයේ තමන් සමග රැකියාව කළ අනිකා වෙනුවෙන් ජාතිවාදයට එරෙහිව වැඩකළ, ඒ ඇති වූ ගින්න නිවා දැමීමට වෙර දැරූ අග්‍රගණයේ රාජ්‍ය සේවකයෝද වූහ. මෑත කාලයේ දර්ගා සහ මහනුවර නගරවල ඇතිවූ සිදුවීම්වලදී ජීවිතය රැකවරණය වෙනුවෙන් තමන් ළඟට පැමිණි මිනිසුන්ට ආරක්ෂාව ලබා දුන් බුද්ධ පුත්‍රයන් හා මිනිසුන් අපට මුණ ගැසුණි. මහා ම්ලේච්ඡත්වය මැද, මතුවූ සැබෑ මනුෂ්‍යත්වයේ හස්තයන් ඔවුන් වෙත දිගුවී තිබිණි. ඒ නිසාම ඉතිරි විය යුතු වෛරය වෙනුවට සදාකාලික ලෙස ඔවුන් වැළඳගෙන තිබුණේ, සැබෑ මානවීය හැඟීම්ය. සැබෑ මිනිස්කම පිළිබඳ ජීවමාන අත්දැකීම් අපේ සිත්වලට නැවුම් බලාපොරොත්තු එක්කරවීය.

හෙට දවසේ අපේ රටේ ජාතික සමගිය හා සහෝදරත්වය ගොඩනැගීම වෙනුවෙන් ඒ අත්දැකීම් අකුරු බවට පෙරළී 'අළු දූලි මතින් මිනිසත්කම සොයා ගියෙමු' කෘතිය නිර්මාණය විය. ජාතික සමගිය අපේක්ෂා කරන, මනුෂ්‍යත්වය අපේක්ෂා කරන සැබෑ මිනිසුන්ගේ කටයුතුවලට මෙම ප්‍රයත්නය පිටුබලයක් වනු ඇති බව අපේ විශ්වාසයයි.

එන්න පිපෙන්න  
අපි එකම පොකුරක!

## පණ යන්න ළඟයි...

නුඹ අපිට 'සුපිරි' යැයි දුන්  
හැමදේම..  
'අබිං' යැයි පැවසූ හැමදේම...  
මුසාවකැයි  
අද දැනෙන අපූරුව..  
හිසට වහලක්  
ගතට සුවයක්  
දෙන බවට  
පොළෝ මත දිවුරා  
සියවසක් කියුවද  
නොලැබුණු  
එකම දෙය  
සැනසීම...  
නිරුවත් නුඹ  
අපට අන්දවන සළු  
සුපිරි යැයි පවසන  
'ධනවාදය' නුඹ  
පණ යන්න ළඟයි දැන්  
අභිෂේක ගන්වමු  
වළ කපා වලළා...  
මියෙන තුරුම...






"මට දැනෙන්නේ ජැමෙයිකාව හොඳ තැනක් වගේම නරක තැනක්. ඇයි එහෙම කියන්නෙ කියලා දන්නවද? ඔබට එහිදී දේශපාලන ප්‍රචණ්ඩත්වය විඳින්න වෙනවා. නැගිටලා බැලුවහම ඔබට දැකගන්න හැකිවේවි දේශපාලනඥයින් උදෙසා තරුණයින් තරුණයින්ට විරුද්ධව සටන් කරනවා. මේක හරිම අවාසනාවන්ත තත්වයක්. නමුත් මේ හැම දෙයක්ම ඔය ඔළුගෙඩිවලට තේරෙනවා. ඒත් ඔවුන්ට බඩගින්න තියෙනවා. රැකියා නොමැතිකම තියෙනවා. ජනතාවගේ රැකියා අවස්ථා දේශපාලනඥයෝ පාලනය කරන තුරාවටම තරුණයින් තරුණයින්ටම විරුද්ධව සටන් කරනවා දැකගන්න ලැබේවි."

*බොබ් මාලේ (රෙගේ රජු)*



# හුස්ම ගත්තු වසර 3ක්?

රනිල් වික්‍රමසිංහ - මෛත්‍රීපාල හවුල් ආණ්ඩුව හෙවත් එ.ජා.ප. - ශ්‍රී.ලං.නි.ප. හවුල් ආණ්ඩුවට පසුගිය අගෝස්තු 17ට නිල වශයෙන් වසර 03ක් සම්පූර්ණ විය. හවුල් ආණ්ඩුවේ වසර 03 සැමරීම සඳහා ආණ්ඩුව ජනමාධ්‍ය ඔස්සේ ප්‍රචාරක දැන්වීම් මාලාවක් පළ කළ අතර ඉන් එකක තේමාව වූයේ "හුස්ම ගත්තු වසර 3ක්" යන්නය. මේ මගින් ආණ්ඩුව කීමට උත්සාහ කළේ, පසුගිය වසර තුන තුළ ජනතාව බියෙන් සැකෙන් තොරව ජීවත්වූ බවය. එය ඇත්තක් නම්, එය ඇත්ත වන්නේ පොදු ජනතාව සම්බන්ධයෙන් නම් නොවේ. මන්ද පොදු ජනතාව පීඩාවන් රැසකට මුහුණදී සිටි නිසාය. ගෙවුණු වසර තුන තුළ පොදු ජනතාව මත බදුබර පැටවුණේත් තෙල් මිල ඇතුළු බඩු මිල වැඩිවූයේත් හුස්ම ගැනීමටත් ඉඩක් නොතබාය.

එහෙත් ගෙවුණු වසර 3 තුළ නිදහසේ හුස්ම ගත් පිරිසක්ද සිටී. ඒ අන් කවරෙක්වත් නොව, වත්මන් ආණ්ඩුවේත් පසුගිය රාජපක්ෂ පාලනයේත් මහාපරිමාණ හොරකම් හා දූෂණවලට සම්බන්ධවූ පුද්ගලයන්ය. එනම් අපරාධකරුවන් හා දූෂිතයන්ය. ඔවුන් සම්බන්ධයෙන් නම්, ආණ්ඩුවේ තේමාව නිවැරදිය. එය හරියටම කියන්නේ නම්, ගෙවුණු වසර තුන දූෂිතයන් හා අපරාධකරුවන් නිදහසේ හුස්ම ගත් වසර 3කි. ජනතාවගේ පැත්තෙන් යන්තම් හුස්ම පමණක් ගත් වසර 3කි. සත්‍යය එයයි.

යහපාලනය නැමති පිරුවටය සහිතව බලයට පැමිණි වත්මන් හවුල් ආණ්ඩුවේ ප්‍රධාන පොරොන්දුවක් වූයේ රට තුළ රජ කළ වංචා - දූෂණ නවතා හොරුන්ට දූෂිතයන්ට දඬුවම් දීමය. ජනතාවගේ ප්‍රධාන අපේක්ෂාවක් වූයේද එයමය. එහෙත් ගෙවුණු වසර තුන තුළ සිදුවූයේ කුමක්ද? වර්තමාන ආණ්ඩුව මහාබැංකු බැඳුම්කර වංචාව සැලසුම් සහගතව සිදුකිරීමය. ඊට අගමැතිවරයා ප්‍රමුඛ ඇමති මණ්ඩලයේ සැහෙන පිරිසක් සම්බන්ධ විය. මේ පිළිබඳ ජ.වි.පෙ.න් කළ හෙළිදරව්වත්, පාර්ලිමේන්තු කෝප් කමිටුවේදී එහි සභාපති හඳුන්නෙත්ති සහෝදරයා එ.ජා.ප.යේ බාධක මැද කළ පරීක්ෂණයත්, ඒ නිසාම ජනාධිපති කොමිසමක් පත්කොට සිදු කළ පරීක්ෂණයත් නිසාත් ප්‍රශ්නය සැඟවීමට නොහැකි වුවත් එම හොරකමට සම්බන්ධ කිසිවෙකුට දඬුවම් කළේ නැත.

මෙම වංචාවේ 'මහමොළකරු' හිටපු මහබැංකු අධිපති අර්ජුන මහේන්ද්‍රන් තවමත් නිදැල්ලේය. ඔහු රටේත් නැත. ඔහුට සහාය දුන් ඔහු ආරක්ෂා කළ රනිල් වික්‍රමසිංහ මහතා තවමත් රටේ අගමැතිය(!). මෙම හොරකමට උදව්කොට ඇලෝසියස්ගෙන් අල්ලස් ලෙස නිවසක් ලබාගත් හිටපු මුදල් ඇමති රවි කරුණානායක තවම නිදහසේ හුස්ම ගනිමින්ය.



"රාජ්‍ය පරිපාලනයේ මුළු යන්ත්‍රයම නිලධාරි පැලැන්තිය (නිලධාරීන්) සහ ධනපති පංතිය අත පැවති අතර, සමාජවාදයේ පිල හැර ගිය ඇමතිවරු පීඩිත පංතිවල අවධානය අන් අතකට යොමු කිරීම සඳහා ක්‍රියාත්මක වූ කථා යන්ත්‍ර බවට පත්වූහ. කර්මාන්ත පිළිබඳ නියෝජ්‍ය ඇමති වූ ඒ අපකීර්තිමත් පල්චින්ස්කි ධනපතියන්ට විරුද්ධ සෑම පියවරක්ම අවහිර කළ එම යන්ත්‍රයේ නියම නියෝජිතයෙක් විය. ඇමතිවරු නන්දෙඩවූ අතර, සියල්ලක්ම පෙර සේම පැවැත්තේය."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**05වැනි වෙළුම,**
**198 පිටුව**




ඇලෝසියස්ගෙන් මුදල් ගත් මැති ඇමතිවරුද සුපුරුදු ලෙස නිදහසේය. නඩුවක්වත් නැත. ඇලෝසියස් හා පලිහේන පමණක් ඇතුළේය. අගමැති ප්‍රමුඛ ඇමැතිවරු එළියේය. මෙම වසර තුන දූෂිතයන් නිදහසේ හුස්මගත් වසර තුනක් වන්නේ එසේය.

එය පමණක් නොවේ. පසුගිය රාජපක්ෂ පාලන සමය තුළ මෙරට සිදුවූ අපරාධ, වංචා හා දූෂණ රැසකි. ඉන් කීපයකට සම්බන්ධ හමුදාවේ, පොලිසියේ නිලධාරීන් කීපදෙනෙක් ද, රාජ්‍ය සේවයේ කීපදෙනෙක් ද රක්ෂිත බන්ධනාගාර ගතකොට ඉන් කීපදෙනෙකුට ඇපද ලබාදී ඇති අතර එකී අපරාධවලට සම්බන්ධ දේශපාලන නායකයන් තවම නිදහසේය.

තාජුඩීන් ඝාතනයේ සියලු තොරතුරු සොයාගෙන ඇතත් එහි ඝාතකයෝ තවම නිදැල්ලේ සිටිති. ලසන්ත වික්‍රමතුංග ඝාතනයේ ගෝඨ්ඨාදර්ලාද තවම නිදැල්ලේය. රතුපස්වල ඝාතන, එක්නැලිගොඩ අතුරුදහන් කිරීම වැනි අපරාධවල මහමොළකරුවෝද තවම නිදැල්ලේය. එසේම ජ.වි.පෙ. ක්‍රියාකාරීන් වූ නයිදුවාවඩු, බාලගේ යන සහෝදරවරු මරා දැමූ හා උතුරේදී ලලිත් හා කුගන් අතුරුදහන් කළ අපරාධකරුවෝද තවම නිදැල්ලේය. එසේම රාජපක්ෂ පාලන කාලය තුළ මහාපරිමාණ වංචා - දූෂණ රැසකට සම්බන්ධ වූවන්ද අත්අඩංගුවට ගෙන 'වීරයින්' කළා මිස දඬුවම් කළේ නැත; දඬුවම් කරන පාටක්ද නැත. සිදුවීම් සිදුවන්නේ, 'පහත් තැනින් යයි ගලා ජලේ' යන කියමනට අනුවය. ඒ අනුව හවුල් ආණ්ඩුවේ ගෙවුණු වසර තුළ අපරාධකරුවන් නිදහසේ හුස්ම ගත් වසර තුනක් බව ඉතා පැහැදිලිය.

තත්වය එසේ තිබියදී පොදු ජනතාවගේ පැත්තෙන් බලන විට ගෙවුණු වසර තුන පොදු ජනතාවට හුස්ම ගැනීමටවත් ඉඩක් නොලැබුණු, ඔවුන් මත පීඩනය හා බර පැටවුණු වසර තුනක් විය. ආණ්ඩුවේ වැරදි ආර්ථික ප්‍රතිපත්ති නිසා රුපියල කඩා වැටීමත්, (මේ වන විට වාර්තාගත කඩාවැටීමකට ලක්ව රුපියල ඩොලරයට සාපේක්ෂව රු:162/-ට වැටී තිබේ) ආණ්ඩුවේ බදු බරත් මාර්ග නීතිවලට අදාළ දඩ මුදල් දෙගුණ තෙගුණ කිරීමත් සිදුවූයේ ජනතාවට හුස්ම ගැනීමටවත් ඉඩක් නොතබාය. ජීවන බර දරාගැනීමට නොහැකි ජනතාව, බොන වතුර ටික පවා මුදලට ගැනීමට සිදුවූ ජනතාව මේ වසර තුන තුළ ජීවත්වූයේ යන්තමින් හුස්ම පමණක් ගනිමිනි.

අනෙක් අතට ආණ්ඩුව ආර්ථිකයේ බර ජනතාව මත පටවමින් මහජන සේවාවන් කප්පාදු කිරීමට දිගින් දිගටම ගන්නා උත්සාහය නිසා ජනතාව මහත් පීඩාවට පත්විය. අධ්‍යාපනය පෞද්ගලීකරණය කිරීමේ ආණ්ඩුවේ උත්සාහය නිසාත් කලින් ආණ්ඩුවල පෞද්ගලීකරණ ප්‍රතිපත්තියම මෙම ආණ්ඩුවත් පවත්වාගෙන ආ නිසාත්, අධ්‍යාපනයේ අයිතිය රැකගැනීම වෙනුවෙන්, විශේෂයෙන් 'සයිටම්' පැරදවීම වෙනුවෙන් විශ්වවිද්‍යාල සිසුන්ටත් දෙමාපියන්ටත් දිගුකලක් සටන් කරන්නට සිදුවිය. සයිටම් විරෝධී උද්ඝෝෂණවලට ආණ්ඩුව බැටන් ප්‍රහාර හා කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කරනු ලැබුවේ හුස්ම ගැනීමට ඇති අයිතියද අභියෝගයට ලක්කරමිනි.

ධීවර කර්මාන්තයේ ගැටලු විසඳා ගැනීම සඳහා තම අයිතීන් වෙනුවෙන් ධීවරයාටද, වතු කම්කරු වැටුප සොච්චමකින් ඉහළ දමා ගැනීම වෙනුවෙන් වතු කම්කරුවාටද, ජීවන වියදමට සරිලන වැටුපක් වෙනුවෙන් රජයේ සේවකයාටද, සාහිත්‍ය කලා ක්ෂේත්‍රයේ ගැටලු හා නිර්මාණකරණයේ නිදහස් අයිතිය වෙනුවෙන් කලාකරුවාටද, ආණ්ඩුව සමග දිගින් දිගටම අරගල කිරීමට සිදුවූයේ හුස්ම ගැනීමටවත් ඉඩක් නැතිවය.

එසේම වත්මන් ආණ්ඩුව ගෙවුණු වසර තුන පුරාම රටේ දේපළ විදේශිකයන්ට හා සමාගම්වලට බදුදීම හෝ විකිණීමද සිදු කළේ හුස්මවත් ගැනීමට ඉඩ නොදීය. හම්බන්තොට වරාය වසර 99කට චීන සමාගමකට බදු දුන් ආණ්ඩුව දැන් මත්තල ගුවන් තොටුපළ ඉන්දියාවට ලබාදීමටත්, ත්‍රිකුණාමලේ තෙල් ටැංකි ඉන්දියාවට ලබාදීමටත් උත්සාහ කරමින් සිටී. ඊට අමතරව ඌව වෙල්ලස්ස ඉඩම් අක්කර 60,000කට වැඩි ප්‍රමාණයක් බහුජාතික සමාගමකට පැවරීමට ද උත්සාහ කරමින් සිටින්නේ ප්‍රදේශයේ ජනතාවගේ විරෝධයද නොසලකාය. හම්බන්තොට හා මොනරාගල අක්කර 15,000ක පමණ ඉඩම් විදේශ සමාගම්වලට දීම වැළකුයේ දකුණේ ජනතාවගේ උද්ඝෝෂණ හා විරෝධය නිසාය. එය සිදුවූයේ නම් මිනිසුන්ගේ හුස්ම ගැනීමේ අයිතිය පමණක් නොව, වන අලින්ගේ හුස්ම ගැනීමේ අයිතියද ඉතිරි වන්නේ නැත.

වසර 70ක ධනවාදී පාලනය තුළ ජීවිතයේ බොහෝ දේ අහිමිව සිටින ජනතාව, යාන්තමින් හුස්ම පමණක් ගනිමින් සිටී. කලක් සොබා දහමින් නොමිලේ ලබාගත් පානීය ජලයටද දැන් විශාල මිලක් ගෙවීමට ජනතාවට සිදුව තිබේ. වසර 70ක ධනවාදය තුළ සියල්ල මුදලට යටකර තිබේ. රට දැවැන්ත ණය කන්දරාවකට යටකොට පරම්පරා ගණනාවක 'නිදහස' අහිමිකොට ණයකරුවන් කර තිබේ. ගෙවුණු වසර තුනද විශේෂයකින් තොරව ගෙවුණු වසර 70ටම අයත් වසර තුනකි. එහි අලුතින් සිදුවූ ප්‍රාතිහාර්යයක් නැත. පුදුම දේ තිබුණා නම් තිබුණේ මැති ඇමතිවරුන්ගේ වියදම් පිළිබඳවය. එකක් රු: 640,000 ගණනේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට බෙල්ජියමෙන් පුටු ගෙන්වීමට තීරණය කළේ බස්නාහිර පළාතේ මහඇමතිය. ඒ මේ ගෙවුණු වසර තුන ගෙවෙද්දීමය. ජනතා විමුක්ති පෙරමුණ හෙළිදරව් කිරීම නොකරන්නට එම පුටු ලංකාවට ගෙන්වීම අත්හිට වෙන්නේ නැත. කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා කුලියට ගත් ගොඩනැගිල්ලකට කෝටි ගණන් මුදල් ගෙවමින් මහජන මුදල් නාස්ති කරන්නේ මේ පාලනය තුළය. ඒවා අසනවිට 'හුස්ම නතර වන' තරමේ නාස්තිකාර වියදම්ය.

හවුල් ආණ්ඩුවේ වසර තුනක පම්පෝරිය සැබවින්ම ව්‍යාජ එකකි. හවුල් ආණ්ඩුවේ වසර තුනද ඇතුළු ධනවාදී පාලනයේ වසර 70ක ප්‍රතිඵලය ඉතා බිහිසුණුය. සියල්ල අහිමි කළ ජනතාවෝ සුසුම්ලමින් සිටිති. දැන් නිදහසේ හා නොමිලේ ඉතිරිව තිබෙන්නේ 'හුස්ම ගැනීම' පමණි. එහෙත් වැඩිවන ජීවනබර, ණය බර හා සහන කප්පාදුව විසිනුත්, පරිසරයට කරනු ලබන මහා විනාශය මිනිසුන් 'හුස්ම ගැනීමේ ' අයිතියද ධනවාදය තුළ වැඩිකල් පවතින්නේ නැත. හුස්ම ගැනීමටද මිලක් නියම වන දවස වැඩි ඈතක නොවනු ඇත. එබැවින් ආණ්ඩුවේ බොරු පුරාජේරුවලට නොරැවටී ගෙවුණු වසර තුනක හවුල් පාලනය පමණක් නොව ගෙවුණු වසර 70ක ධනපති පාලනයට අවසන් කොට සැබෑ ලෙසම නිදහසේ හුස්ම ගත හැකි සමාජයක් නිර්මාණය කර ගැනීම සඳහා දැන්වත් ජනතාව පෙළ ගැසිය යුතුය.

දැන් ලංකාවේ ධනවාදී ක්‍රමය මරණාසන්නව ඇත. එහි හුස්ම ගැනීමද නැවතී තිබේ. ධනවාදී පක්ෂ අර්බුදයකය. ඒවා යාන්තමින් හුස්ම ගන්නේ ජනතාවගේ හුස්ම හිරකරමිනි. එබැවින් ජරපත් ධනවාදයත් ධනපති පක්ෂත් විසින් අවසාන වශයෙන් ජනතාවගේ හුස්ම හිරකර දැමීමට පෙර ජනතාව 70 වසරක මේ නරුම පාලනයට නැවතීමේ තිත තැබිය යුතුය. ඒ අනාගත පරපුරට සැබෑ ලෙසම නිදහසේ හුස්ම ගත හැකි රටක් හා සමාජයක් වෙනුවෙනි.

> "ආණ්ඩුවේ බොරු පුරාජේරුවලට නොරැවටී ගෙවුණු වසර තුනක හවුල් පාලනය පමණක් නොව ගෙවුණු වසර 70ක ධනපති පාලනයට අවසන් කොට සැබෑ ලෙසම නිදහසේ හුස්ම ගත හැකි සමාජයක් නිර්මාණය කර ගැනීම සඳහා දැන්වත් ජනතාව පෙළ ගැසිය යුතුය."

# පරාධීනත්වයට එරෙහි ආදර්ශය




ලාංකේය භික්ෂුව යනු ආගමික කාර්යභාරය පමණක් නොව සමාජමය කාර්ය භාරයක්ද ස්වේච්ඡාවෙන් පවරා ගත් පිරිසකි. පෘතුගීසි, ලන්දේසි මෙන්ම ඉංග්‍රීසි ආක්‍රමණිකයන්ට එරෙහිව විශාල කාර්ය භාරයක් ඉටු කළ ආගමික නායකයින් පිරිසක් බව ඉතිහාසයේ සඳහන් වේ.

මතවාදීව මෙන්ම සන්නද්ධවත් ආක්‍රමණිකයන්ට එරෙහිව කටයුතු කිරීමට ලංකේය භික්ෂුව පසුබට නොවූ අතර වර්ෂ 1848 ඉංග්‍රීසීන්ට එරෙහිව මාතලේදී දියත් කළ කැරැල්ල මෙහෙයවූ සුවිශේෂී චරිතයක් ලෙස කුඩාපොළ ශ්‍රී රාහුල හිමියන්ගේ භූමිකාව සමාජ ගත වන්නේත් මෙවන් වටපිටාවක් තුළය. මේ කැරැල්ලේ මූලිකයෙකු වීම හේතුවෙන් ඉංග්‍රීසීන් විසින් 1848 අගෝස්තු 26 වන දින බෝගම්බර පිටියේදී කුඩාපොළ හිමියන් ප්‍රසිද්ධියේ වෙඩි තබා ඝාතනය කරන ලදී. කැරලිකරුවන් ගණනාවකගේ ඝාතනයන් සමග අධිරාජ්‍යවාදීන්ට එරෙහි සන්නද්ධ සටන් අහෝසි වී ගිය නමුදු මතවාදී තලයේ අධිරාජ්‍ය විරෝධී භූමිකාව ඉදිරියට යාම සිදුවිය. මෙහි ගුණාත්මක අවස්ථාවක් වූයේ පානදුරාවාදයයි. 1873 අගෝස්තු 26 - 28 යන දිනයන් පානදුරාවාදයේ ආරම්භක දින ලෙස දැක්විය හැක. මෙම සිදුවීම් ද්විත්වය පාදක කර ගනිමින් අගොස්තු 26 ජාතික භික්ෂු දිනය ලෙස හඳුන්වනු ලබයි.

එදා එනම් 1848 නිම කළ නොහැකි වූ සටන ජයග්‍රහණය තෙක් ඉදිරියට ගෙනයාමට උර දී සිටින ජාතික භික්ෂු පෙරමුණ පසුගිය අගෝස්තු 28 වෙනිදා කොළඹ තුම්මුල්ල ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේදී "පරාධීනත්වට එරෙහිව දේශයට මඟ කියන කුඩාපොළ හිමි ආදර්ශය" යන තේමාව යටතේ සමරු සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

මෙහි අරාධිත දේශන ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය අතුලසිරි සමරකෝන් මහතා විසින් පවත්වන ලදී. මහාචාර්ය අත්තංග නයේ රථනපාල නාහිමි ඇතුළුව දිවයිනේ විවිධ ප්‍රදේශවලින් භික්ෂූන් වහන්සේ විශාල පිරිසක් මෙම අවස්ථාව සඳහා වැඩම කර සිටියහ.

# වැටුප් අරගලයට පණ පොවමින්

වෘත්තීය අරගල, වැටුප් සටන් ආදිය රට විනාශයට ඇද දමන කඩාකප්පල්කාරී ක්‍රියා ලෙස සමාජ ගත කරවමින් වෘත්තීය අරගලයන්ගේ නියුතු වූවන්ට එරෙහිව ජනතාව පෙළගැස්සවීමට වත්මන් ආණ්ඩුව කටයුතු කරමින් සිටී. එයට නොදෙවෙනි ලෙස විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය විසින්ද සටන් ක්‍රියාමාර්ග අවඥාවට ලක්කිරීමට කටයුතු කරනු ලබයි. එම ක්‍රියාවල ප්‍රතිඵලයක් ලෙස දුම්රිය සේවකයන් වර්ජනය කළ විට සෞඛ්‍ය, විදුලි, ගුරු, වරාය, ඛනිජ තෙල් ආදී ක්ෂේත්‍රවල රැකියා කරනවුන් එයට එරෙහිව පෙළ ගැසේ. සෞඛ්‍ය සේවකයන් වර්ජනය කළ විට අනෙක් කේෂත්‍රවල සේවකයෝ එයට එරෙහිව අදහස් දක්වති. මේ සියල්ලට වගකිව යුතු දේශපාලන අධිකාරිය ඔවුනොවුන්ට බෝලය පාස් කර ගැනීමට ඉඩදී පසෙකට වී සිටී.

වෘත්තීය අරගල සම්බන්ධයෙන් මෙවන් පසුබිමක් පවතින තත්වයක් තුළ ජ.වි.පෙ.ට අනුබද්ධ ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය වැඩි වන ජීවන වියදමට සරිලන පරිදි රු. 5649.60ක වැටුප් වැඩි කිරීමක් ලබා ගැනීම, අහිමි කළ රාජ්‍ය සේවක විශ්‍රාම වැටුප යළි ලබා ගැනීම, EPF -ETF කප්පාදුව නතර කරවා ගැනීම, රාජ්‍ය දේපළ විකිණීම වළක්වා ගැනීම යන ඉල්ලීම් මුල් කර ගනිමින් දිවයිනේ බොහෝ දිස්ත්‍රික් මෙන්ම වැඩබිම් ආවරණය වනසේ උද්ඝෝෂණ මාලාවක් පවත්වන ලදී.

මෙහි එක් උද්ඝෝෂණයක් පසුගිය ජූලි 31 වෙනිදා අනුරාධපුර නගරයේදී පැවැත්වුණු අතර එයට රාජ්‍ය අංශයේ රැකියාවන්හි නියුතු බොහෝ පිරිසක් සහභාගි වී සිටියහ.



# ජනතාවාදී පාලනයක් උදෙසා



එක්සත් කඳවුර නියෝජනය කරන එ.ජා.ප., ශ්‍රීල.නි.ප. සහ මහින්ද කණ්ඩායම විටෙක එකඟතාවයෙන්ද තවත් විටෙක ජනතාව රැවටීම සඳහා ගැටෙමින්ද තම දේශපාලන ක්‍රියාවලිය පවත්වාගෙන යමින් සිටී. මේ කිසිදු පක්ෂයකට හෝ කණ්ඩායමකට ඔවුන් කලින් ලබා සිටි ජනප්‍රසාදයට ළඟාවීමට නොහැකි වී තිබේ. එබැවින් ඔවුන්ගේ මූලික අරමුණ වී ඇත්තේ තමන්ගෙන් ගිලිහී යන කොටස් ජ.වි.පෙ. වැනි විකල්ප බලවේගයකට එකතු වීම වැළැක්වීමයි. ඒ සඳහා ආණ්ඩුව නියෝජනය කරන පක්ෂ රාජ්‍ය මාධ්‍යද, අනෙක් කණ්ඩායම් පෞද්ගලික මාධ්‍යද යොදා ගනිමින් තම දේශපාලන මතවාදය ජනතාවගේ ඔළු තුළට ඔබ්බවමින් ඇත.

එම කඳවුර එසේ කටයුතු කරමින් සිටියදී ජ.වි.පෙ. රට ගොඩනගන පාලනයක් පිළිබඳ කතිකාවක් ජනතාව සමඟ ඇති කර ගැනීමේ අරමුණින් "රට රකින - රට හදන, ජනතාවාදී පාලනයක්" යන තේමාව යටතේ ජනහමු දස දහසක් දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන සේ පැවැත්වීමට කටයුතු සංවිධානය කරන ලදී.

මේ ජනහමු මාලාව පැවැත්වීම ජූලි මස 15වැනිදා ආරම්භ කරන ලද අතර ජනතාගේ උණුසුම් ප්‍රතිචාර සමගින් පසුගිය අගෝස්තු මාසයට පුරාම දිවයිනේ විවිධ ප්‍රදේශවල මේ ජනහමු පැවැත්වුණි. ඒ අනුව පසුගිය අගෝස්තු 04වැනිදා ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් අම්පාර දිස්ත්‍රික්කයේද ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා, ප්‍රචාරක ලේකම් විජිත හේරත්, පා.ම. සුනිල් හඳුන්නෙත්ති යන සහෝදරවරුන් පිළිවෙලින් ගම්පහ, කොළඹ සහ අනුරාධපුර යන දිස්ත්‍රික්කයන්හිදීද ජනහමු පැවැත්වීමට එක්වූහ.

# වංචාවට, දූෂණයට සහ නාස්තියට වැට බඳිමින්

පළාත් සභා යනු සුදු අලියෙකු බව ජ.වි.පෙ. පැවසුවේ පළාත් සභා ආරම්භ කරන ලද අවස්ථාවේදීමය. 13වැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ගොඩනගන ලද පළාත් සභා ව්‍යුහය ස්ථාපිත කරන ලද දේශපාලන වුවමනාව ඉටු නොවූ තත්වයක් තුළ අද දවසේ එහි කාර්යභාරය වී ඇත්තේ පාර්ලිමේන්තුවට පත් විය නොහැකි දේශපාලඥයන්ගේ මනදොළ සපුරන ආයතනයක් ලෙස කටයුතු කිරීමය. එම දේශපාලන අධිකාරියත් සමග එක්වූ ඇතැම් නිලධාරින්ද ජනතා මුදල් කාබාසිනියා කර දමන්නේ එම දේශපාලඥයන්ටද නොදෙවෙනි ආකාරයටය.

පසුගියදා බස්නාහිර පළාත් සභාවේ රු 650,000/ ක් වටිනා සුපිරි පුටු ගනුදෙනුවක් පිළිබඳ කතිකාවක් මතුවූයේ වංචාවට, දූෂණයට හා නාස්තියට එරෙහිව ජ.වි.පෙ. පළාත් සභා මන්ත්‍රී කණ්ඩායම හඬ නැගූ නිසාවෙනි.

මෙසේ පළාත් සභාව තුල සිදුවන නීත්‍යානුකූල නොවන මුදල් ගනුදෙනුවලට එරෙහිව අනවත අරගලයක යෙදෙන ජ.වි.පෙ. මන්ත්‍රී කණ්ඩායම පසුගිය අගෝස්තු 13 වෙනිදා බස්නාහිර පළාත් සභාවේ නීති විරෝධී තනතුරු හතරක් සඳහා ජනතා මුදල් වෙන් කිරීම නීත්‍යානුකූල නොවන බවත් සහ එම වියදම් කළ මුදල් ප්‍රමාණය කොපමණද යන්න පිළිබඳව විගණනය කළ යුතු බවත් සඳහන් කරමින් විගණකාධිපතිවරයාට පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලදී.

පළාත් සභා පනතේ සඳහන් ආකාරයට පළාත් සභාවේ තිබිය යුතු ධුරයන් වන්නේ ප්‍රධාන අමාත්‍යවරයා ඇතුළුව ඇමතිවරුන් පස්දෙනා, සභාපති සහ නියෝජ්‍ය සභාපති පමණි. එහෙත් ආණ්ඩු පක්ෂයේ සංවිධායක, සභා නායක, විපක්ෂ නායක, විපක්ෂයේ සංවිධායක ආදී නීති විරෝධීව ස්ථාපිත කර ගෙන ඇති තනතුරු සඳහා පළාත් සභාවේ මුදල් වෙන් කිරීම මෙම පැමිණිල්ලට පදනම් වී ඇත. මේ අවස්ථාව සඳහා ජ.වි.පෙ පළාත් සභා මන්ත්‍රී කණ්ඩායම් නායක ලක්ෂමන් නිපුනාරච්චි, මන්ත්‍රීවරුන් වන මහින්ද ජයසිංහ, නීතිඥ සුනිල් වටගල, නන්දන පත්මකුමාර සහ සරත් පතිරණ යන සහෝදරුවරු සහභාගි වූහ.



# සිංගප්පූරු + ශ්‍රී ලංකා වෙළඳ ගිවිසුම

# ලංකාවේ සේවා ආර්ථිකයට සලකන හැටි



සිංගප්පූරු + ශ්‍රී ලංකා වෙළඳ ගිවිසුම පිළිබඳ සමාජය තුළ විවිධ කතිකාවන් මේ වන විට ඇතිවී ඇත. රනිල් වික්‍රමසිංහ - මෛත්‍රීපාල හවුල් ආණ්ඩුව ඉතා කඩිමුඩියේ පාර්ලිමේන්තුවටද වසං කරමින් මෙම ගිවිසුම අත්සන් කිරීම විසින්ම මෙම ගිවිසුමෙන් රටට වන හානි ගැන විමසීමට සමාජ අවධානය යොමු විය. ජනාධිපතිවරයා මුලසුන දරන කැබිනට් මණ්ඩලයේම අනුමත කර 2018 මැයි 01 සිට ක්‍රියාත්මක වීමට සැලැස්වූ මෙම ගිවිසුම යළි සලකා බැලීමට ඒ ජනාධිපතිවරයාම කමිටුවක් පත් කර ඇති බව පසුගියදා මාධ්‍ය වාර්තා කළේය. තමන්ම මුලසුන දැරූ කැබිනට් මණ්ඩලයේ මෙම ගිවිසුම අනුමත කළ බව " අමතක වී" ජනාධිපති විසින් යළි කමිටුවක් පත් කළා විය හැකිය. ඒ විහිළු සාමාන්‍ය දෙයක් බවට පත්වී ඇති නිසා මෙම ගිවිසුම රටට, ආර්ථිකයට වන හානිකර බලපෑම ගැන වඩා අභ්‍යන්තරයෙන්, හරයෙන් සාකච්ඡාවක් අවශ්‍යව ඇත.

මෙම ගිවිසුමේ අන්තර්ගතය කොටස් දෙකකි. සම්පූර්ණ කාලය වසර 12ක් දක්වා භාණ්ඩ 7000කට වැඩි ප්‍රමාණයක් සඳහා සියලු බදු නිදහස් කිරීම (Tax zero) එක් පාර්ශ්වයකි. අනෙක් කොටස සේවා ක්ෂේත්‍රයට අදාළ බලපෑමයි. වෛද්‍ය වෘත්තිකයින් ඇතුළු බොහෝ පිරිසක් වෘත්තීමය සේවා ක්ෂේත්‍රවල රැකියා කරන්නන් හට මෙම ගිවිසුමෙන් වන බලපෑම ආණ්ඩුව හිතාමතාම වසං කිරීමට විවිධ ප්‍රයත්නයන් දරනු පෙනේ.

ආණ්ඩුව මෙම ගිවිසුම රටට යහපත් ගිවිසුමක් ලෙස හුවාදැක්වීමට උත්සාහ දරන අසාර්ථක ප්‍රයත්නයන් වන්නේ, මෙම ගිවිසුම නිසා විදේශ ආයෝජන රට තුළට ගලා එන බවත්, ඒ නිසා රැකියා අවස්ථා වැඩිවන බවත් පුනපුනා දැක්වීමයි.

නමුත් සේවා ක්ෂේත්‍රයේ විවෘත කිරීම ලංකාවේ දැනට පවතින කර්මාන්ත හා රැකියා සඳහා කරන ඍජු බලපෑම විසින් දේශීය කර්මාන්ත හා ව්‍යාපාරත් ඒ හරහා රැකියාවලටත් ඍජු බලපෑමක් සිදුවීම නොවැළැක්විය හැකිය.

### විරැකියාවේ දැන් තත්වය

දැනට ලංකාවේ වයස 25-35ත් අතර රැකියා කරන වයසේ තරුණ පිරිස් අතර විරැකියා ප්‍රතිශතය 24%ක් පමණ ඉහළ මට්ටමක පවතින බව සමීක්ෂණවලින් හෙළිදරව් වී ඇත. මහ බැංකුව විසින් අවම වශයෙන් සතියකට පැය 04ක් කුමන හෝ ආර්ථික කටයුත්තක නියැලෙන්නෙකු රැකියාවක් කරන්නෙකු ලෙසට සලකනු ලබයි. එසේවත් අවස්ථාවක් නොලබන පිරිස ලංකාවේ වසරකට 493,000ක් පමණ වේ. උසස් පෙළ සමතුන්ගෙන් 39%ක් විරැකියාවෙන් පෙළේ. මේ තත්වය තුළ සිංගප්පූරු ගිවිසුමෙන් වෘත්තීමය රැකියා අහිමි වන ප්‍රමාණය තවත් වැඩි වේ නම්, එය ලංකාවේ දැවැන්ත සමාජ අර්බුදයක් වනු නියතය. එසේ ලංකාවේ රැකියා වෙළඳපොළට හා සේවා ආර්ථිකයට ඍජු බලපෑමක් මෙම හොර ගිවිසුමෙන් සිදුවන බව ගිවිසුමේ වගන්ති විග්‍රහ කර ගැනීමේදී හොඳින් තේරුම් ගත හැකිය.

### Mode - 4 - විවෘත කිරීම

මෙම ගිවිසුමේ එක් රටක පුරවැසියන් තවත් සාමාජික රටක භූමිය වෙත ගොස් සේවා සැපයීම විස්තර කර ඇත්තේ මොඩියුල 4 (mode - 4) යටතේය. මෙම කොටසේ ස්වභාවික පුද්ගලයින්ගේ පැමිණීම (natural persons movements) අනු කාණ්ඩ 4ක් යටතේ විස්තර කරයි. එනම්,

(1) ව්‍යාපාරික අමුත්තන් (Business visitors)

(2) අන්තර් සමාගම හුවමාරුව (Intracooperats Transfers)

(3) ගිවිසුම්ගත සේවා සපයන්නන් (contractuale service suppliers)

(4) ස්වාධීන වෘත්තිකයනින් (Independant professional) ලෙසය.

ව්‍යාපාරික අමුත්තන් යනු ගිවිසුම යටතේ සම්බන්ධ වන ඉහළ කළමනාකරණයේ විධායක ශ්‍රේණි නිලධාරීන්ද ඇතුළත් පිරිස්ය. ඔවුන් නිශ්චිත කාලයට වීසා පහසුකම් ලබා පැමිණෙන පිරිසකි. අන්තර් සමාගම් හුවමාරුව යටතේ අදාළ සිංගප්පූරු සමාගමක් හෝ සිංගප්පූරුවේ ලියාපදිංචි වෙනත් රටක සමාගමක් ලංකාවේ මෙම ගිවිසුම යටතේ ආයෝජන කර ව්‍යාපාර අරඹන්නේ නම් එම සමාගමේ සේවකයන්, කළමනාකරුවන්, කාර්ය මණ්ඩලය ලෙස වෘත්තිකයින්ට ලංකාවට පැමිණීමට ඉඩකඩ සලසා ඇත. ඒ අනුව ආයෝජන ලෙස රෝහලක් විවෘත කරන්නේ නම්, එහි කාර්යමණ්ඩලයේ කොටසක් ලෙස වෛද්‍යවරුන්ද පැමිණීමට හැකියාවක් ඇත.

ඊළඟ කොටස ගිවිසුම් සහ සේවා සපයන්නන්ය. ඔවුන් අදාළ නිශ්චිත ගිවිසුමට අනුව රටවල් දෙක අතර හුමවාරු වන පුද්ගලයින්ය. ස්වාධීන වෘත්තිකයින් යනු, අදාළ ආයෝජන සමාග මෙන් පිටස්තර නමුත් විශේෂ පුද්ගලයින් ලෙස කැඳවා ගන්නා පිරිස්ය.

මෙම සේවා ක්ෂේත්‍ර විවෘත කිරීම, ක්‍රියාත්මක කරන ආකාරයද තිරස් (Horizontal commitment) බැඳීම හා සිරස් බැඳීම (Vertical commitment) ලෙස දෙයාකාරය. තිරස් බැඳීම යනු, ගිවිසුමට අන්තර්ගත කරන ලද පොදුවේ ගත් කළ සියලු සේවා ක්ෂේත්‍රවලට බලපෑ හැකි ලෙස ඇතුළත් කළ කොටස වේ. සිරස් බැඳීම යනු, එක් එක් සේවා ක්ෂේත්‍ර සඳහා වෙන වෙනම ඇති කරගන්නා බැඳීමය. එනම් අදාළ සේවා ක්ෂේත්‍රය විවෘත කරන ආකාරයයි. මෙම mode - 4 මොඩියුලයට අනුව ස්වභාවික පුද්ගලයින් ලෙස ලංකාවේ සේවා ක්ෂේත්‍රයේ රැකියා විවාත කරන සේවා ක්ෂේත්‍රයන් මෙසේය.

1. සන්නිවේදන සේවා (Communication service)

2. පරිගණක හා ඒ ආශ්‍රිත සේවා (Computer service)

3. රක්ෂණ හා තැරැවිකාර හා නියෝජිත සේවා (Insurance brookering service)

4. බැංකු හා වෙනත් සැලසුම් සේවා (Banking and other financial service)

5. වරාය බහාලුම් සේවා (Cargo handling service)

6. ගබඩා හා ගුදම් සේවා (Storage and warehouse service)

7. ඉදිකිරීම් ආශ්‍රිත සේවා (Construction related service)

8. ප්‍රචාරණ සේවා (Advertising service)

9. තාක්ෂණික පරීක්ෂණ සේවා (Techinical testing service)

10. හෝටල් රෙස්ටුරන්ට් සේවා (Hotel resturent / catering service)

11. සංචාරක නියෝජිත හා මඟපෙන්වීමේ සේවා (Travel agency and tour operater service)

ඉහත ක්ෂේත්‍ර පිළිබඳව ගිවිසුමේ සඳහන් කර ඇත්තේ තිරස් බැඳීම හැර වෙනත් බැඳීම් නැති බවයි. ඒ නිසා තිරස් බැඳීම්වලට යටත්වන ක්ෂේත්‍රවල සිරස් බැඳීම ඇති කර ගැනීමට තිරස් බැඳීම්වලට යටත්වීම හෝ නොවීම බාධාවක් වන්නේ නැත. මෙම ක්‍රමවේදය ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම්වල යොදා ගන්නා තාක්ෂණික යෙදුමකි.

### රැකියා ඒජන්සිවලටත් ඉඩ

වහල් වෙළඳාමේ නූතන මුහුණුවර වන රැකියා ඒජන්සි හරහා මිනිසුන් සේවයේ යෙදවීමේ (man power) සමාගම් සඳහාද මෙම ගිවිසුමේ 07වැනි පරිච්ඡේදය අනුව ඉඩ සලසා දී ඇත. ලංකාවේ කාන්තාවන් මැදපෙරදිග වහල් සේවයට විකුණන ශ්‍රී ලංකාවේ ආණ්ඩුව මෙම ගිවිසුම මඟින් වෙනත් රටවල විධායක නිලධාරින්, (CPC - 87201) කාර්යාලීය සහායකයින් (CPC - 87203) ගෘහස්ථ සේවකයින් (CPC - 87204) හා වෙළඳ හා කර්මාන්ත සේවකයින් (CPC - 87205) ලෙස "සේවා භාණ්ඩ" ලෙස විදේශ ශ්‍රමිකයින් ලංකාවට ගෙන්වීමට මිනිස්බල සැපයුම් සමාගම්වලට මෙම ගිවිසුමෙන් ඉඩකඩ විවෘත කර දී ඇත.

### ආසියාවේ කුණු ලංකාවට

මෙම රටට හානිකර ගිවිසුමෙන් සේවා ක්ෂේත්‍රය යටතේම වෙනත් රටවල බැහැර කරන කැළිකසළ හා මලාපවාහන අපද්‍රව්‍යද ලංකාවට ගෙන ඒමේ ව්‍යාපාරවලටද ඉඩකඩ සලසා ඇත. ලංකාවට කැළිකසළ බැහැර කිරීමටද බදු නිදහස් කර ඇත. එමගින් මිනිස් ශරීර පද්ධතියටද හානිකර පරමාණුක කසළවල සිට නගර සභා කැළිකසළ දක්වා හඳුනාගත් කසළ වර්ග 70කට වැඩි ප්‍රමාණයක් බදු නිදහස් කරන ලැයිස්තුවට ඇතුළත්ය.

ඒ යටතේ,

(1) නාගරික අපද්‍රව්‍ය

(2) මළ ප්‍රවාහන

(3) සායනික අපද්‍රව්‍ය

(4) ඖෂධ අපද්‍රව්‍ය

(5) න්‍යෂ්ටික අපද්‍රව්‍ය

ඇතුළත්ය.

රටවල් අතර, අහිතකර අපද්‍රව්‍ය ප්‍රවාහනය වැළැක්වීමේ ප්‍රඥප්තිය වන ජාත්‍යන්තර බාසල් සම්මුතියට (Basel Convention) අප රටක් ලෙස අත්සන් කළද එය ලංකාවේ පාර්ලිමේන්තුවේ නීතියක් ලෙස සම්මත කර නැත. ඒ නිසා බාසල් සම්මුතියේ රැකවරණයක් ලංකාවට නොලැබේ. එබැවින් සිංගප්පූරු ගිවිසුමට අනුව ලංකාවට "කසළ අයෝජකයෙකු" පැමිණියහොත් එයට විරුද්ධ වීමට ලංකාවට නොහැකි වෙනු ඇත.

මේ ඉහතින් දක්වන ලද්දේ මෙම රටට අහිතකර ජනතාවට හතුරු ගිවිසුමේ සේවා ක්ෂේත්‍රයේ කොටස් කිහිපයක් පමණි. නීතිමය හා ලිඛිත වගන්ති තුළ සඟවන ලද තවත් බොහෝ භයංකර එකගතාවයන් මෙම ලියවිල්ලේ අඩංගු වී ඇති බව නිසැකය. ඒ නිසාම රටක් ලෙස මෙම ගිවිසුම හකුළා දැමීමට ආණ්ඩුවට බල කරන අතරම ජනතාවක් ලෙස මෙවැනි රටට හතුරු ගිවිසුම් හොර රහසේ අත්සන් කරන පාලකයින් එලවා දැමීමටද ජනතාව සිහි නුවණින් ක්‍රියා කළ යුතුව තිබේ.

> මෙම රටට හානිකර ගිවිසුමෙන් සේවා ක්ෂේත්‍රය යටතේම වෙනත් රටවල බැහැර කරන කැළිකසළ හා මලාපවාහන අපද්‍රව්‍යද ලංකාවට ගෙන ඒමේ ව්‍යාපාරවලටද ඉඩකඩ සලසා ඇත. ලංකාවට කැළිකසළ බැහැර කිරීමටද බදු නිදහස් කර ඇත. එමගින් මිනිස් ශරීර පද්ධතියටද හානිකර පරමානුක කසළවල සිට නගර සභා කැළිකසළ දක්වා හඳුනාගත් කසළ වර්ග 70කට වැඩි ප්‍රමාණයක් බදු නිදහස් කරන ලැයිස්තුවට ඇතුළත්ය.



"අධිරාජ්‍යවාදය සමාජවාදී විප්ලවයේ පූර්වාසන්නය වන්නේ රාජ්‍ය ඒකාධිකාරී ධනපති ක්‍රමය යනු සමාජවාදය සඳහා අවශ්‍ය සම්පූර්ණ ද්‍රව්‍යමය සූදානම් කිරීම වන හෙයිනි: එය සමාජවාදයට පිවිසෙන එළිපත්ත වන හෙයිනි: එය ඉතිහාසය නැමති හිණිමගේ, එයත් සමාජවාදය නැමති හිණි පෙත්තත් අතර අන්තර් හිණක් නොමැති හිණි පෙත්ත වන හෙයිනි."

**ලෙනින්**
**තෝරාගත් කෘති, 05වැනි වෙළුම, 263 පිටුව**

# කියුබාවට නව ව්‍යවස්ථාවක්



කියුබාවට නව ව්‍යවස්ථාවක් සකස් කෙරෙමින් තිබේ. මෙ අනුව නව ව්‍යවස්ථා කෙටුම්පත ජූලි 20 වන දින දක්වා පාර්ලිමේන්තුවේදී සාකච්ඡාවට ලක් කෙරුණි. මේ වන විට එය ජනතා සාකච්ඡාව සඳහා කියුබානු ජනතාව වෙත ඉදිරිපත් කර තිබේ.

නව ව්‍යවස්ථාව මගින් කියුබාවේ දේශපාලනික, ආර්ථික හා සමාජයීය ක්‍රමය සමාජවාදය ලෙස නැවත තහවුරු කර තිබේ. එසේම රාජ්‍යයට හා සමාජයට නායකත්වය දීමේ බලය කොමියුනිස්ට් පක්ෂය සතුව ඇති බව ඉන් නැවත වරක් තහවුරු කර තිබේ. මීට අමතරව පහත සඳහන් වැදගත් කරුණු නව ව්‍යවස්ථාවට ඇතුළත් කර ඇත.

⋆ එක් එක් පුද්ගලයාගේ සහ පොදුවේ සාමූහික සමෘද්ධිය වෙනුවෙන් තිරසාර සංවර්ධනයක් ඇති කිරීමටත්, වැඩි ප්‍රමාණයකින් සමාජ සාධාරණත්වය හා සමානාත්මතාව ඇති කිරීමටත්, විප්ලවය විසින් දැනටමත් දිනාගත් ජයග්‍රහණ ආරක්ෂා කිරීමටත්, ඒවා තවදුරටත් වැඩි දියුණු කිරීමටත් කටයුතු කෙරේ.

⋆ මූලික නිෂ්පාදන මාධ්‍යයන් සමාජවාදී දේපළක් ලෙසට පවතින අතර සැලසුම්කරණය සමාජවාදී ප්‍රතිපත්ති මත සකස් කෙරේ.

⋆ වෙළඳපොළ ක්‍රියාකාරිත්වයේ වැඩි කොටස (වෙළඳපොළ ආර්ථිකය) අවශ්‍ය දෙයක් ලෙස හඳුනාගෙන ඇති අතර නව ආකාරයක දේපළ එනම් පුද්ගලික දේපළ පැවතිය හැකි බවට තීරණය කර ඇත. එය මෑතකදී සම්මත කරගත් ආර්ථික හා සමාජ සංවර්ධන මඟපෙන්වීම් අනුව සිදු කෙරෙනු ඇත.

⋆ ජාතික ආර්ථිකයේ ප්‍රධාන වැඩ කොටස රාජ්‍ය සමාගම් විසින් සිදු කෙරේ. ඒවායේ ස්වාධීනත්වය අත්‍යවශ්‍ය ප්‍රායෝගික මූලධර්මයක් ලෙස හඳුනාගෙන ඇත.

⋆ රට සංවර්ධනය කිරීමේ දී ප්‍රමාණවත් සහතිකයන් සහිතව විදේශ ආයෝජනයන්ගේ අවශ්‍යතාව ව්‍යවස්ථාමය වශයෙන්ම හඳුනාගෙන ඇත.

⋆ ඉඩම්වල පෞද්ගලික අයිතියටද විශේෂ ක්‍රමවේදයක් යටතේ නව ව්‍යවස්ථාව විසින් ඉඩ ලබාදී තිබේ. ඉඩම් පැවරීමේදී සීමාවක් හඳුන්වා දී ඇති අතර රාජ්‍යයේ මූලික අයිතිය යටතේ සාධාරණ මිලකට ඒවායේ භාරකාරත්වය ලබා ගැනීමට ඉඩ දී තිබේ.

⋆ කියුබානු පුරවැසියන්ට වෙනත් රටවල පුරවැසිකම් දැරිය නොහැකි බව ප්‍රකාශ කර ඇත.

⋆ ජනාධිපතිධුරයක් හා උප ජනාධිපතිධුරයක් ඇති කරනු ඇත.

⋆ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවෙන් තෝරා පත්කර ගත යුතු අතර ඔහු රාජ්‍යයේ ප්‍රධානියා වේ. ඔහුගේ ධුර කාලය අවුරුදු 05කි. ජනාධිපතිධුරය එක් අයෙකුට දැරිය හැක්කේ වාර 02ක් පමණි.

⋆ අමාත්‍ය මණ්ඩලය රටේ ඉහළම විධායක හා පරිපාලන ව්‍යුහය වේ. අලුතින් අගමැතිධුරයක් ඇති කෙරෙන අතර ඔහු ආණ්ඩුවේ ප්‍රධානියා වේ.

කියුබාවේ දැනට ක්‍රියාත්මක වන්නේ 1976 වසරේදී හඳුන්වා දුන් ව්‍යවස්ථාවයි. නව ව්‍යවස්ථා කෙටුම්පත වැඩබිම් හා පොදු හමුවීම් 35,000ක දී සාකච්ඡා කිරීමට සැලසුම් කර තිබේ. ඒ සඳහා මෙම වසරේ නොවැම්බර් දක්වා කාලය වෙන්කර දී තිබේ. ඒවායේදී ඉදිරිපත් වන යෝජනා සමග නැවත සකස් කෙරෙන ව්‍යවස්ථාව ලබන වසරේදී ජනමත විචාරණයකට ලක් කෙරේ.

එක්සත් ජනපදයේ ආර්ථික සම්බාධකවලට මුහුණ දෙමින් දුෂ්කර තත්වයක් තුළ පවත්වාගෙන ආ කියුබානු ආර්ථිකය ගොඩනැංවීම සඳහා සකස් කළ නව ආර්ථික වැඩපිළිවෙළ ක්‍රියාවට නැංවීමට අවශ්‍ය මූලික වෙනස්කම් මෙම නව ව්‍යවස්ථා සංශෝධන මගින් සිදුකිරීමට කියුබානු කොමියුනිස්ට් පක්ෂය අපේක්ෂා කරයි.

එහෙත් ඒ අතරම එය කියුබානු ජනතාවගේ අවධානයට හා සාකච්ඡාවට ලක්කර, ඉදිරිපත් වන නව අදහස් හා යෝජනා සලකා බැලීමෙන් පසු අවසන් ව්‍යවස්ථාව සකස් කෙරෙනු ඇත. සමාජවාදය තුළ ප්‍රජාතන්ත්‍රවාදය සැබෑවටම ක්‍රියාවේ යෙදෙන්නේ ඒ ආකාරයටය.

## ගෝලීය උණුසුම අවදානම් මට්ටමක



ගෝලීය උණුසුම ඉහළ යාම 1.5c - 2.0c අතර තබා ගැනීම පෙරදී සිතුවාට වඩා දුෂ්කර බව පෙනීගොස් තිබේ. පැරිස් එකඟතාවට අනුව කාබන් විමෝචනය අඩු කළද පෘථිවිය හරිතාගාර ආවරණය හේතුවෙන් ‘හොට්හවුස් පෘථිවිය’ (Hothouse Earth) බවට පත්වීම වැළැක්විය නොහැකි බව ඕස්ට්‍රේලියානු, ඩෙන්මාර්ක් හා ස්වීඩන් විද්‍යාඥයන් පිරිසක් විසින් සිදුකළ අධ්‍යයනයකදී හෙළිවී තිබේ.

‘හොට්හවුස් පෘථිවිය’ යන තත්වයේදී පූර්ව කාර්මික විප්ලව සමයේ තිබු ගෝලීය උෂ්ණත්වයට වඩා $1^0$c - $5^0$c අතර ප්‍රමාණයකින් ගෝලීය උෂ්ණත්වය ඉහළ යන අතර මුහුදු මට්ටම අදට වඩා මීටර් 10 - 60 දක්වා ඉහළට පැමිණේ. දැනට සාමාන්‍ය ගෝලීය උෂ්ණත්වය පූර්ව කාර්මික විප්ලව සමයට වඩා $1^0$c කින් ඉහළ ගොස් ඇත. එය දශකයකට $0.17^0$c කින් ඉහළ යමින් තිබේ.

පෘථිවිය ඉහත සඳහන් කළ තත්වයට පත්වීම වැළැක්වීමට නම් කාබන් ඩයොක්සයිඩ් හා අනෙකුත් හරිතාගාර වායූන් විමෝචනය වැළැක්වීම පමණක් ප්‍රමාණවත් නොවන බව පවසන ඔවුහු නව ජීව කාබන් සංචිතයක් නිර්මාණය කළ යුතු බවත් ජෛව විවිධත්වය සුරක්ෂිත කළ යුතු බවත් වායු ගෝලයේ කාබන්ඩයොක්සයිඩ් ඉවත් කර ඒවා පොළව යට ගබඩා කර තැබිය හැකි අන්දමේ තාක්ෂණයක් සොයා ගත යුතු බවත් පවසති.

## වෙනසක් සෙවූ පාකිස්ථානු මහ මැතිවරණය



ජූලි 28 වනදා පැවැත්වුණු පාකිස්ථානු මහ මැතිවරණයෙන් හිටපු පාකිස්ථානු ක්‍රිකට් ක්‍රීඩක ඉම්රාන් ඛාන්ගේ පක්ෂය ජය ලැබීය. ඍජුව තෝරා පත්කර ගනු ලබන මන්ත්‍රී ආසන 272න් ආසන 115ක් දිනා ගැනීමට ඔහුගේ ටෙහ්රික් - අයි - ඉස්තාෆ් (PTI) පක්ෂය සමත් විය.

මැතිවරණය පැවැත්වූයේ පාකිස්ථානු ජාතික සභාව හෙවත් පාර්ලිමේන්තුව සහ පළාත් සභා හතරකට නියෝජිතයින් තෝරා පත්කර ගැනීමටයි. පාකිස්ථානු පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 342කි. ඉන් 272ක් ඍජු ඡන්දයෙන් තෝරා පත්කර ගැනේ. පාර්ලිමේන්තුව තුළ ආසන 60ක් කාන්තාවන් සඳහා වෙන්කර ඇති අතර ආසන 10ක් සුළු ආගමික කොටස් වෙනුවෙන් වෙන් කර ඇත. ඉතිරි ආසන එක් එක් පක්ෂය විසින් ලබාගත් ඡන්ද ප්‍රතිශතය අනුව සමානුපාතිකව බෙදා දේ.

මෙවර මැතිවරණයෙන් හිටපු අගමැති නවාස් ශරීෆ්ගේ පාකිස්ථානු මුස්ලිම් ලීගය ආසන 64ක් ද හිටපු ජනාධිපති අසිෆ් සර්ධාරිගේ පකිස්ථානු ජනතා පක්ෂය ආසන 43ක් ද ලබා ගත්තාය. ඉතිරි ආසන ප්‍රමාණය අනෙකුත් කුඩා පක්ෂ අතර බෙදී ගොස් තිබේ.

නව ආණ්ඩුවක් පිහිටුවීමේදී ඉම්රාන් ඛාන්ගේ පක්ෂයට අනෙකුත් කුඩා පක්ෂවල සහය ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ව්‍යවස්ථාව අනුව පකිස්ථානු ජනාධිපතිවරයා මහ මැතිවරණයෙන් දින 21ක් ඇතුළත පාර්ලිමේන්තුව කැඳවා නව අගමැතිවරයෙකු තෝරා පත්කර ගැනීමට ඉඩ සැලැස්විය යුතුය.

පාක්ස්ථානයේ දේශපාලනික වර්ධනයක් කලාපීය වශයෙන් ඉන්දියාවටත්, චීනයටත් වැදගත් වන අතර එක්සත් ජනපදයද ඒ පිළිබඳ අවධානය යොමුකර තිබේ. පකිස්ථානය චීනය මුහුදු සේද මාවතේ වැදගත් සන්ධිස්ථානයකි.

ඒ අතර පාකිස්ථානු දේශපාලනයේදී එරට හමුදාවේ කාර්යභාරය නොසලකා හැරිය නොහැකිය. බොහෝ විට එරට පාලනයන් හසුරුවනු ලබන්නේ හමුදාව විසිනි. ජනතාව මැතිවරණයෙන් නව නායකයෙකු අතට බලය මාරු කර වෙනසක් අපේක්ෂා කළද ඉහත හේතුව නිසා සහ ඛාන්ගේ පක්ෂය තවත් ධනේශ්වර පක්ෂයක් වීම නිසා එය ඉටුවේද යන්න සැක සහිතය.

## ඉන්දියානු මහ මැතිවරණය තීරණාත්මක කඩඉමක




ඉන්දියාවේ පාර්ලිමේන්තු මැතිවරණය ලබන වසරේ මුලට යෙදී තිබුණද එය ඊට පෙර, මෙම වසර අවසානයේදී පැවැත්වෙනු ඇතැයි දේශපාලන විචාරකයෝ අනාවැකි පළකරති.

පාලක භාරතීය ජනතා පක්ෂයේ ජනප්‍රියතාව වේගයෙන් බිඳ වැටෙමින් තිබේ. මෑතකදී මැතිවරණ පැවැත්වුණු උත්තර් ප්‍රදේශය, මහා රාෂ්ඨය, බටහිර බෙංගාලය, රාජස්ථානය හා බිහාරය යන ප්‍රාන්තවලදී භාරතීය ජනතා පක්ෂය පරාජය ලැබීය. ඉන්දියානු පාර්ලිමේන්තුවේ ආසන 643න් ආසන 260ක්ම තේරී පත් වන්නේ මෙකී විශාල ප්‍රාන්තවලිනි. භාරතීය ජනතා පක්ෂය 2014 මැතිවරණයේදී මෙම ප්‍රදේශවලින් ආසන 170ක් පමණ දිනා ගැනීමට සමත්ව තිබිණි.

මේ අතර අගෝස්තු 15 ඉන්දිය ජාතික දිනයෙන් පසුව භාරතිය ජනතා පක්ෂය මැතිවරණය ඉලක්ක කර ගනිමින් කටයුතු කිරීමට තීරණය කර තිබේ.

භාරතීය ජනතා පක්ෂය විසින් දිගින් දිගටම සුළු ජන කොටස් ඝාතනය කිරීම් හා ඔවුන්ට වෙනස් කොට සැලකීම් සිදු කරන ලදී. මීට අමතරව ඔවුන් හඳුන්වා දුන් භාණ්ඩ හා සේවා බද්දත් ආර්ථිකයේ කඩා වැටීමත් විසින් ජනතාවගේ ජීවන බර ඉහළ ගොස් තිබේ. ඔවුන්ගේ ජනප්‍රියතාව පහත වැටීමට මෙම තත්වයන් හේතුවිය.

## වෙනිසියුලානු ජනාධිපති ඝාතන තැතක්



පසුගිය අගෝස්තු 04 වැනි සෙනසුරාදා වෙනිසියුලානු ජනාධිපති නිකොලාස් මධුරෝ ඝාතන තැතක් ක්‍රියාත්මක විය. එහෙත් එහිදී ඔහුගේ ජීවිතයට අනතුරක් සිදු වූයේ නැත. ඔහු හමුදා උත්සව අවස්ථාවකට සහභාගිවී හමුදාව අමතමින් සිටියදී ඩ්‍රෝන ප්‍රහාරයක් එල්ල විය. ඔහු ඉලක්ක කොට ගනිමින් එය ක්‍රියාත්මක වුවද එහි ඉලක්කය වැරදී කලින්ම පුපුරා යාම නිසා ජනාධිපතිවරයාගේ ජීවිතයට අනතුරක් සිදු නොවීය. එහෙත් එකී ප්‍රහාරයට ලක්ව හමුදා සෙබළු ඇතුළු 07 දෙනෙකු තුවාල ලැබීය. ජීවිත හානි කිසිවක් සිදු නොවුණි.

මෙම ඝාතන ප්‍රයත්නය පිළිබඳ ඍජුවම චෝදනාව එල්ල වී ඇත්තේ, එක්සත් ජනපද හිතවාදී වෙනිසියුලානු විපක්ෂය වෙතටයි. ලොව පුරා රාජ්‍ය නායකයින් හා ප්‍රගතිශීලී සංවිධාන මෙම ප්‍රහාරය හෙළාදකිමින් නිවේදන නිකුත් කර තිබුණි. ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩලයද මෙම ඝාතන තැත හෙළා දකිමින් හා ජනාධිපති මධුරෝට සහය පළකරමින් නිවේදනයක් නිකුත් කර තිබුණි.

# සමාජවාදය තුළ සාහිත්‍යය









මේ සාහිත්‍ය මාසයයි. සාහිත්‍ය මාසය තුළදී රට තුළ විවිධ සාහිත්‍යමය ක්‍රියාකාරකම් සංවිධානය කෙරෙනු දක්නට හැකිය. සාහිත්‍ය උත්සව, පොත් ප්‍රදර්ශන, පොත් එළි දැක්වීම්, සාහිත්‍ය තරගාවලී ආදිය ඒ අතර වේ. සාහිත්‍ය පිළිබඳ ලැදියාවක්, ඇල්මක් උනන්දුවක් ඇති ජනතාවද එසේ නොවන පිරිස්ද මෙම අවස්ථාවන්ට සහභාගි වෙති.

'සාහිත්‍යය කන්නදැයි' ලංකාවේ මෙතෙක් සිටි දක්ෂතම ධනේශ්වර පාලකයා එක් අවස්ථාවකදී ප්‍රශ්න කර තිබුණි. සාහිත්‍යය පාසල් විෂය ධාරාවෙන් ඉවත් කරන ලද්දේද එකී පාලන සමයේදීය.

ධනේශ්වර ක්‍රමය තුළ දී සාහිත්‍යයට අත්වන්නේ එවැනි ඉරණමකි. ධනේශ්වර ක්‍රමය තුළදී සාහිත්‍යය අහෝසි වී නොයයි. එහෙත් එය ධනේශ්වර වුවමනාවන් ඉටුකරන මෙවලමක් බවට පත්වෙයි. සාහිත්‍යයෙහි අරමුණ වෙනස් වෙයි.

මිනිසාගේ ශ්‍රමයෙන් බිහිවන කලාව නිශ්චිත ඓතිහාසික අවධියකදී ද්‍රව්‍යමය නිෂ්පාදනයේ සිට සමාජමය විඥානයේ එක් ආකෘතියක් මෙන් ක්‍රියාකාරිත්වයේ විශේෂිත ආකාරයක් කරා බිඳී යයි. "සුන්දරත්වය සංවේදනය කිරීමේ හැකියාව මානව උදාරත්වය පිළිබඳ කොන්දේසියකි"යි, සම්භාවනීය රුසියානු විචාරකයෙකු වූ වී.පී. බෙලෙන්ස්කි ලීවේය. එයින් තොරව, එම සංවේදීතාවයෙන් තොරව සහජ උසස් ඥාන ශක්තියක්ද සහජ කුසලතාවයන්ද, බුද්ධියක්ද තිබිය නොහැකිය. එවිට ගෘහස්ථ ජීවිතයේ භාවිතය සඳහාද ආත්මාර්ථයෙහි සුළු උපක්‍රම සඳහාද අවශ්‍ය ග්‍රාම්‍ය 'සාමාන්‍ය ඥානය' පමණක් ඉතිරි වේ යැයි ඔහු තවදුරටත් ලීවේය.

මෙය කලාවේ එක් අංගයක් වූ සාහිත්‍යයටද, එකසේ අදාළය. උසස් මානව ගුණයක් වන කලාව අරමුණු කරගත යුත්තේ කුමක් ද යන්න පිළිබඳව ඉන් මනාවට ඉඟිකෙරී තිබේ.

එහෙත් ධනේශ්වර ක්‍රමය තුළදී පොදුවේ කලාවත්, එහි අංගයක් වූ සාහිත්‍යයත් පවත්වාගෙන යනු ලබන්නේ ලාභය අරමුණු කර ගෙනය. අන් සෑම දෙයක්සේම සාහිත්‍යාංග යද ධනේශ්වර ක්‍රමය තුළදී හුවමාරු භාණ්ඩ බවට පත්වේ. සහජ මිනිස් ලක්ෂණයක් වන සුන්දරත්වය අත්විඳීමේ වුවමනාව සංතෘප්ත කිරීම සඳහා නිපදවෙන සාහිත්‍යාංග නමැති හුවමාරු භාණ්ඩ ලාභ ඉපයිය යුතුය. ධනේශ්වර ක්‍රමය තුළ සාහිත්‍යය පවතින්නේ ඒතාක් දුරටය.

සෑම සාහිත්‍ය මාසයකදීම සාහිත්‍ය උත්සව, පොත් ප්‍රදර්ශන, පොත් එළිදැක්වීම්, හොඳම කෘති සඳහා ත්‍යාග හා සම්මාන ප්‍රදානය සිදු කෙරෙන්නාසේම, අවසානයේදී මේ හැම එකකම අරමුණ පිළිබඳවද ප්‍රශ්න කෙරේ. මේ හැම එකකම ඇත්තේ ව්‍යාපාරික අරමුණුය. ඒ තුළ සාහිත්‍යය ප්‍රවර්ධනය කිරීමේ අදහසක් නොමැතිය යන්න හැමවිටම නැගෙන චෝදනාවකි.

සත්‍ය වන්නේ ධනේශ්වර ක්‍රමය තුළදී එයට වඩා යමක් බලාපොරොත්තු විය නොහැකි වීමය. ධනේශ්වර ක්‍රමය තුළදී සාහිත්‍යයද තවත් එක් හුවමාරු භාණ්ඩයකි. සාහිත්‍ය පවතිනුයේ එය කොතරම් දුරකට ලාභ උපයා දෙන්නේද ඒ තරමටය. ධනේශ්වර ක්‍රමය තුළදී සාහිත්‍යයේ අරමුණ ලාභ ඉපයීමයි.



"යෞවනත්වයේ සිට පද්‍යවලට කැමැත්තක් නොදැක්වූ නාටකයක් තුළ බාහිර නෘත්‍යාගාර නාටකය පමණක් දකින, පාළුව කැපීමට පමණක් නවකතා කියවන, පුද්ගලයා මිනිසෙකු නොවේ. සෞන්දර්ය විද්‍යාත්මක සංවේදීතාවය යනු කාරුණිකභාවයේ පදනමය. සදාචාරාත්මකභාවයේ පදනමය"

**වී. පී. බෙලින්ස්කි**
**රුසියානු විචාරක**

## ලාභය වෙනුවට ජනතාව අරමුණු කරගත් සාහිත්‍යයක්...

සාහිත්‍ය එහි සැබෑ අරමුණින්, මානවීය අරමුණින් භාවිතයට නැඟෙන්නට පටන් ගත්තේ සමාජවාදය තුළදීය. ජනතාව අතුරින් කලාකරුවන් බිහිකරලීම හා ඔවුන් වර්ධනය කිරීම කලාවට භාර උසස්තම සමාජමය කාර්යයි. එහෙත් මිනිසුන් කලාවේ බලපෑම යටතේ සාහිත්‍යවේදීන්, චිත්‍ර ශිල්පීන්, නළුවන් බවට පත්වේය යන අර්ථයෙන් පමණක් එය තේරුම් නොගත යුතුය. එය සිදුවිය හැකිය. එහෙත් ප්‍රධාන කරුණ එය නොවේ. කලාකරුවන් බිහි කිරීම යන්නෙන් මිනිසාගේ අධ්‍යාත්මික අවශ්‍යතාවන් තෘප්තිමත් කිරීමද, ඒවා වඩාත් උසස් තත්වයට පත්කිරීම හා ඒ මාර්ගයෙන් කලාව සංජානනය කිරීම සඳහා පමණක් නොව මිනිසාගේ සංස්කෘතිය එනම්, වැඩ කිරීමේ උදාර ආකාරය, එදිනෙදා ශිෂ්ට ජීවන ක්‍රමය, යහපත් චින්තනයක් දියුණු කිරීම සඳහාද අවශ්‍ය මිනිසාගේ සෞන්දර්යය විද්‍යාත්මක වර්ධනයට දායකවීමද ඉන් අදහස් කෙරේ.

මේ අනුව සමාජවාදය තුළදී ප්‍රාථමික හා පාසල් අධ්‍යාපනයේ සිටම කලාව හා සාහිත්‍යය පිළිබඳ අවධානය යොමු කෙරේ. 'සෝවියට් පාසල් අධ්‍යාපනය' නම් කෘතියේ ඒ පිළිබඳව මෙසේ සඳහන් වේ.

**"සෞන්දර්යය විද්‍යාත්මක ශික්ෂණය යනු කලාත්මක දැනුමේ ක්ෂේත්‍රය පුළුල්වීම, කියන ලද ග්‍රන්ථ ලැයිස්තුව, නරඹන ලද චිත්‍රපට සංඛ්‍යාව හා සවන් දෙනලද සංගීත නිර්මාණ පමණක් නොවේ, එය මානුෂික සංවේදීතාව, පෞරුෂත්වයේ අධ්‍යාත්මික අභිවෘද්ධිය සංවිධානය කිරීමකි. එය චර්යාව හසුරුවන්නකි. පරිශෝධනය කරන්නකි."** (පිටුව - 244 )

සමාජවාදය තුළදී කලාත්මක හා සාහිත්‍ය අධ්‍යාපනය යනු එම ක්ෂේත්‍රයේ දැනුම පමණක් ඉලක්ක කොට ගත්තක් නොවේ. ධනේශ්වර සමාජය තුළදී සාහිත්‍ය කෘති හා කවි කියවන, ප්‍රදර්ශන හා නාට්‍ය නරඹන, කලාත්මක නිර්මාණ පිළිබඳ හොඳ දැනුමක් ඇති එහෙත් සමාජ විරෝධී ක්‍රියාවන්හි නිරතවන පුද්ගලයෝ ඕනෑතරම් සිටිති. සමාජවාදය තුළදී ශිෂ්‍යයා තුළ වර්ධනය කරන්නේ දැනුම පමණක් නොවේ. එය චර්යාව වෙනස් කිරීමද අරමුණු කර ගනිමින් සිදු කෙරෙන්නේය. සංවේදී, සමාජයට ආදරය කරන, පාරාර්ථකාමී, නිවහල් පුද්ගලයෙක් බිහි කරන්නේය.

## කලාව සුඛෝපභෝගී භාණ්ඩයක් නොවේ

ධනවාදය තුළදී කලාව සුඛෝපභෝගී භාණ්ඩයකි. උසස්තම කලා නිර්මාණ රසවිඳීමට බහුතර ජනතාවට නොහැකිය. පොත්පත්, නාට්‍ය, චිත්‍රපට ආදිය අධික මිලය. අනෙක් අතට කලාව පිළිබඳ පොදු අවබෝධයද බහුතර ජනතාවට ලබා නොදෙයි. නිර්මාණකරණයට පිවිසීම ඊටත් වඩා අපහසුය. සිනමාකරණය, නාට්‍යකරණය, ආදිය හැදෑරීමද සිනමා කෘති හෝ නාට්‍ය නිෂ්පාදනයද සාමාන්‍ය ආදායමක් සහිත අයෙකුට සිදුකළ නොහැකිය. දක්ෂතා ඇති පිරිස් සඳහා එවැනි අවස්ථා සම්පාදනයට කිසිවෙකු මැදිහත් නොවේ. නිර්මාණකරණය ප්‍රාග්ධන හිමියන්ගේ අයිතියක් බවට පත්ව තිබේ.

**එහෙත් සමාජවාදය තුළදී කලාවද එහි ජීවමය වස්තුවද තවදුරටත් සුඛෝපභෝගී භාණ්ඩයක් නොවේ. අතිරේක අවශ්‍යතාවක් නොවේ. සුඛවිහරණයක් හෝ එපමණක් නොව එය ආහාරයෙන් පසු ගන්නා පැණිරස කෑමක්ද නොවේ. එය සාමාන්‍ය ජීවිතයම වේ.**

1937-43 වසරවලදී එක්සත් ජනපද ලේඛකයන්ගේ ලීගයේ විධායක ලේකම් ලෙස කටයුතු කළ එක්සත් ජනපද ගත් කතුවරයෙකු වූ ෆ්‍රැන්ක්ලින් ෆොල්සම් ලියූ 'සෝවියට් පුරවැසියන්ගේ මූලික අයිතීන් සමහරක්' නම් කෘතියේ මෙසේ සඳහන් කර තිබේ.

"සෝවියට් දේශයේ සිනමාශාලා, නාට්‍ය ශාලා සහ කෞතුකාගාර සඳහා අය කෙරෙන මුදල බටහිර යුරෝපය හා එක්සත් ජනපදය හා සසඳන කල ඉතා අඩුය. පොත්වල මිල ගණන් ඉතා අඩුය."

අවුරුද්දකදී සිනමා හා නාට්‍ය බැලීමට පැමිණෙන පිරිස එරට සමස්ත ජනගහනයට වඩා වැඩිය. රටේ ජනගහනයෙන් 2/3ක් සෑම අවුරුද්දකදීම කෞතුකාගාර නැරඹීම සඳහා පැමිණෙති. සෝවියට් දේශය තුළ භාෂා 47කින් ක්‍රියාත්මක වන රංග ශාලා 600කට වැඩිය තිබුණි. 1981 වෙද්දී ජනගහනයෙන් 90% කට තමන්ගේම රූපවාහිනී යන්ත්‍රයක් තිබුණි. රූපවාහිනී වැඩසටහන්වලට අප රටවල මෙන් වෙළඳ දැන්වීම් නිසා බාධා පැමිණියේ නැත. රූපවාහිනී වැඩසටහන් නොමිලයේ නැරඹිය හැකි වුවද, ඒ හේතුව නිසා සිනමා හා නාට්‍ය නැරඹීම සඳහා පැමිණෙන පිරිස අඩු නොවුණි.

සෝවියට් දේශ්‍ය තුළ නිර්මාණකරණයේ දක්ෂතාව ඇති කවරෙකුට වුවද, සිදුකළ හැකි විය. ඒ සඳහා අවශ්‍ය පහසුකම් රජය විසින් සපයා දෙනු ලැබිණි. සිනමාකරණය, නාට්‍යකරණය ආදිය හැදෑරීමද ඒ පිළිබඳ උනන්දුවක් දක්වන කවරෙකුට හෝ හැකිවිය.

සෝවියට් දේශය තුළ කියවීම පුරුද්දක් බවට පත්කර තිබුණි. ලෝකයේ වැඩියෙන්ම කියවන ජනතාව බවට ඔවුන් පත්වූයේ ඒ නිසාය.

## පොත් කියන්නන්ගේ සංගමය හා ලේඛක සංගමය

සෝවියට් දේශය තුළ පොත් කියවීම උනන්දු කරවීම සඳහා 1974 දී පොත් කියවන්නන්ගේ සංගමයක් ගොඩනංවන ලදී. 1981 වන විට එහි ශාඛා 130,000ක් ගොඩනංවන ලද අතර, සාමාජිකත්වය 9,000,000ක් විය. මෙම සංගමය විසින් සෑම වර්ගයකම පොත් පිළිබඳ සාකච්ඡා සභාවක් සංවිධානය කෙරුණි. ලේඛකයන්ට තම සාමාජිකත්වය ඇමතීමට අවස්ථා සම්පාදනය කර දෙනු ලැබීය. මහජන පුස්තකාල, පාසල් පුස්තකාල හා වෘත්තීය සමිති පුස්තකාල වැඩි දියුණුව සඳහා උදව් කරන ලදී.

1913 මුළු සෝවියට් දේශයේම අයත් මුළු භූමි ප්‍රදේශයටම තිබුණේ පුස්තකාල 13,900ක් පමණි. 1980 වන විට එය 132,000 දක්වා ඉහළ ගොස් තිබුණි. එකී පුස්තකාල අතරින් 95,000ක්ම පිහිටුවා තිබුණේ ග්‍රාමීය ප්‍රදේශවලය.

සෝවියට් ලේඛකයන්ගේ සංගමයේ ශාඛා සෑම සෝවියට් ජනරජයකම පිහිටුවා තිබුණි. ඒ සෑම තැනකම සංගමය වෙනුවෙන් වෙන්වූ මූලස්ථානයක් පවත්වාගෙන ගිය අතර ඒ සඳහා වෙන්කර තිබුණේ සාර් පාලන සමයේ ඉඩම් හිමියන් විසින් භාවිතා කළ ඔවුන්ගේ මාලිගාය. මෙම මූලස්ථානවලදී ලේඛකයන් නිතර රැස්වූ අතර ඔවුන් අතර, සාකච්ඡා සංවාද ඇතිවිය. ලේඛනකරණයට පිවිසෙන නවකයන් සඳහා මෙම සංගමයෙන් විවිධ වැඩසටහන් සංවිධානය කෙරුණි.

අනෙකුත් රටවල මෙන් සෝවියට් ලේඛකයන්ගේද ප්‍රධාන ආදායම් මාර්ගය වූයේ පොත් අලෙවියෙන් ලැබෙන ආදායමයි. සෝවියට් දේශය තුළ පොත්පත් අලෙවිය ඉතා ඉහළ මට්ටමක පැවතුන බැවින් ලේඛකයන්ගේ ආදායමද යහපත් එකක් විය.

## ලේඛනයට නව රීතියක්

සමාජවාදය විසින් සාහිත්‍යකරණයට කළ එක් දැවැන්ත මෙහෙවරක් වන්නේ සමාජ සත්තා යථාර්ථවාදී රීතිය හඳුන්වාදීමයි. එහි ආරම්භකයා මහා ලේඛක මක්සිම් ගෝර්කිය. ඉන්පසුව එකී රීතිය අනුව සාහිත්‍යකරණයේ යෙදුන අනගි සාහිත්‍යකරුවන් රැසක්ම සමාජවාදය විසින් බිහි කරන ලදී. එහි අග්‍රගණ්‍යයා වූයේ නොබෙල් ත්‍යාගය දිනාගත් මිහයිල් ෂොලහොව්ය.

ලිඛිත භාෂාවක් නොවූ කිර්ගීස් ජාතිකයන්ට ලිඛිත භාෂාවක්

15 වැනි පිටුවට

> සමාජවාදය තුළදී කලාවද එහි ජීවමය වස්තුවද තවදුරටත් සුඛෝපභෝගී භාණ්ඩයක් නොවේ. අතිරේක අවශ්‍යතාවක් නොවේ. සුඛවිහරණයක් හෝ එපමණක් නොව එය ආහාරයෙන් පසු ගන්නා පැණිරස කෑමක්ද නොවේ. එය සාමාන්‍ය ජීවිතයම වේ.

# අසමත් ආණ්ඩු හා අනාගත පරපුර



"අපේ දරුවන්ට හොඳ හෙට දවසක් වෙනුවෙන් අපේ අද දවස කැප කරමු." එසේ පැවසුවේ අසල්වැසි ඉන්දියාවේ හිටපු ජනපතිවරයෙකු වූ අබ්දුල් කලාම්ය. දරුවන්ට හොඳ හෙටක් හදන්නට නම් අද දවසේ අප බොහෝ දෑ කළ යුතුව ඇති බව සත්‍යයකි. මන්ද අද දවස ගැන නොසිතා හොඳ අනාගතයක් ගැන අපට සිහින දැකිය නොහැකි හෙයිනි. "හොඳම දේ දරුවන්ට" යැයි සෝවියට් දේශයේ නිර්මාතෘ වී.අයි. ලෙනින් කීවේද මේ අර්ථයෙන්මය.

දෙමව්පියන් සෑම කෙනෙකුගේම බලාපොරොත්තුව තම දරුවන් නිරෝගී, උගත් පුරවැසියන් කිරීමය. ඔවුන්ට යහපත් අනාගතයක් උරුම කර දීමය. එහෙත් එම බලාපොරොත්තුව කොතෙක් නම් දුරට සාර්ථක කර ගැනීමට ලැබේදැයි යන්න ගැටලුවකි. මෙරට වෙසෙන බහුතරයක් පවුල් එදා වේල පිරිමසා ගන්නේ යන්තමින් කීවොත් නිවැරදිය. එවිට ප්‍රමුඛතාව දෙන්නේ සමබල ආහාර වේල වෙනුවට අඩුම වියදමකින් කුස පුරවා ගැනීමටය.

දිනෙන් දින ඉහළ යන ජීවන වියදම හමුවේ මෙරට ජනතාවගෙන් බහුතරයක් ජීවිත ගැටගසා ගැනීමේ විශාල අරගලයක යෙදී සිටිති. ලැබෙන වැටුප ජීවත් වීමට ප්‍රමාණවත් නොවේ යැයි හඬක් නොනැඟින වැඩපළක්, වැඩ බිමක් නොමැති තරම්ය. වතුකරයේත් ගම්බදවත් නාගරිකවත් වෙසෙන වැඩි දෙනෙකුගේ ජීවන මට්ටම එන්න එන්නම කඩා වැටෙමින් ඇත. එවැනි රටක වෙසෙන ළමා පරපුරේත් එම අනාගත පරපුර බිහි කරන මව්වරුන්ගෙත් කායික හා මානසික සෞඛ්‍යය යහපත් අයුරින් පවතින්නේ යැයි සිතීම මුලාවකි.

මෙරට ළමා ජනගහනය ලක්ෂ 54කට ආසන්නය. රජයේ සංඛ්‍යාලේඛනවලට අනුව වර්තමානයේ මෙරට ළමා ජනගහනයෙන් 52%ක් මන්දපෝෂණයෙන් පෙළෙයි. මෙය සුළුවෙන් තැකිය හැකි තත්වයක් නොවේ. ඒ, පෝෂණ ඌණතාවයෙන් පෙළෙන ළමුන්ගේ කායික හා මානසික සෞඛ්‍යයද යහපත් නොවන බැවිනි. මෙය රටේ අනාගත ශ්‍රම බලකායේ නිරෝගීකම පිළිබඳවද ප්‍රශ්නාර්ථයක් ඇති කරන්නකි.

මෙරට පැවතුණු හා පවතින ආණ්ඩු විසින් ජාත්‍යන්තර ළමා දිනය වෙනුවෙන් විශාල ලෙස මුදල් වියදම් කර ප්‍රදර්ශන තලයේ ව්‍යාපෘති දියත් කළා මිස ළමා පරපුරේ උන්නතිය වෙනුවෙන් ස්ථිරසාර වැඩපිළිවෙළක් ඉදිරිපත් කර නොමැත. මෙරට ළමා පරපුර මන්ද පෝෂණයෙන් ගලවා ගැනීම සඳහා දියත් කෙරුණු කෙටි කාලීන හෝ දීර්ඝ කාලීන වැඩපිළිවෙළක් නැත.

මැතිවරණ සමයේ සෑම ළමයෙකුටම කිරි වීදුරුවක්, සමබල ආහාර වේලක්, නිල ඇඳුම් වැනි ජනප්‍රිය විවිධ පොරොන්දු කරළියට ආවද ඒවා සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමට මෙතෙක් ආණ්ඩු සමත් වී නැත. යම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්නේ නම් එය කරනුයේ ඒ සඳහා වූ සැබෑ අරමුණින් නොව තම දේශපාලන බලය පවත්වා ගැනීමේ අරමුණ ඇතුවය. බොහෝ විට සිදුව ඇත්තේ ළමුන්ගේ පෝෂණය, සෞඛ්‍යය, අධ්‍යාපනය වැනි දේවල්වල වැඩි වගකීම දෙමාපියන් වෙත පවරා ආණ්ඩු හිමින් සීරුවේ වගකීමෙන් නිදහස් වීමය.

ඕනෑම රටක අනාගතය තීරණය වන්නේ එරට අනාගත පරම්පරාව මතය. රටක සංවර්ධනය රඳා පවතින්නේ නිරෝගී, සෞඛ්‍ය සම්පන්න ජනතාවක් මතය. එවැනි ජනතාවක් බලාපොරොත්තු විය හැක්කේ නිරෝගී ළමා පරපුරක් මගිනි. ලොව හොඳම දෑ හිමිවිය යුත්තේ දරුවන්ටය. මෙරට ඛේදවාචකය නම් එලෙස සිතන පාලනයක් හා පාලකයින් තෝරා පත්කර ගැනීමට අප රටේ ජනතාව මෙතෙක් අසමත් වීමය. මන්ද පෝෂණයෙන් පෙළෙන ළමා පරපුරද ඒ අසමත්භාවයේ එක් ප්‍රතිඵලයකි.

## ඉඩෝරය සිඳින සොඳුරු සැප්තැම්බරය...

උණුහුමින් ගැබ්බර
මහ පොළොව ඉරී තලන
නියඟයට පිටව යන්නට
අවසර අරන්...
බලන්:
සැප්තැම්බරය ඇවිදින්
මල් පිපෙන වසන්තය අරන්...

අවුරුද්ද පුරාවට
පිපාසිත දනනට...
නැවුම් දිය බිඳක් ඉස
සනසන්:
ඉතින් මේ
සැප්තැම්බරය මිස
සහිත මල් ඵල දරන
යහමින්...



## සිව්දෙසින්

### ලෝකයේ නරකම සරණාගත කඳවුර



ග්‍රීසියට අයත් ලෙස්බොස් දූපතේ පිහිටා ඇති 'මොරියා' කඳවුරේ නිරන්තරයෙන් ප්‍රචණ්ඩකාරී ක්‍රියා සිදුවන බව පැවසෙන අතර එහි සිටිය යුතු ප්‍රමාණයට වඩා විශාල පිරිසක් ජීවත් වන බවද වාර්තා වේ.

පුද්ගලයින් 2000කට ආසන්න පිරිසක් රැඳවිය හැකි මෙම කඳවුර තුළ මේ වනවිට 8000කට වැඩි ප්‍රමාණයක් ජීවත් වන බව පැවසේ.

මෙම කඳවුර ඉතා අපිරිසිදු තත්වයේ පවතින අතර වයස අවුරුදු 10ක් තරම් වූ කුඩා දරුවන් පවා සිය දිවි හානි කර ගැනීමට උත්සාහ දරා ඇත.

සරණාගතයින් වෙනත් ස්ථානයකට මාරු කර යවන තුරු තාවකාලික රැඳවුම් ස්ථානයක් ලෙස මෙම කඳවුර 2015දී පිහිටුවා ඇතත් සමහර පුද්ගලයෝ වසර ගණනාවක් මෙම ස්ථානයේ තවමත් ජීවත් වෙමින් සිටිති.

## දර ලිප නිසා ලංකාවේ කාන්තාවන්ට ලෙඩ



දර ලිප් හේතුවෙන් ඇතිවන ගෘහස්ථ වායු දූෂණයෙන් දුම්වැටි පානය නිසා ඇතිවන රෝගී තත්වයන්ට සමාන රෝග හා පෙනහළු පිළිකා ඇති වීමේ අවදානම ඉහළ ගොස් ඇති බව මහනුවර මහ රෝහලේ ශ්වසන රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙක් වන දුෂාන්ත මැදගෙදර පවසයි.

ඉහත කී අවදානමට වැඩි වශයෙන් මුහුණ දෙන්නේ ගෘහණියන් වන අතර එක් දර ලිපක් දැල්වීමෙන් හට ගන්නා දුම දුම්වැටි 75 - 150ත් අතර ප්‍රමාණයකින් නිකුත්වන දුමට සමාන බවද ඔහු පවසයි.

දර ලිප භාවිතා කරන කාන්තාවන්ට දුම්වැටි පානයෙන් ඇතිවන ක්ෂය රෝගය, පෙනහළු පිළිකා, ඇදුම හා පටක හානි සිදුවීමේ වැඩි අවදානමක් ඇතැයිද ඔහු පවසයි.

ඉතිහාසයේ කතාව... 01

# සැබෑ ඉතිහාසය සොයා...



සුනිල් එදිරිසිංහයන් ගයන ජනප්‍රිය ගීතයක මුල් පද කිහිපය මෙසේ වේ. 'මේ තරම් සියුමැලිද කළු ගල් සිතන්නටවත් බැරි නිසා - මම ගියා අවුකන බුදුන්ටත් දැස් දුන් මිනිසා සොයා' මෙම ගීය රචනා කළ නව පරපුරේ ගීත රචකයෙක් වූ රජීව් වසන්ත වෙල්ගම මේ පද මාලාව මගින් ඉතිහාසය සොයා අතීතයට යයි. ඔහු අපේ රටේ ඉතාමත් ප්‍රසිද්ධ අවුකන බුදු පිළිමය නෙළූ, අවුකන බුදුන්ටත් දැස් දුන් මිනිසා සොයා යයි. මෙහි විශේෂ කරුණක් තිබේ. පාසලේදී අපට උගන්වන ඉතිහාසයට අනුව නම් මෙසේ සොයා යාමට අවශ්‍ය නැත. ඒ, ඉතිහාසයේ සියලු විශාල නිර්මාණ කිසියම් හෝ රජ කෙනෙකුගේ නමට ලියා තිබෙන බැවිනි. එහෙත් මෙම ගීතයේ රචකයා එය නොසලකා අවුකන පිළිමයට දැස් දුන් මිනිසා සොයා, එනම් සැබෑ ඉතිහාසය සොයා යයි. ඒ ඇයි? නිල ඉතිහාසය තුළ සැබෑ නිර්මාණකරුවා සඟවා ඇති නිසාය. බොහෝ රටවල නිල ඉතිහාසය යනු යම් පමණක ප්‍රබන්ධයක් වන නිසාය.

මිනිස්සු සිය ඉතිහාසය දැන ගැනීමට කැමැත්තක් දක්වති. ඒ, එමගින් තමන්ගේම අතීතය දෙස බැලිය හැකි නිසාය. මිනිසාගේ සමාජීය ගමන්මග යනු අතීතයේ සිට වර්තමානය ඔස්සේ අනාගතය කරා දිවෙන අඛණ්ඩ ක්‍රියාදාමයකි. එම ක්‍රියාදාමයේ අතීතයට එක් වූ දේ එනම් ඉතිහාසය දැන ගැනීමට මිනිසා තුළ ස්වභාවයෙන්ම ඇති වූ රුචිකත්වයක් තිබෙන අතර ඉතිහාසය යනු එක් අර්ථයකින් අනාගතයට මඟපෙන්වන අත්දැකීම් සම්භාරයක්ද වේ.



"සත්‍යය කුමක්දැයි සොයා ගැනීම යනු කැමති කුමක්දැයි සොයා ගැනීම නම් නොවේ."

**ඇල්බෙයා කැමූ**

## ඉතිහාසය ව්‍යාජ ගොඩනැගීමක් වූ කල

ඉතිහාසය තුළ සත්‍යය ගැබ්වී තිබිය යුතු වුවත් බොහෝ විට ධනවාදී අධ්‍යාපනය තුළ මේ සත්‍යය වෙනුවට ව්‍යාජයන් හා ව්‍යාජ ප්‍රතිරූපයන් ගොඩනගා තිබේ. ඒ, පංතිමය වුවමනාවන් සඳහාය. එවිට ඉතිහාසය අනාගතයට සේවය කරනවා වෙනුවට අනාගතය ගොඩනැගීමට බාධාකාරී වේ. ඉතිහාසය ලියන අය බොහෝ විට කිසියම් පක්ෂපාතීකමක් සහිතව ලියන බව ප්‍රතික්ෂේප කළ නොහැක. එහිදී සමහර කරුණු විකෘති කිරීම්ද සමහර කරුණු නොසලකා හැරීමද, සමහර අතිශයෝක්තීන්ද සිදුවේ. එවිට ඉතිහාසය සත්‍ය කරුණු මත හා උපකල්පන මත ඉදිකරන ලද ව්‍යාජ දැනුමක් බවට පත්වේ.

ඉතිහාසය ගොඩනැගීමේදී අතීතයේ ඒ ඒ යුගවල විසූ අය ලියූ ඓතිහාසික ලිපි හා ලේඛන උපයෝගී කරගත්තාක් මෙන්ම, පුරාවිද්‍යාත්මක සාධක හා ජනශ්‍රැතිය තුළ වන විවිධ කතා උපයෝගී කර ගනී. ඉතිහාසය ගවේෂණය කිරීමේදී පැරණි ලේඛන (සෙල් ලිපි, මැටි පුවරු ආදී) වීර කාව්‍යයන් (මහා භාරතය, රාමායනය, ඔඩෙසි, ඉලියඩ් ආදී) හා ඓතිහාසික රචනා (මහාවංශය) උපයෝගී කරගැනීමට සිදුවේ. එසේම පුරාවිද්‍යාත්මක සාධක හා සාක්ෂිද වැදගත් වේ. මෙහිදී ඉතිහාසය නිවැරදිව ලිවීමේදී පුරාවිද්‍යාත්මක සාක්ෂි කිසියම් ප්‍රමාණයක නිවැරදි තොරතුරු ලබා දුන්නත් ඓතිහාසික ලේඛන බොහෝ විට වැරදි හා පක්ෂග්‍රාහී ඒවා වේ.

## නූතන ඇමෙරිකාව ගැන ලියන දේ

වර්තමානයේ ඇමෙරිකා එක්සත් ජනපදයේ ජීවත් වන එක්සත් ජනපදය අගයන කෙනෙක් එක්සත් ජනපදය ගැන ලියන විට ලියන්නේ කුමක්ද? ඔහුට අනුව එක්සත් ජනපදය ලොව තිබෙන ඉතාමත් ප්‍රජාතන්ත්‍රවාදී හා මානව හිමිකම් රකින රාජ්‍යයක් වේ. එය වර්තමානයේ දියුණුම පොහොසත්ම, බලවත්ම රට යයි ඔහු ලියනු ඇත. එහෙත් සත්‍යය කුමක්ද? එක්සත් ජනපදය ලොව ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදය අහිමි කරන, තම ආර්ථික, දේශපාලන හා යුදමය ආධිපත්‍ය අන් රටවල් මත මුදාහරින අධිරාජ්‍යවාදී රටකි. එබැවින් ඉහත ලියන පුද්ගලයාගේ විග්‍රහය පක්ෂපාතී එකකි. ඒ තුළ සත්‍යය නැත. මෙය එක්සත් ජනපදය ගැන නොව ඕනෑම රටකට පොදුය. එම රට තුළ සිට එම රටේ පවත්නා සමාජ ආර්ථික ක්‍රමය අනුමත කරන අය එම රට ගැන ලියනු ලබන්නේ එම රටට පක්ෂපාතීව මිස අපක්ෂපාතීව නොවේ.

## මහාවංශය හා ඉතිහාසය

ලංකාවේ ඉතිහාසය ඉගෙන ගැනීමේදීද මෙම ගැටලුව මතුවේ. ලංකාවේ ඉතිහාසය ඉගෙනීමේදී තිබෙන ප්‍රධාන මූලාශ්‍රය වන්නේ වංශ කථාය. ඉන් පැරණිම ලේඛනය මහා වංශයයි. එහෙත් මහා වංශය ලියූ මහා විහාර භික්ෂූන් එය ලියා ඇත්තේ අපක්ෂපාතීව නොවන බව දැන් පොදු පිළිගැනීම වේ. ලංකාවේ ඉතිහාසය තුළ කෘෂිකර්මාන්තය නගා සිටුවීමට විශාල මෙහෙයක් කළ මහසෙන් රජු නොසලකා ඇති මහාවංශය දුටුගැමුණු රජු වෙනුවෙන් මහා වංශයේ අඩකට කිට්ටු පරිච්ඡේද ප්‍රමාණයක් වෙන්කර තිබේ. ඊට හේතුව මහසෙන් රජු හා මහා විහාරය අතර තිබූ ගැටුමය. ඒ නිසා මහසෙන් රජු නොසලකා හැරීමත් දුටුගැමුණු රජු ගැන අතිශයෝක්තියෙන් වර්ණනා කිරීමත් මහාවංශය තුළ දැකිය හැක.

> මිනිස්සු සිය ඉතිහාසය දැන ගැනීමට කැමැත්තක් දක්වති. ඒ, එමගින් තමන්ගේම අතීතය දෙස බැලිය හැකි නිසාය. මිනිසාගේ සමාජීය ගමන්මග යනු අතීතයේ සිට වර්තමානය ඔස්සේ අනාගතය කරා දිවෙන අඛණ්ඩ ක්‍රියාදාමයකි. එම ක්‍රියාදාමයේ අතීතයට එක් වූ දේ එනම් ඉතිහාසය දැන ගැනීමට මිනිසා තුළ ස්වභාවයෙන්ම ඇති වූ රුචිකත්වයක් තිබෙන අතර ඉතිහාසය යනු එක් අර්ථයකින් අනාගතයට මඟපෙන්වන අත්දැකීම් සම්භාරයක්ද වේ.

අප මෙම කරුණු ආරම්භයේදීම සඳහන් කළේ ඉතිහාසය ඉතාම වැදගත් හා වටිනා විෂයක් වුවද ඒ තුළ බොහෝ විට ව්‍යාජයන් හා විකෘති කිරීම් පවතින බව පෙන්වා දීමටය. එබැවින් මිනිසාගේ ඉතිහාසය එනම් මානව ඉතිහාසය අධ්‍යයනය කිරීමේදී එය නිවැරදි විද්‍යාත්මක විධික්‍රමයක් අනුව අධ්‍යයනය කළ යුතුය. 'ඉතිහාසය' මිනිසුන්ට නිවැරදි මඟපෙන්වනවා වෙනුවට කුඩා දරුවන්ගේ සිට සිත් දූෂ්‍ය කරන්නේ නම් හා දැනුම මිත්‍යාවන්ගෙන් පුරවන්නේ නම් එය හොඳ දෙයක් නොවේ.

## වැරදි විධික්‍රම

ඉතිහාසය අධ්‍යයනය කිරීමේදී ධනවාදී ඉගැන්වීම් තුළ පවතින ප්‍රධාන වැරදි කිහිපයක් තිබේ. ඒවා කෙටියෙන් හඳුනා ගැනීම අපේ අධ්‍යයනය නිවැරදිව කර ගැනීමට පහසුවක් වේ. ධනපති ක්‍රමය තුළ ඉතිහාසය ඉගැන්වීමේදී ඇති ප්‍රධාන දුර්වලතා වන්නේ, i. ඉතිහාසය භෞතිකවාදී පදනමක් මත නොව විඥානවාදී පදනමක් මත ගොඩනැගීම ii. ඉතිහාසය යනු අහම්භීය හා එකිනෙකට සම්බන්ධයක් නැති සිදුවීම් දාමයක එකතුවක් සේ ඉදිරිපත් කිරීම iii. ඉතිහාසයේ සිදුවීම් යටින් තිබෙන එහි සැබෑ හේතු සැඟවීම හෝ නොසලකා හැරීම iv. ඉතිහාසය තුළ වැඩකරන මිනිසුන්ගේ දායකත්වය ඉවත් කොට එය රජුන්ගේ, වීරයන්ගේ ක්‍රියාවක් ලෙස හුවා දැක්වීම යන ඒවාය.

මේ නිසා ධනවාදය තුළ ඉතිහාසයේ පදනම එක්කෝ මුළුමනින්ම විඥානවාදීය; නැතිනම් එකම දේ යළි යළිත් සිදු වන පාරභෞතිකවාදීය. බොහෝ විට මේ දෙකම එකටද තිබේ. එමගින් ඉතිහාසයේ ගමන් මගේ ද්‍රව්‍යමය පදනමත් ඉතිහාසයේ සංවර්ධනයේ සැබෑ හේතුත් ඉතිහාසයේ සංවර්ධනයේ දයලෙක්තික සබඳතාවත් මිනිසාගේ ක්‍රියාකාරීත්වයත් සවිඥානිකවම නොසලකා හැර ඇත.

ධනේශ්වර ක්‍රමය තුළ ඉතිහාසය උගන්වන මෙම අවිද්‍යාත්මක ක්‍රමය සුප්‍රසිද්ධ මාක්ස්වාදී නාට්‍යකරුවෙක් වූ බර්ටෝල් බ්‍රෙෂ්ට් විසින්ද ප්‍රශ්න කරනු ලැබ තිබේ. බ්‍රෙෂ්ට් ලියූ 'කම්කරුවෙක් ඉතිහාසය කියවයි' නම් කවියේ ඔහු මෙය ප්‍රශ්න කරයි. එම කවියේ පද කිහිපයයක් මෙසේය...

'තරුණ ඇලෙක්සැන්ඩර් ඉන්දියාව ජය ගත්තේය

එවිට ඔහු සිටියේ තනිවමද?

සීසර් ගෝල්වරුන් අබිබැවීය

කෝකියෙක්වත් නොසිටියේද ඔහු සමඟ' ආදී ලෙසය. එම කවියේ අවසන ඔහු මෙසේ කියයි.

'හැම පිටුවකම ජයග්‍රහණයකි

ඒ ජයග්‍රාහකයන්ට ආහාර පිසුවේ කවුරුද?

හැම දශකයකටම වරක් මහා පුරුෂයෙකි

එහි වියදම දැරුවේ කවුද?

තොරතුරු රැසකි

ප්‍රශ්න රැසකි.

බ්‍රෙෂ්ඨ් අනුව ඉතිහාසය යනු තොරතුරු රැසකි. ඒ නිසා මතුවන ප්‍රශ්න රැසකි. එබැවින් මානව ඉතිහාසය වඩා නිවැරදි ක්‍රමයකට අප අධ්‍යයනය කළ යුතුය. එහිදී අපට මාක්ස්වාදය මඟපෙන්වනු ඇත. මාක්ස්වාදී දෘෂ්ටියට අනුව මානව ඉතිහාසය හා එහි ප්‍රධාන යුග කෙටියෙන් සාකච්ඡා කිරීම අදින් පටන්ගන්නා මෙම ලිපි මාලාවේ අරමුණය. ඒ සඳහා අප යළිත් මුණ ගැසෙමු.

# සෞන්දර්යාත්මක විනිවිදීමක යාත්‍රා කරන

# දහදිය සිත්තම

දහදිය සිත්තම කලා උළෙල වැඩකරන ජනතාව සඳහාම වෙන්වූ මෙරට එකම කලා උළෙලය. 2018 වර්ෂයේදී 12වැනි වරටත් දිගහැරීමට නියමිත එම කලා උළෙල මෙවර සුවිශේෂී වැදගත්කමකින් යුතුව සංවිධානය කිරීමට සමාජවාදී කම්කරු සංගමයට අනුබද්ධ ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය කටයුතු කරමින් සිටී. එහි සාහිත්‍ය අනුකමිටුවේ සභාපති චන්දන සූරියආරච්චි සහෝදරයා විසින් නියමුවා වෙත එවන ලද සටහනක් කාලීන වැදගත්කම සලකා මෙහි පළකරමු.



ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය හා සාහිත්‍ය අනු කමිටුව 2007 වර්ෂයේ සිට අඛණ්ඩව සිදු කරමින් ආ දහදිය සිත්තම වැඩ කරන ජනතා කලා උළෙල 12වැනි වරටත් 2018 වර්ෂයේදී පැවැත්වීමට නියමිතය. 'සියලු කලාවන්හි උල්පත වූ ශ්‍රමයේ උරුමය සොයා පියනගන සෞන්දර්යාත්මක විකල්ප වේදිකාව - දහදිය සිත්තම' යන්න තේමාව කර ගනිමින් ආරම්භ කළ මෙම සොඳුරු යාත්‍රාව ලාංකේය වැඩ කරන ජනතාව අතර හා වැඩ බිම් සිසාරා යමින් වැඩ කරන ජනයාගේම සිත්තමක් සිතුවම් කිරීමට පුරෝගාමී කාර්යයක් සිදුකරමින් සිටියි.

ජාතික වෘත්තීය මධ්‍යස්ථානය මේ රටේ වැඩ කරන ජනතාවගේ වෘත්තීය අයිතිවාසිකම් දිනා ගැනීම, ආරක්ෂා කරගැනීම වෙනුවෙන් අරගල කරන පුළුල්තම ව්‍යාපාරයයි. විවිධ සේවාවන් හා ශ්‍රේණීන් තුළ සිටින ජනතාවට ජීවත් වීමට සරිලන වැටුපක් ඇතුළු අයිතීන් දිනා ගැනීම වෙනුවෙන් ක්‍රියා කරමින් සිටී. වත්මන් ධනවාදය සිය පැවැත්මේ අර්බුදය විසඳා ගැනීම වෙනුවෙන් නග්න වූ සූරාකෑමට හා ම්ලේච්ඡත්වයට ගමන් කරමින් සිටී. ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය පවරා ගෙන සිටින්නේ, ජීවිතය විඳින්නට ඉඩ නොතබා විඳවන්නට ඉඩ තබා ඇති සමාජ ක්‍රමයක ගොදුර බවට පත්ව සිටින වැඩකරන ජනතාව ඇතුළු මුළු මහත් නිර්ධන පංතියම එයින් ගලවාගෙන යහපත් සමාජයකට ප්‍රවේශ කරවීමේ පුරෝගාමී කටයුත්තය.

මාසික වැටුපක් වෙනුවෙන් දවසේ පැය 8-12 ත් අතර කාලයක් ශ්‍රමය වගුරන ජනතාව ඒ වෙනුවෙන් වෙහෙස මහන්සි වනවා හැර වෙනත් කිසිදු සෞන්දර්යාත්මක අත්දැකීමක් රස විඳීමට තරම් ඉඩ කඩක් පවතින සමාජ ක්‍රමය විසින් ලබා දී නැත. ජීවත් වීමට වෙර දරන, පීඩාව, වේදනාව, අඹිහිරිකම ජීවිතය බවට පත්ව ඇති සාතිශය බහුතරයක් වූ ජනතාව තුළ සැඟව සිටින සෞන්දර්යාත්මක මිනිසා සොයා යමින් ඔහු අවදි කරන ජනතාවට උසස් වූ සංස්කෘතික ජීවිතයක් උරුමකර දීම සඳහා වූ පෙරමඟ සැකසීම දහදිය සිත්තම නම් සෞන්දර්යාත්මක ආගමනය තුළින් අප බලාපොරොත්තු වෙමු.

වෙළඳපොළ ධනවාදය තවදුරටත් එහි සූරාකෑම වේගවත් කරමින් ලෝක පරිමාණ අධිරාජ්‍යවාදී ඒකාධිකාරී ධනවාදය තුළ සැහැසි ලෙස වැඩ කරන ජනතාව සූරාකෑමට ගොදුරු කරද්දී ඊට එරෙහිව සටන් කිරීමටත්, වෘත්තීය අයිතීන් දිනාගැනීම වෙනුවෙන් වන මැදිහත්වීම අඛණ්ඩව කිරීමට අපට සිදු වනු ඇත. වැඩබිම තුළ සිටින කලාත්මක නිර්මාණ හැකියාවන් සහිත පිරිස් සඳහා වූ නිර්මාණකරණයේ වේදිකාවක් ගොඩනැගීමේ අරමුණින් ආරම්භ කළ දහදිය සිත්තම වැඩකරන ජනයාගේ නිර්මාණ ඇගයීමේ මේ වනවිට කාර්ය සැලකිය යුතු දුරක් අප පැමිණ ඇත.

ලංකාවේ වැඩකරන ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක එකම කලා සාහිත්‍ය උළෙල මෙය බව ඉතා පැහැදිලිය. ලොව පුරාද වැඩකරන ජනතාවම ඉලක්ක කරගනිමින් දියත් කරන කලා උළෙලක් දැන ගැනීමට නැත. වැඩකරන ජනතාවගේ ජීවන අරගලයේ අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණය වන අව්‍යාජ වූ හැඟීම් නිර්මාණයන් බවට පත් කිරීමට දහදිය සිත්තම ඔවුන්ට වේදිකාවක් වී හමාරය. 2007 වර්ෂයෙන් ආරම්භ වූ එම නිර්මාණ චාරිකාවේ එදා ආධුනික නිර්මාණකරුවන් වූ ඇතැමුන් අද ලංකාවේ කලා සාහිත්‍ය ක්ෂේත්‍රයේ සුවිශේෂී භූමිකාවන් නියෝජනය කරනුයේ තමන් දහදිය සිත්තමෙන් ලැබූ පන්නරයෙන් බව පවසද්දී සාහිත්‍ය කමිටුව ලෙස අප තුළ ඇති වන්නේ අප අරමුණු එල දරමින් තිබීමේ නිහතමානී ආඩම්බරයයි.

ගීත රචනා, කාව්‍ය රචනා, ඡායාරූප, කාටුන්, චිත්‍ර, කෙටි නාට්‍ය, ජංගම දුරකථන කෙටි චිත්‍රපට ආදී තරග අංශ රාශියක් ඔස්සේ නිර්මාණකරුවන් වාර්ෂිකව ඇගයීමට ලක්කරනු ලබයි. කලා උළෙලට සමාන්තරව දහදිය සිත්තම කෙටි නාට්‍ය උළෙල ලංකාවේ රාජ්‍ය මට්ටමේ කෙටි නාට්‍ය උළෙලවල්වලට අභියෝග යක් වෙමින් සෞන්දර්යාත්මක විකල්ප වේදිකාවක් ගොඩනැගෙමින් තිබීම සුවිශේෂී තත්වයකි.

වසර 12ක් පුරා මෙම කටයුත්ත අඛණ්ඩව ඉදිරියට ගෙන ඒමේදී අපේ රටේ ප්‍රගතිශීලී කලාකරුවන්ගෙන් ලැබුණු දායකත්වය අගය කළ යුතුය . රට තුළ සිදු කරන සාම්ප්‍රදායික නිල කලා සාහිත්‍ය උත්සවයන් අපි දැක ඇත්තෙමු. ජනතාවගේ බදු මුදලින් පවත්වන නිල රාජ්‍ය උත්සව වසරකට වරක් කලාකරුවන් ප්‍රමාණයකට සම්මාන ප්‍රදානයක් සිදු කර අවසන් කෙරේ. ඉන් ඔබ්බට රටේ ජනතාවට උසස් සංස්කෘතික රසවින්දනයක් ලබාදීම සඳහා වූ වැඩපිළිවෙළක් රජය සතුව නැත. රට පුරා සිටින වැඩකරන ජනතාව ඇතුළු සාමාන්‍ය ජනතාව ලබා දෙන ජනතා ආධාර තුළින් ශක්තිමත් වන දහදිය සිත්තම, ඇගයීමට පාත්‍ර වන නිර්මාණකරුවාට සම්මානයක් ප්‍රදානය කිරීමෙන් ඔබ්බට යමින් එම නිර්මාණ ජනගත කිරීමේ කාර්යයකද නියැළෙයි. ඒ හා යමින් මේ වන විට එම නිර්මාණකරුවන්ගේ කෙටි කතා සංග්‍රහයක්, කාව්‍ය සංග්‍රහයක් ඇතුළු නිර්මාණ කෘතීන් ලෙස පළ කිරීමට මේ වන විට සාහිත්‍ය අනුකමිටුව කටයුතු කර තිබේ.

මානව සමාජයේ ආරම්භයේ සිට කලාව නිෂ්පාදනයත් සමග එකට මිශ්‍ර වෙමින් ගොඩනැගුණකි. මුල්ම මිනිස් සමාජයේ මිනිසාගේ නිෂ්පාදන කාර්ය වූයේ තම සමූහයාට ආහාර සොයා ගැනීමය. සතුන් දඩයම් කිරීම සඳහා ප්‍රීති ඝෝෂා කරමින් සිදුකළ විවිධ අංග චලනයන් මෙන්ම ගල් ලෙන් තුළ සිටින විට ඔවුන් තමන් සතු අත්දැකීම් ලෙන් බිත්තිවල සිතුවම් ලෙස අඳින ලද්දේත් කලාවක් නිර්මාණය කරන අදිටනින් නොව නිෂ්පාදනය හා බැඳුණු මානව සමාජයේ අත්දැකීම්

> වෙළඳපොළ ධනවාදය විසින් නිර්වින්දනය කර ඇති මිනිසා යළි පියෙවි ලෝකයේ තබා මානව සබඳතාවලින් පිරිපුන්, මනුෂ්‍යත්වයක් සහිත දියුණු සමාජයක් ගොඩ නැගීම වෙනුවෙන් කලා සාහිත්‍ය නිර්මාණවලට කළ හැකි කාර්යභාරය අති මහත්ය.

අව්‍යාජ ලෙස ප්‍රතිනිර්මාණය කිරීමක් ලෙසය. පසුව වහල්, වැඩවසම් හා ධනේශ්වර සමාජය තුළ මිනිස් ශ්‍රමය විසින් ගොඩගනගන ලද නිර්මාණ දේපළ හිමියන් සතුවූ අතර ධනවාදය තුළදී ප්‍රාග්ධනයෙන් යැපෙන ඊට යට වූ සාම්ප්‍රදායික කලාවක් හා සම්මත කලාකරුවෙකු පන්ති සමාජය විසින් බිහි කරනු ලැබ ඇත. සියලු කලාවන්හි උල්පත වූ ශ්‍රමයේ හිමිකාරිත්වය වංචනික ලෙස සඟවා තැබීමට අධිපති පන්තියත් ඔවුන්ට සේවය කරන නිල කලාව සහ කලාකරුවනුත් කටයුතු කරමින් සිටී. එවන් වටපිටාවක ජනතාවාදී සෞන්දර්යාත්මක නිර්මාණ භාවිතයක් ගොඩනැගීම වෙනුවෙන් යම් කාර්යභාරයක් දහදිය සිත්තම නම් වූ විකල්ප වේදිකාව තුළින් අපි බලාපොරොත්තු වන්නෙමු. නූතන වෙළඳපොළ ධනවාදය විසින් මිනිසුන් පරාත්වාරෝපණයකට ලක් කර ඇත. ඔවුනට නිෂ්පාදනය සමග තිබුණු අධ්‍යාත්මීය සබඳතා ඒ මගින් අහිමි කර ඇත. මිනිසාට නිෂ්පාදනය සමග ප්‍රතිවිරෝධතාවයක් ජනිත කර ඇත. මිනිසා සමාජයෙන් පිටමන් කරනු ලැබ ඇත. මිනිසාට මිනිසා අහිමි වීමෙන් මහා ඛේදවාචකයකට මුළු මහත් සමාජයම මුහුණ දී ඇත. අහිමි කර ඇති මනුෂ්‍යත්වය යළි ගොඩනැගීම වෙනුවෙන් මානව සමාජයම සංවේදී කළ හැකි උසස් කලාවක් නිර්මාණය විය යුතුව ඇත්තේ මේ තත්වය තුළය.

කලාව සමාජය අවදි කළ හැකි මහා හඬක් වීමේ ගුණයක් කලාව සතුසේම ජනයා ඥානනය කළ හැකි සුවිශේෂී සෞන්දර්යාත්මක මධ්‍යයක් බවද, අවිවාදිතය. වෙළඳපොළ ධනවාදය විසින් නිර්වින්දනය කර ඇති මිනිසා යළි පියෙවි ලෝකයේ තබා මානව සබඳතාවලින් පිරිපුන්, මනුෂ්‍යත්වයක් සහිත දියුණු සමාජයක් ගොඩ නැගීම වෙනුවෙන් කලා සාහිත්‍ය නිර්මාණවලට කළ හැකි කාර්යභාරය අති මහත්ය. ජනතාව බාල රසවින්දනයකට ගොදුරු කර තම නිර්මාණ අලෙවිකර ගන්නා පිරිසක් හා ජනතාවට වඩා නිවැරදි සමාජ දෘෂ්ටියක් ලබා දෙනවා වෙනුව උරුමය, කරුමය, දෛවය, මිත්‍යාව, අවිද්‍යාව වපුරන නිර්මාණ සුලභ වී ඇත. ප්‍රකෘතියේ පවතින අනුභූතීන් මිනිස් මනස තුළ ප්‍රතිනිර්මාණය කිරීමේදී ඒ තුළ රසවින්දනය මෙන්ම රසිකයා තුළ බුද්ධිමය නිම් වළලු පුළුල් කිරීමේ හැකියාවක් කලා නිර්මාණයන් තුළ පැවතිය යුතුය.

මෙවර දහදිය සිත්තම කලා උළෙල දෙස් විදෙස් ප්‍රගතිශීලී කලාකරුවන්ගේද සහභාගිත්වය සහිතව ප්‍රදර්ශන කුටි, පොත් ප්‍රදර්ශන, සංවාද, සම්මන්ත්‍රණ, පොත් එළිදැක්වීම් ඇතුළු අංග රාශියකින් සමන්විත වේ. මෙම වර්ෂයේ ඔක්තෝම්බර් 26 හා 27 දෙදින පුරා බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනයේදී උළෙල පැවැත්වීමට කටයුතු යොදා ඇත. ඔක්තෝම්බර් 26 දින කෙටි නාට්‍ය උළෙලත් එදිනම ජංගම දුරකථන කෙටි චිත්‍රපට උළෙලත් ඔක්තෝම්බර් 27 දින පොත් එළිදැක්වීම්, සිංහල හා දෙමළ මාධ්‍යයෙන් කැඳවන ලද සියලු නිර්මාණවල ජයග්‍රාහී නිර්මාණකරුවන් ඇගයීම සහ සංස්කෘතික ප්‍රසංගය ඇතුළු කලා කටයුතු රාශියක් පැවැත්වීමට සූදානම්ය. ඒ සොඳුරු අත්දැකීම විඳගැනීමට එක් වන මෙන් මෙරට ලාංකේය වැඩ කරන ජනතාවටත්, පොදු මහත් ජනතාවටත් අපි ආරාධනා කරන්නෙමු.

නිෂ්පාදනය ශ්‍රමයේ ඵලයක් නම් නිෂ්පාදනය හා බැඳුණු කලාව ජීවත්වීම උදෙසා ශ්‍රමය වගුරන පංතිය සතු විය යුතුය. කලාවේ සැබෑ මූලයන් පීරමින් සමාජයේ පොදු යහපත හා සංවර්ධනයේ දිශාවට ගැළපෙන කලා සාහිත්‍ය භාවිතාවක් ලෝකයට මෙන්ට අප රටටද අවශ්‍යව ඇත. සම්මත නිල කලාවට එම කාර්ය ඉටු කළ නොහැක. ඒ සඳහා ජනතාවාදී පංති දෘෂ්ටියකින් පෝෂණය වූ විකල්ප කලා සාහිත්‍ය ධාරාවක් අවශ්‍යව ඇත. ඒ සඳහා වන විකල්ප වේදිකාවක් මෙන්ම ප්‍රගතිශීලී කලා සාහිත්‍ය නිර්මාණකරුවන් වෙනුවෙන් දෘෂ්ටිමය ආලෝකයක් සැපයීම සඳහා දහදිහ සිත්තම සාහිත්‍ය අනු කමිටුව උත්සාහ කරන්නනෙමු!

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2018 අගෝස්තු 07

# විපක්ෂ නායක ධුරය ගැන සංවාදය නිදහස් සන්ධානයේ අභ්‍යන්තර ප්‍රශ්නයක්

(විපක්ෂ නායක ධුරය පිළිබඳ අදහස් දැක්වීමට එක්වෙමින්)

## පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර දිසානායක සහෝදරයා

විපක්ෂ නායක තනතුර පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ අවස්ථා කීපයකදීම විවාද මතු වී තිබෙනවා. "මන්ත්‍රීවරු 42ක් ඉන්නවා, විපක්ෂ නායකකම අවශ්‍යයි" කියා එක වෙලාවකදී කිවුවා. නැවත අවස්ථාවකදී කිවුවා, "මන්ත්‍රීවරු 52ක් ඉන්නවා, විපක්ෂ නායකකම අවශ්‍යයි" කියා. "මන්ත්‍රීවරු 70ක් ඉන්නවා, විපක්ෂ නායකකම අවශ්‍යයි" කියා දැන් කියනවා. මේ අවස්ථා තුනේදීම සංඛ්‍යාත්මක වෙනසක් විතරයි සිදු වී තිබෙන්නේ. 42, 52, ක් වී තිබෙනවා. 52, 70ක් වී තිබෙනවාය කියා එතුමන්ලා කියනවා. හැබැයි මේ අවස්ථා තුනේදීම තීරණාත්මක ලෙස විය යුතු දේශපාලන, නෛතික වෙනස සිදු වී නැහැ. ඒ නෛතික වෙනස මේකයි. මේ පාර්ලිමේන්තුවේ ඇති වෙනතුරු සාකච්ඡා කරලා කිවුවා, "පක්ෂ හයක් තරග වැදිලා තිබෙනවා. ඒ පක්ෂ හයෙන් තමයි මේ පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් තේරී පත්වී තිබෙන්නේ" කියලා. දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් දැන් වෙනදාට වඩා වැඩියෙන් ඒ පක්ෂවල තිබෙන අනන්‍යතාව තහවුරු කොට තිබෙනවා.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ජාතික ආණ්ඩුවක් පිළිබඳව අර්ථ කථනය කරනකොට, ඒ ඒ පක්ෂවලට වෙනම අනන්‍යතාවක් ලබා දී තිබෙනවා. **දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඒ පක්ෂවලට ලබාදී ඇති අනන්‍යතාව අද මේ පාර්ලිමේන්තුව අත්හැරියොත්, විපක්ෂයේ ඉන්න මන්ත්‍රී කණ්ඩායමක් අරගෙන ඕනෑම මොහොතක ජාතික ආණ්ඩුවක් ගොඩනගා ගන්න පුළුවන්.** ඒ නිසා කණ්ඩායමක් අරගෙන ජාතික ආණ්ඩුවක් ගොඩනැගීම වළක්වන්නේ පක්ෂ පිළිබඳව නෛතික අනන්‍යතාවයි. මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ පක්ෂ හයයි. නෛතික අනන්‍යතාව ඒකයි.

ඒක අපි අත්හරිනවා නම්, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සංශෝධනය අනුව යම් පක්ෂ කිහිපයක් එකතු වෙලා ජාතික ආණ්ඩුවක් හදන්න කියන එකට, ඒ "පක්ෂ" කියලා කියන එකට



තිබෙන අනන්‍යතාව කුමක්ද? ඒ නිසා එය බරපතළ ව්‍යවස්ථාමය අර්බුදයක් නිර්මාණය කරනවා. දැන් විපක්ෂයේ සිටින සංඛ්‍යාව 23යි. අපි එය පිළිග න්නවා. මේක වෙනම අතැනට දෙකයි, මෙතැනට හයයි ඉන්න විපක්ෂයක් නොවෙයි. TNA එකේ 16දෙනෙක් ඉන්නවා. EPDP එකේ එක්කෙනෙක් ඉන්නවා. අපේ පක්ෂයේ 6 දෙනෙක් ඉන්නවා. ඒ විධියට අපි 23දෙනෙක් විපක්ෂයේ ඉන්නවා. අප ඉතා කුඩා විපක්ෂයක් බවත් අපි පිළිගන්නවා. සමහර වෙලාවට යම් යම් ක්‍රියාකාරකම් පිළිබඳව අපි එකඟ වෙන තැන්, එකඟ නොවන තැන් තිබෙනවා. අපි කුඩා විපක්ෂයක් නිසා තමයි පාර්ලිමේන්තුවේ කාලය බෙදීමේදී යම් තීරණයක් ගත්තේ.

> දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඒ පක්ෂවලට ලබාදී ඇති අනන්‍යතාව අද මේ පාර්ලිමේන්තුව අත්හැරියොත්, විපක්ෂයේ ඉන්න මන්ත්‍රී කණ්ඩායමක් අරගෙන ඕනෑම මොහොතක ජාතික ආණ්ඩුවක් ගොඩනගා ගන්න පුළුවන්.

සම්ප්‍රදායක් හැටියට විපක්ෂයට සියයට 60%ක් සහ ආණ්ඩු පක්ෂයට 40%ක් වශයෙන් තමයි මේ පාර්ලිමේන්තු විවාදවලදී කාලය බෙදුණේ. හැබැයි, අපි කුඩා විපක්ෂයක් නිසා, "අපිට ඉන්නේ 23දෙනායි. අපිට මේ කාලයෙන් සියයට 30ක් දෙන්න" කියා අපි කිවුවා. සියයට 70ක් ආණ්ඩුව ගත්තා. මතක තබා ගන්න, ආණ්ඩුව පැත්තට ලබා දී තිබෙන ඒ සියයට 70ක කාලය තමයි මෙතෙක් -අදත්- මේ නිසි පරිදි බෙදෙන්නේ. ආණ්ඩුවට ලබා දී තිබෙන සියයට 70ක කාලය ආණ්ඩුවේ කණ්ඩායම් අතර බෙදෙනවා. ආණ්ඩුවේ සිටින එක්සත් ජාතික පක්ෂය ඒ කාලය බෙදා ගන්නවා. එක්සත් ජනතා නිදහස් සන්ධානය බෙදා ගන්නවා.

ඊළඟ කාරණය මේකයි. පක්ෂ නායකයන් හැටියට අවස්ථාවක් ලැබෙන්නේ සැබැවින්ම හයදෙනෙකුටයි. හැබැයි, එසේ හයදෙනෙකු සිටියදී දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාට පක්ෂ නායකයෙක් හැටියට පිළිගැනීමක් ලැබුණේ කෙසේද? ඒකත් අපි ඉතිහාසයෙන් කාරණා අරගෙන මතක් කරන්න ඕනෑ. ඒ, ඔහු වෙනම පක්ෂයක අනන්‍යතාවක් සහිත නායකයෙක් නිසා නොවෙයි. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මේ පාර්ලිමේන්තුවේ පක්ෂ නායකයා නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමා කියා තමයි, පක්ෂ නායක රැස්වීමේදී කිවුවේ. එතුමා කිවුවා, "නැහැ, පක්ෂ නායකත්වයේ ඒ කාර්ය භාරය එතුමා වෙනුවට දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීවරයාට ලබා දෙන්න" කියා. ඒ නිසා වෙනම නායකයෙක්, පක්ෂ නායකයෙක් ලෙස දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීවරයාට මේ අවස්ථාව ලැබී තිබෙන්නේ "ඒකාබද්ධ විපක්ෂය" යයි කියන බෝඩ් ලෑල්ලේ පදනම මත නොවෙයි. එක්සත් ජනතා නිදහස් සන්ධානය කියන පක්ෂයට ලැබුණු, නිමල් සිරිපාල ද සිල්වා මහතාට හිමි යැයි ඔහු කියූ එම තනතුර ඔවුන්ගේ පක්ෂයේ අභ්‍යන්තර ප්‍රශ්නයක් නිසා දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාට පවරා තිබෙනවා. ඒක ඔවුන්ගේ පක්ෂයේ අභ්‍යන්තර එකඟතාවක්. අපි ඒ ගැන ප්‍රශ්න කරන්නේ නැහැ. "එයා නොවෙයි, වෙන කෙනෙක් ඕනෑ" කියා හෙට කවුරු හෝ කියනවා නම්, අපි ප්‍රශ්න කරන්නේ නැහැ. ඒක ඒ ගොල්ලන්ගේ අභ්‍යන්තර ප්‍රශ්නයක්.

දිනේෂ් ගුණවර්ධන මහත්මයාට මේක ලැබුණා වගේම තමයි, එක්සත් ජනතා නිදහස් සන්ධානයට පක්ෂ නායකයෙක් හැටියට මේකේ අවස්ථාවක් තිබෙනවා. ඔවුන් තීරණය කළා, ඒක දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීවරයාට ලබා දෙන්න. ඒ නිසා එක්සත් ජනතා නිදහස

15වැනි පිටුවට

2018 අගෝස්තු 07

# රට බිලි දිය යුතු නැහැ වාගේම ඒකට මුවා වෙලා තක්කඩින් ආරක්ෂා කළ යුතුත් නැහැ

(සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට එක්වෙමින්)

## පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක සහෝදරයා

මේ පනත් කෙටුම්පත තුළ අඩංගු කරුණු කාරණාවලටත් වඩා, ඒ හා බැඳුණු සහ ඒ අවට තිබෙන දේශපාලනය සම්බන්ධව තමයි අද වැඩිපුර සංවාදයට ලක්වෙලා තිබෙන්නේ.

ජනතා විමුක්ති පෙරමුණ විධියට අපි මේකේ දෙපැත්තක් දකිනවා. පළමුවැනි කාරණය මේකයි. අපි දන්නා තරමින් පොදුවේ ඔය ජාත්‍යන්තරය කියා හඳුන්වන රටවල් 14ක් තිබෙනවා. ජාත්‍යන්තරය; ජාත්‍යන්තරය කියා කිවුවාට ඒකට මාලදිවයින අයිතියක් නැහැ; තායිලන්තය අයිතිත් නැහැ; මැලේසියාව අයිතිත් නැහැ; ඉන්දුනීසියාව අයිතිත් නැහැ; ඔය ජාත්‍යන්තරය කියා කියන්නේ, ලෝකයේ අධිරාජ්‍යවාදී දේශපාලනය කරන රටවල් 14කට විතර තමයි. ඒ රටවල් තමයි තමන්ට වඩා කුඩා හෝ තමන්ට වඩා යුද බලයෙන් අඩු රටවල් දේශපාලන වශයෙන් යටත් කරගන්න, දේශපාලන වශයෙන් මෙල්ල කරන්න මේ නීති සහ ආර්ථිකමය වශයෙන් විවිධ දේවල් පාවිච්චි කරන්නේ. එතැනදී අපි දකින දෙය තමයි, රටක් ලෙස අපි දේශපාලන වශයෙන් බටහිර ගැතිකම, නැත්නම් රටේ ස්වෛරීත්වය ගැන හැඟීමක් නැතිකම විසින් මේ දේවල්වලට එකඟ වීම.

දැන් තිබෙන ප්‍රශ්නය මෙයයි. විශේෂයෙන්ම මෙය නිශ්චිතව ගත්තොත්, හමුදා නිලධාරීන්ට අදාළයි. මා දන්නා තරමින්, තමන්ගේ උසාවියකින් වරෙන්තුවක් නිකුත් කළාය. තමන්ගේ රටේදි මෙහෙම දෙයක් කළාය කියා ලෝකයේ කොහේ හෝ රටකට ලංකාවේ ඉන්න පුද්ගලයෙකු හෝ, ලංකාවට වෙන කොහේ හෝ රටක ඉන්න පුද්ගලයෙකු හෝ එහෙම උස්සාගෙන යන්න පුළුවන්කමක් නැහැ.

නමුත් ඒකේ තව පැත්තක් තිබෙනවා. ඒකේ අනික් පැත්ත අපේ රටේ යුද අපරාධකාරයන් ආරක්ෂා කරන්න ඕනෑද? යුද හමුදා පනතක් තිබෙනවා, නාවික හමුදා පනතක් තිබෙනවා. ගුවන් හමුදා පනතක් තිබෙනවා. හිටපු හමුදාපතිවරු හැම කෙනෙකුම කියා තිබෙනවා මා දැක්කා, "හමුදාවකට විනයක් තිබෙනවා" ය කියා. විනයක් තිබෙන්න ඕනෑය කියන එක එන්නේ පනත තුළිනුයි. ඒ පනත අනුව හමුදා සොල්දාදුවන් හෝ



හමුදා නිලධාරීන් හෝ මේ රටේදි කරපු වැරැදිවලට වැරැදිකරුවන් වෙන්නේත් නැහැ. ඔවුන් වෙන රටකදී වැරැදිකරුවන් කරන්නත් බැහැ. නමුත් අද වෙලා තිබෙන දේ මේකයි. මා මේ කාරණය විශේෂයෙන්ම වගකීමෙන් යුතුව කියනවා. යුද්ධයකදී හමුදාවේ යම් යම් පුද්ගලයන්ගෙන් අපරාධ සිදු වෙනවා. යුද්ධය පොදු අපරාධයක්. හැම යුද්ධයක් තුළදීම යුද අපරාධ සිදුවන බව අපි කවුරුත් දන්නවා. එහෙම යුද අපරාධ සිදු වෙන්නේ නැහැයි කියා කියනවා නම් ඒක මෝඩ කථාවක්. ඒක පැහැදිලිවම අසත්‍යයක්.

නමුත් මා නිශ්චිත කරුණක් දන්නවා. 2000 අවුරුද්දේදී හමුදා සොල්දාදුවෙක් අවුරුදු හයක, අවුරුදු අටක පමණ වත්තේ වැඩ කරමින් හිටපු සාමාන්‍ය දරුවන් හය දෙනෙකුගේ බෙල්ල කපලා මරලා ළිඳකට දමා තිබුණා. ඊට පස්සේ ඒ හමුදා සොල්දාදුවා යාපනය වාචාකච්චේරි මහේස්ත්‍රාත් අධිකරණයෙන් වැරැදිකරු බවට තීන්දු කළා. ඒකට අභියාචනා ඉදිරිපත් කර, කොළඹ

> 2009 යුද්ධය අවසන් වුණාට පස්සේ සිංහල, දෙමළ දෙගොල්ලන්ගේම දරුවන් පැහැර ගන්නවා. සමහර අයට නම් දරුවන් වෙන්නේ සිංහල දරුවන් විතරයිනේ. අපට නම් එහෙම ප්‍රශ්නයක් නැහැ. මේ රටේ ඕනෑම දරුවෙක් අපට නම් අපේ දරුවෙක්.

මහාධිකරණයෙන් ඔහු වැරැදිකරු බවට තීන්දු කළා. මෑතකදී ඔහුට මහාධිකරණයකින්ද මරණ දඬුවම ලබා දුන්නා.

ඔහුට අවුරුදු 16කට විතර පස්සේ තමයි මරණ දඬුවම ලැබුණේ. හැබැයි, ඒ සිද්ධීන් 2000 වුණු දේවල්. එතකොට ඒවා යුද්ධයට හෝ යුද මෙහෙයුම්වලට ඒ මොනවාටවත් අදාළ නැහැ. නමුත් ඊට පස්සේ ඒ පුද්ගලයා යුද විරුවෙක් කරනවා. ඒ 2009ට කලින්.

දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? **2009 යුද්ධය අවසන් වුණාට පස්සේ සිංහල, දෙමළ දෙගොල්ලන්ගේම දරුවන් පැහැර ගන්නවා. සමහර අයට නම් දරුවන් වෙන්නේ සිංහල දරුවන් විතරයිනේ. අපට නම් එහෙම ප්‍රශ්නයක් නැහැ. මේ රටේ ඕනෑම දරුවෙක් අපට නම් අපේ දරුවෙක්.** අපි දන්නවා. නාවික හමුදාවේ සමහර ලොක්කෝ කප්පම් ගන්න දරුවන් පැහැරගෙන ගිය බව. ඒවා නිශ්චිතව ඔප්පු වුණු කරුණු. යුද්ධයට කිසිම සම්බන්ධයක් නැහැ. ඒ නිසා අපි මෙන්න මේක හරි සීරු මාරුවෙන් තෝරා ගන්න ඕනෑ.

මේ පනත් කෙටුම්පත හරහා එක පැත්තකින් ලංකාවේ දේශපාලනඥයින්, ආරක්ෂක අංශ හෝ රජයේ වෙනත් නිලධාරියෙකු විදේශීය අධිරාජ්‍යවාදී අරමුණු සහිත රටවලට බිලි දීමට ජනතා විමුක්ති පෙරමුණ වශයෙන් අපි විරුද්ධයි. හැබැයි, ඒ පොදු අදහසට, පොදු තිරයට මුවාවෙලා විශේෂයෙන් යුද්ධය තුළත්, යුද්ධයෙන් පසුවත් රටේ නීතියටත් හමුදාවේ නීතියටත් එහාට ගිහිල්ලා කටයුතු කරපු විවිධ පුද්ගලයන්, දේශපාලඥයන්, රජයේ නිලධාරීන් සිටිනවා. ඒ අය සම්බන්ධව අපේ ලංකාව ඇතුළත අනිවාර්යයෙන්ම නීතිමය, අධිකරණ ක්‍රියාවලියක් යා යුතුයි.

හමුදාවේ නම කැත වෙන්නේ විශේෂයෙන් යුද්ධයෙන් පස්සේ හොරකම් කර, රාජ්‍ය දේපොළ වංචා කරපු පුද්ගලයන් ආරක්ෂා කර ගත්තොත් තමයි. ඒ නිසා ජනතා විමුක්ති පෙරමුණ විධියට අපට මේ ආණ්ඩුවේ තිබෙන අධිරාජ්‍යවාදී ගැතිකම සමග මේ පනත් කෙටුම්පතට සහයෝග යක් ලබා දෙන්න බැහැ. නමුත්, මේ දෙපැත්ත ගැනම අපි අවධාරණය කරනවා. දකිනවා. එක පැත්තකින් රට බිලි දෙන්න අවශ්‍ය නැහැ වාගේම ඒ, "රට බිලි දෙන්න අවශ්‍ය නැහැ." කියන එකට මුවා වෙලා හොරු සහ තක්කඩි පුද්ගලයින් ආරක්ෂා වෙන්නත් ඕනෑ නැහැයි කියන එකයි අපේ ස්ථාවරය වෙන්නේ.

කවුළුව හැර තබමි

# නව ගමනක ඇරඹුම



පසුගියදා ජ.වි.පෙ. අලුත් වැඩකට අතගැසුවේය. ඒ අලුත් ගමනක් ඇරඹීම සඳහාය. රටේ බුද්ධිමතුන්, විද්වතුන්, කලාකරුවන්, පූජක පක්ෂය, වෘත්තීයවේදීන්, වෘත්තීය සමිති නායකයින් ඇතුළු විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් නව බහුජන පෙරමුණක් ජ.වි.පෙ. නායකත්වයෙන් පසුගියදා ගොඩනගන ලදී. රටේ කඩා වනසා දමා ඇති විවිධ ක්ෂේත්‍ර ගොඩනගන වැඩපිළිවෙළක්ද සැකසීමට එදින ඒ ඒ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමැති අයවලුන්ට පවරන ලදී. දැන් වේගයෙන් එම වැඩපිළිවෙළ සකස් කෙරෙමින් තිබේ. වසර 70 ක් තිස්සේ සෙක්කුව වටා කැරකෙමින් සිටි ජනයා එම සෙක්කු ගමනින් මුදාගෙන රට ගොඩනගන නව මාවතකට කැඳවාගෙන යෑම එහි මූලික අරමුණ වී ඇත. මුහුණු සහ පා මාරුකරන දේශපාලනය වෙනුවට විප්ලවීය සහ ඇත්ත වෙනස් දේශපාලන මාවතක රටේ ජනයා කැඳවාගෙන යාමෙන් මිස මේ නාරාවලෙන් ගොඩයාමක් නැත. ඒ ගමන් මග තෝරා ගැනීම රටේ ජනයාගේ වගකීමය. එම වගකීම නොගන්නා මිනිසුන් මේ නාරා වලේම නැසී වැනසී යනු නොඅනුමානය.

# මම දන්නෙ නෑ... මට මතක නෑ! කවුරුද මේ ළමයා



දේවල් අමතකවීම මේ රටේ බොහෝ දෙනාට වැළඳී ඇති කරුමක්කාර රෝගයකි. ඊයේ සිදු වූ දෙය අද අමතක කරන රටක ජනයා හඳුන්වන්නේ කෙසේදැයි අපි නොදනිමු.

මේ රටේ පාලකයින්ට නම් මේ මාරක රෝගය වැළඳී බොහෝ කල්ය. මාධ්‍යවේදී කීත් නොයාර් පැහැරගෙන ගොස් පහර දුන්නේ මහින්දගේ ආණ්ඩුව තිබෙන විටය. ඔහුව මුදාහරින නියෝගය දී ඇත්තේද මහින්දය. ඒ ගැන ප්‍රශ්න කිරීම සඳහා මේ ඊයේ පෙරේදා මහින්දව සී.අයි.ඩී. යට කැඳවන ලදී. සිද්ධිය ගැන ප්‍රශ්න කරන විට මහින්ද අපූරු උත්තරයක් දුන්නේය. 'මට ඒ ගැන මතක නෑ. කීත් නොයා කියන කෙනෙක්ව මම දන්නෙත් නෑ' කියාය. මෙසේ කියන්නේ හිටපු රාජ්‍ය නායකයාය. මේ සිද්ධියෙන් මහින්දගේ පෞරුෂය බිංදුවට වැටුණේය. එය රටට නම් නරක නැත. එය හොඳය. ළඟ දේවල් අමතකවීම මහලුවියට යන අයට වැළඳෙන රෝගයකි. මහින්ද සීයාටද වැළඳී ඇත්තේ එය දැයි අපි නොදනිමු. එකක් කිව යුතුය. මහින්දලාට දේවල් අමතක වුවද මහින්දලා කළ කී දේවල් රටේ හිතන මතන ජනයා නම් කිසිදා අමතක නොකරනු ඇත.

# සාහිත්‍යයක් නැති රටක සාහිත්‍ය මාසය




මේ සාහිත්‍ය මාසයයි. සුපුරුදු පරිදි ආණ්ඩුව පොත් ප්‍රදර්ශන හා තෑගි උළෙලවල් සංවිධානය කරනු ඇත. ඒවාට ඇදී එන මිනිසුස් පොත් බලා ළඟ තියෙන ස්ටෝල් එකකින් ෂෝට් ඊට්ස් කා කූල් ඩ්‍රින්ක්ස් බී යනු ඇත. පොත් කියවීමක් නැති රටේ පොත් සීමා වී ඇත්තේ ප්‍රදර්ශනයටය. සත්තු වත්තට ගොස් සත්තු බලා එනවා සේ මිනිස්සු විවිධ වර්ගයේ පොත් නරඹා ආපසු සුපුරුදු දිවියට පියමං කරනු ඇත. මේ රටේ බොහෝ අය සාහිත්‍ය මාසයේ පවත්වන උත්සව ඇඳුම් විලාසිතා ප්‍රදර්ශනය කිරීමටත්, විනෝදය සඳහා එහෙ මෙහෙ සැරිසැරීමටත් පාවිච්චි කරගෙන ඇත. වෙළෙන්දෝ තම ගතමනාව කපා ගන්නවා ඇත. වින්දනයක් නැත. අවසානයේ ඇත්තේ විඳවීම පමණය. උපන්දා සිට මැරෙන තුරු විඳවීමට සලස්වා ඇති රටක සෞන්දර්යාත්මක හා ජනමනස අවදිකරන දෑ මිනිසුන්ගේ ජීවිත අහලකටවත් ළංකර ගන්නේ නැත. රටේ හිස් මිනිසුන් වැඩිවන තරමට පාලකයන්ට ඕනෑම පිස්සුවක් කරගෙන යහතින් සිටිය හැක. සාහිත්‍ය මාසයද ගෙවී යනු ඇත්තේ එලෙසය. අනේ අපි කවදාක හිනැහෙමුද ඒ රටේ!

# අඳුරු දශකය තුළ යුක්තිය ඉටු නොවූ ඝාතන ගැන ජ.වි.පෙ. ප්‍රශ්න කරයි



**ජ.වි.පෙ. පාර්ලිමේන්තු කණ්ඩායම් නායක අනුර දිසානායක සහෝදරයා පසුගිය 23වැනි දින පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27/2 යටතේ ප්‍රශ්නයක් නගමින් චන්ද්‍රදාස නයිදුවාවඩු සහ නන්දන බාලගේ සහෝදරවරුන්ගේ ඝාතන සම්බන්ධ පරීක්ෂණ කටයුතුවල වත්මන් තත්වය ආණ්ඩුවෙන් විමසා සිටියේය. එම ප්‍රශ්නය සම්පූර්ණයෙන් මෙසේය.**

චන්ද්‍රදාස නයිදුවාවඩු සහ නන්දන බාලගේ යන ජවිපෙ ක්‍රියාකාරීන් ඝාතනයට ලක්වීම සම්බන්ධ පරීක්ෂණ යටපත්වීම හා නීතිය ක්‍රියාත්මක වීම ප්‍රමාදවීම හේතුවෙන් මතුවී ඇති ගැටලුකාරී තත්වය පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරන්නට බලාපොරොත්තු වනවා.

පසුගිය අඳුරු දශකය තුළ සිදුවූ දේශපාලන ඝාතන සම්බන්ධව පරීක්ෂණ කටයුතු යටපත් වී තිබීම හා නීතිය ක්‍රියාත්මක වීම ප්‍රමාද වීම පොදු තත්වයක් වී තිබුණා. එහෙත් වත්මන් පාලනය බලයට පත්වී වසර තුනක් ගතවූවද වසර දහයකට ආසන්න කාලයකට පෙර සිදුවූ එම දේශපාලන ඝාතන ද්විත්වයට අදාළ සාධාරණය මෙතෙක් ඉටු වී නොතිබීම කණගාටුදායක තත්වයක්.

2009 වසරේ අප්‍රේල් 25වැනි දින පැවැත්වීමට නියමිතව තිබූ බස්නාහිර පළාත් සභා මැතිවරණයේ ප්‍රචාරක කටයුතු අතරතුර අප්‍රේල් 05වැනි දින නන්දන බාලගේ නම් ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාධරයා ගම්පහ වේයන්ගොඩදී වෙඩි පහරකට ලක්ව මිය ගියා. මෙම ඝාතනයේ සැකකරුවන් එවකට ආණ්ඩුවේ ආධාරකරුවන් වූ අතර ඔවුන් අත්අඩංගුවට පත් නොවී සිටීමට හා නීතියෙන් බේරී සිටීමට එම බලය යොදා ගෙන තිබුණා. කෙසේ වුවද පසුව ඇතිවූ සමාජීය බලපෑම හමුවේ ඝාතකයන් සම්බන්ධ පරීක්ෂණ ආරම්භ වුවද නීතිය ක්‍රියාත්මක වීම ප්‍රමාණවත් පරිදි ඉදිරියට ගියේ නැහැ. අපරාධකරුවන්ට අදටද නීතියෙන් දඬුවම් නොලබා නිදැල්ලේ පසුවනවා.

අනෙක් සිදුවීම වන්නේ 2010 ජනාධිපතිවරණ සමයේ මැතිවරණ ප්‍රචාරක කටයුතුවල නිරත වී සිටි ජ.වි.පෙ. නාගරික මන්ත්‍රී චන්ද්‍රදාස නයිදුවාවඩු සහෝදරයා, ජනවාරි 25වැනි දින එවකට ආණ්ඩුවේ ආධාරකරුවන්ගේ පහරදීමකින් තුවාල ලැබ රෝහල් ගතව සිටියෙදී 2010 පෙබරවාරි 02වැනි දින මිය ගියා. මෙම පහරදීමේ සිදුවීමේදී තවත් දෙදෙනෙක් තුවාල ලබා තිබුණා. මෙම පිරිසට දරුණු ලෙස පහරදී තිබුණද අම්බලන්ගොඩ පොලීසිය විසින් මැරයින්ට එරෙහිව කිසිදු පියවරක් ගෙන නොතිබුණේ ඔවුන් ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ ප්‍රබල ආධාරකරුවන් වූ නිසයි. එසේම නයිදුවාවඩු සහෝදරයාට මරණ තර්ජන එල්ල කිරීම පිළිබඳව ජනවාරි 14වැනි දින EIB 52/37 යටතේ කර තිබූ පැමිණිල්ල පිළිබඳවද පොලීසියෙන් පරීක්ෂණ සිදුව තිබුණේ නැහැ. ඇසින් දුටු සාක්ෂි සහිත මෙම පහරදීම හා ඝාතනයට අදාළ බලපිටිය අධිකරණයේ නීතිමය කටයුතු හදිසියේ යටපත් වුණා.

මේ අනුව අඳුරු දශකය තුළ යුක්තිය ඉටු නොවූ ඝාතන ගණනාවක් අතර මෙම ඝාතනයන් ද්විත්වයද පවතිනවා. ආණ්ඩුවල බලය යොදා ගෙන නීතිය අවභාවිතයේ යොදමින් මෙම ඝාතනයන් යටපත් කර ඇති බව පැහැදිලියි.

මේ තත්වය තුළ පැන නගින පහත ගැටලුවලට පිළිතුරු අදාළ අමාත්‍යවරයා විසින් සභාව හමුවේ තබනු ඇතැයි අපේක්ෂා කරනවා.

1. චන්ද්‍රදාස නයිදුවාවඩු සහ නන්දන බාලගේ ඝාතන සම්බන්ධ නීතිමය කටයුතු අතරමඟ නතරවී තිබීමට හේතු මොනවාද?

2. එම ඝාතන සම්බන්ධ පරීක්ෂණ හා නීතිමය කටයුතු නිසි ලෙස සිදුවී නොමැතිනම් නැවත විධිමත්ව ආරම්භ කළ නොහැකිද?

3. මෙම ඝාතන සම්බන්ධ වරදකරුවන්ට නීතිය හමුවේ දඬුවම් පැමිණවීමට හා මෙම දේශපාලන ඝාතන හේතුවෙන් පීඩාවට පත් පවුල්වලට වන්දි ගෙවීමට පියවර ගන්නේද?

## ජනතාව, ජනතාවගේ...

03 පිටුවෙන්



අවුරුදු දෙක-තුන කාලය තුළදී මෛත්‍රීපාල ජනාධිපතිවරයාත්, රනිල් වික්‍රමසිංහ අගමැතිවරයාත් පෙන්නුම් කර සිටියා කිසිසේත්ම ජනවාරි 08 ජනතා අපේක්ෂාවන් 1%කින්වත් ඉටුකිරීමේ දිශාවට යැමට වුවමනාවක්, හැකියාවක් ඔවුන්ට නැති බව. වර්තමාන ධනේශ්වර උගතුන්, වාමාංශික ප්‍රගතිශීලී බුද්ධිමතුන් ජ.වි.පෙ.ත් සමග මේ ක්‍රියාවලිය ආරම්භ කරන්නේ ජනවාරි 08 ජන අරමුණු මේ පාලක කණ්ඩායම තීරණාත්මකව පාවාදීමත් සමගයි. ඊට පෙර සිටම ජ.වි.පෙ. සමග සැලකිය යුතු වෘත්තික, බුද්ධිමතුන් ප්‍රමාණයක් සිටියත් මේක පැහැදිලි ගුණාත්මක වෙනසක් බවට පත්වෙනවා.

***නියමුවා:- වැඩපිළිවෙළ සකස් කිරීමේදී විද්වතුන් බුද්ධිමතුන් සමග ජ.වි.පෙ. අත්දැකීම් හා ප්‍රගතිය ගැන කිවුවොත්...***

***බිමල් රත්නායක සහෝදරයා:-*** වර්තමානයේ ජනතා විමුක්ති පෙරමුණත් එක්ක එකතුවෙලා ඉන්න මේ උගත් විද්වත් පිරිස ප්‍රමාණාත්මකව බැලුවොත් දහස ඉක්මවනවා. එකක් පැහැදිලියි. මේක ලංකා ඉතිහාසයේ ඉතාම විශේෂ දෙයක්. මම හිතනවා 1948න් පස්සේ ස්වාධීන පක්ෂගත නොවූ නමුත් වාමාංශික ප්‍රගතිශීලී ප්‍රජාතන්ත්‍රවාදය පිළිගන්නා සහ ඒ වෙනුවෙන් ස්වේච්ඡාවෙන් ක්‍රියාකාරී වෙන, ආණ්ඩුවක් හදාගත්තට පස්සේ යම්කිසි පක්ෂයක් ඒකෙ තනතුරු ගැනීමේ අපේක්ෂාවකින් තොරව මැදිහත් වුණු පළමු පිරිසක් විදිහට තමයි බුද්ධිමතුන් මේ ක්‍රියාකාරීත්වයට ඇවිල්ලා තියෙන්නේ. මේ වන විට අවුරුදු 3ක් පමණ කාලයක් ජනතා විමුක්ති පෙරමුණ මේ විද්වත් කණ්ඩායම් සමග විවිධ ප්‍රශ්නවලදි එකට වැඩ කරල තිබෙනවා. බොහෝ එකඟතාවයන් සහිත සහ එකඟ නොවෙන ස්ථානවලදිත් ඒ වෙනස්කම් තබාගෙන එකට වැඩ කරන්නෙ කෙසේද කියන එක අපි දෙපාර්ශ්වයම ඉගෙන ගෙන තිබෙනවා.

ඒ අනුව තමයි මෙම විද්වත් කණ්ඩායම සහ ජ.වි.පෙ. පසුගිය මාස කීපයකට කලින් ජාතික විද්වත් සංවිධානය පිහිටුවා, එහි ජාතික මහ සමුළුව පවත්වා එයින් රටට උචිත, රට ගොඩනගන ප්‍රතිපත්ති මාලාවක් සකස් කරන්න තීන්දුවකට එන්නෙ. ඒ වගේම මේ රට ගොඩනඟන ප්‍රතිපත්ති මාලාව ගැනත් යම්කිසි මාක්ස් ලෙනින්වාදී විග්‍රහයකට අපි යා යුතුයි. අපි දන්නවා රටක් ගොඩනැඟීමට තිබෙන්නේ ප්‍රධාන වශයෙන් තිබෙන්නේ සමාජවාදී මාවත නැතිනම් ධනවාදී මාවතයි. මේ වන විට ධනවාදී මාවත අසාර්ථක වී තිබෙනවා. මේ අධිරාජ්‍යවාදී යුගයේදී සමාජවාදයට තමයි රටක දේශපාලන, ආර්ථික, සංස්කෘතික වශයෙන් රටක ස්වෛරීත්වයත් ජාතික රාජ්‍යයක් වශයෙන් ශක්තිමත්භාවයත් ඒ වගේම එහි පොදු ජනතාවගේ ආර්ථික, සංස්කෘතික මට්ටම ඉහළ දැමීමත් සිදුකළ හැක්කේ.

ඒක අද තිබෙන සමාජවාදී රටවල් කිහිපයෙන් ඔප්පු වී තිබෙනවා. වියට්නාමය ගත්තත් කියුබාව ගත්තත්, චීනය ගත්තත් එම රටවල් ජාතික රාජ්‍යයන් ලෙස ශක්තිමත් වෙනවා. එම රටවල ජනතාවගේ ආර්ථික, සංස්කෘතික මට්ටමත් පැහැදිලිව වර්ධනය වෙනවා. ඒ නිසා රටක් ගොඩනැගීම පිළිබඳ සමාජවාදී මාවතක් තිබෙනවා. දැන් මේ වර්තමාන විෂය ශීර්ෂ 10කට ගොනුවෙලා රට ගොඩනඟන වැඩපිළිවෙළ සකස් කරන කමිටු 10 තුළ විද්වතුන් 200කට වැඩි ප්‍රමාණයක් ඉන්නවා. ඔවුන් සකස් කරන වැඩපිළිවෙළ ගත්තොත් අපි පැහැදිලිව කියන්න ඕනෑ ඒ හැදෙන්නේ සම්පූර්ණ සමාජවාදී වැඩපිළිවෙළක් නෙවෙයි. ධනේශ්වර සීමාව තුළ තිබෙන නමුත් අධිරාජ්‍යවාදී ව්‍යාපෘතිවලට ගැති නොවූ ජනතාවාදී සමාජ ආර්ථික වැඩපිළිවෙළක මූලික ලක්ෂණ සහිත එකක් තමයි මේ විද්වතුන් මාර්ගයෙන් හැදෙන්නේ.

අපි දකිනවා දැන් අපේ රට සමාජවාදය දක්වා ගෙනියන්න මේ රටේ ජනතාව අවදිකර ගන්න අවශ්‍යයි. ජනතාව අවදිවෙන්නේ නැතිව අපිට සමාජවාදී ප්‍රතිපත්ති සහිත රාජ්‍යයක් ගොඩනඟන්න බැහැ. ඒ නිසා අපි දකින දේ තමයි ඒ සඳහා අපේ රටේ විද්වතුන්, වැඩකරන පංතිය, ගොවි ජනතාව, ශිෂ්‍යයන්, පීඩාවට පත් ජනකොටස් වගේම අතිවිශාල පංගුවක් වුණු විද්වතුන්, වෘත්තිකයන් අයත් වන මිලියන 05ක වගේ මධ්‍යම පාංතික පිරිසක් සුවිශාල භූමිකාවක් අපේ රට තුළ ඉටුකරනවා. ඔවුන්ගෙන් ඉතාම තීරණාත්මක කොටසක් එනම් ඉතාම බුද්ධිමත් සහ බලපෑම් සහගතම කොටස මේ ධනේශ්වර දේශපාලන පක්ෂ දෙක පිළිබඳ කලකිරී තිබෙනවා. මේ කණ්ඩායම් දෙකට කිසිසේත්ම රට හදන්න බැරි බව ඔවුන් සවිඥානිකව තේරුම් ගෙන තිබෙනවා. ඒවගේම ඔවුන් දකිනවා, මේ අවස්ථාවේදී යම් යම් කොන්දේසිවලට යටත්ව වුණත් ජ.වි.පෙ. එක්ක තමයි වැඩ කළ හැක්කේ කියන එක. අපි ඉතා කුඩා වමේ කණ්ඩායමක් නොවෙයි. අපි රටේ ජාතික දේශපාලනයේ හැම ඉසව්වකටම දැවැන්ත බලපෑමක් සහිත දේශපාලන ව්‍යාපාරයක් බව ඔවුන් දන්නවා.

අපේ රට දැන් මේ රට වැටී තිබෙන දේශපාලන, ආර්ථික, සංස්කෘතික අගාධයෙන් ගොඩ අරගෙන ජනතාවත් ව්‍යසනයෙන් යම් ප්‍රමාණයකට ගොඩනඟන, න්‍යායික වශයෙන් ගත්තොත් වාම ප්‍රගතිශීලී ආණ්ඩුවක බලය මත පුළුල් ජනතාවාදී ප්‍රතිසංස්කරණ මාර්ගයෙන්
රට වැටී තිබෙන තැනින් ගොඩනැගීම ඉලක්ක කරගත්තු වැඩපිළිවෙළක් තමයි ජ.වි.පෙ. සහ මේ උගත් විද්වත් කණ්ඩායම මගින් සකස් කෙරෙන්නේ. ඒ නිසා අපි දකිනවා, රටේ ජනතාව තුළ සමාජවාදය පිළිබඳව වාම ප්‍රගතිශීලී ප්‍රතිපත්තීන් පිළිබඳව අලුත් ප්‍රබෝධයක්, අලුත් විශ්වාසයක් ගොඩනැගීම මගින් අනාගත සමාජවාදී නවීන සමාජවාදී පාලනයකට අවශ්‍ය කරන මූලික දේශපාලන පසුබිම සකස් කරගන්න මේ වැඩපිළිවෙළ උදව්වෙයි කියලා.

දැනට අධ්‍යාපනය, සෞඛ්‍ය, ආර්ථිකය, ජාතික සංහිඳියාව, ප්‍රවාහනය ඇතුළු ප්‍රධාන ක්ෂේත්‍ර 10කට සම්බන්ධ වෙලා ඔවුන් රට මේ තියෙන අදියරේ සිට ඉදිරි පිම් ගණනාවකින් රට ඉදිරියට ගැනීමට අවශ්‍ය කරන ප්‍රතිපත්තීන් සම්පාදනය කරමින් ඉන්නවා. ඔවුන් ඒ සඳහා මූලික වැඩකටයුතු සකස් කරල අවසානයි. ඔවුන් අගෝස්තු මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වා මේ ප්‍රතිපත්ති සකස් කිරීමේදී ජනතාව මුණ ගැසෙන්න දිස්ත්‍රික්ක 25ටම මේ කමිටු වෙන වෙනම යනවා. එහෙම ගත්තොත් කමිටු 10 විද්වතුන්ගෙන් අඩුම ගානෙ මහජන මුණගැසීම් විතරක් 250ට වැඩි ප්‍රමාණයක් සිදුවේවි. ඒ අනුව එම ක්‍රියාවලිය දැනටත් ආරම්භ වී තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා ජනවාරි මාසෙ වෙනකොට මේ ප්‍රතිපත්ති සම්පාදනය අවසන් කරන්න.

***නියමුවා:- ඔබ අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදක කමිටුව නියෝජනය කරනවා. ජාතික වැඩපිළිවෙළ සකස් කිරීමේදී විද්වතුන්ගේ දායකත්වය, සම්පාදන ක්‍රියාවලිය සහ පොදු වැඩපිළිවෙළේ වත්මන් ප්‍රගතිය පිළිබඳව යමක් කිවුවොත්.***

***බිමල් රත්නායක සහෝදරයා:-*** මම අධ්‍යාපන ප්‍රතිපත්ති කමිටුවේ සාමාජිකයෙක් වශයෙන් ඉන්නවා එහි සභාපතිත්වය මහාචාර්ය අතලගේ මහතා දරනවා. ඒ වගේම විශ්වවිද්‍යාල ආචාර්යවරු, විශේෂයෙන්ම ගත්තොත් ජාතික අධ්‍යාපන ආයතනයේ හිටපු ඉහළම නිලධාරින්, විද්‍යා පීඨවල කටයුතු කරන පීඨාධිපතිවරුන් වගේම ගුරුවරුන්, ගුරු සංගම් නායකයන්, ශිෂ්‍ය සංගම් නායකයන් වැනි පිරිසකගෙන් තමයි මේ කමිටුව සකස් වී තිබෙන්නෙ. මේ වන විට අවස්ථා කිහිපයක්ම මේ කමිටුව මුණගැසී
තිබෙනවා. ඒ අනුව දැනට අපි මේ කමිටුව විදිහට බලාපොරොත්තු වෙනවා මේ සැප්තැම්බර් මාසෙ මුල සිට දැනට ඉල්ලීම් කර තිබෙන රටේ දිස්ත්‍රික්ක 20කට පමණ ගිහිල්ලා ජනතාව අධ්‍යාපන වෘත්තිකයන් දෙමව්පියන් විවිධ සමාජ කණ්ඩායම් අධ්‍යාපන ගැන උනන්දුවක් දක්වන අය මුණගැසෙන්න. 'පබ්ලික් හියරිං' එකක් විදියට.

මෙවැනි බරපතළ ලෙස රටක් පාලනය කිරීමට උචිත ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමක් ලංකා ඉතිහාසයේ මේ සිද්ධ වෙන්නේ මේ පළමුවෙනි වතාවට. මීට කලිනුත් විවිධ ආණ්ඩුවලින් පුංචි පුංචි දේවල් කරල තිබුණා. නැතිව නෙවෙයි. අපි අපේ රටේ ගත්තොත් මෙවැනි බැරෑරුම් ව්‍යායාමයක් සිද්ධ වෙන්නේ පළමුවෙනි වතාවට. මෙයට සම්බන්ධ වී සිටින උගතුන් ඉතාමත් ගැඹුරින් මේ සම්බන්ධව මහන්සි වෙනවා. ඔවුන් වඩා උචිතම ජනතාවට අත්‍යවශ්‍යම ප්‍රශ්නවලට විසඳුම් ලැබෙන විදිහේ ප්‍රතිපත්ති සකස් කරමින් ඉන්නවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, ඉතාමත් ප්‍රායෝගික සහ නවීන ජනතාවාදී අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් වෙයි කියලා. අපි ඒක මූලධර්ම ගණනාවක් මත පදනම් වෙලයි කටයුතු කරන්නේ. නොමිලේ අධ්‍යාපන ක්‍රමය රැකෙන, අධ්‍යාපන ගුණාත්මකභාවය ආරක්ෂා වෙන, ඒ වගේම නවීනත්වය සමග යා හැකි අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කිරීම සම්බන්ධව තමයි විද්වතුන්ගෙ මූලික අදහස වී තිබෙන්නෙ. විශේෂයෙන්ම අධ්‍යාපනයේ සමානතාවය රැකගැනීම වගේම අධ්‍යාපන ප්‍රමිතිය පිළිබඳව බරපතළ සාකච්ඡාවක් අපේ විද්වතුන් අතර ඇති වී තිබෙනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, විශේෂයෙන්ම මෙම මහජන මුණගැසීම් සමග මේ වසරේ නොවැම්බර් මස අග පමණ වන විට මේ අධ්‍යාපන ප්‍රතිපත්තියේ අවසාන කෙටුම්පත සකස් කරන්න.

***නියමුවා:- රට හදන රට රකින ජනතාවාදී පාලනයක් තේමාව යටතේ ජ.වි.පෙ. ජනහමු දසදහසක් රට පුරා පවත්වමින් යනවා. ඊට ලැබෙන ජනතා ප්‍රතිචාර කොහොමද?***

***බිමල් රත්නායක සහෝදරයා:-*** ඔව්, ජූලි 15 සිට ජනතා විමුක්ති පෙරමුණ විදිහට අපි ජනහමු දස දහසක් ආරම්භ කරලා ක්‍රියාත්මක කරගෙන යනවා. ඒ අනුව අපි ලංකාවේ යාපනය දිස්ත්‍රික්කයේ සිට හම්බන්තොට දිස්ත්‍රික්කය දක්වා සෑම දිස්ත්‍රික්කයකම මේ වෙනකොට ජනහමු පවත්වලා තිබෙනවා. පක්ෂයේ ප්‍රධාන පෙළේ පක්ෂ නායක අනුර දිසානායක සහෝදරයාගේ ඉඳලා කථිකයන් 25කට ආසන්න ප්‍රමාණයක් මේ ජනහමුවලට සම්බන්ධ වෙලා තිබෙනවා. අපිට දකින්න තියෙන්නේ විශේෂත්වය තමයි ජනතාව තුළ විශාල දේශපාලන උනන්දුවක් තිබෙනවා කියන එක. මොකද අපිට පේනවා විශේෂයෙන්ම ගම් මට්ටමේ විශේෂයෙන්ම පොහොට්ටුවේ සහ එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ ජන කණ්ඩායම් විශාල වශයෙන් මේ රැස්වීම්වලට සහභාගි වෙනවා.

පසුගිය පෙබරවාරි මැතිවරණයේදී පොහොට්ටුවට ඡන්දය දුන්නු ජනතාව නිසා පොහොට්ටුව විශාල මැතිවරණ ජයග්‍රහණයක් ගත්තා. හැබැයි පසුගිය මාස 5-6 තුළදී අපි දැක්ක දේ තමයි පොහොට්ටුව බලයට පත්වුණු කිසිම ප්‍රාදේශීය සභාවක, නගර සභාවක ඔවුන් හරියාකාර වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළේ නැහැ. ඔවුන් ඡන්ද දිනාගත්තට ජනතාවට සේවයක් කළේ නැහැ. ඒ වගේම ඔවුන් සැලකිය යුතු පිරිසක් පොහොට්ටුවේ මන්ත්‍රීවරු විවිධ දූෂණ - වංචාවලට නාස්තිකාර වැඩවලට අහුවෙලා තිබෙනවා. පොහොට්ටුව යම්කිසි දේශපාලන ජයග්‍රහණයක් ලබාගත්තට ඊට ගැලපෙන දේශපාලන භාවිතාවක් නැතිවීම නිසා ඒ ගැන කලකිරුණු ජන කොටසුත් මේ ජනහමුවලට එනවා. ඊට අමතරව අද පොහොට්ටුව පක්ෂය ඇතුළේ විශේෂයෙන්ම රාජපක්ෂ පවුල් කණ්ඩායම අතරම, ගෝඨාභය පිල, බැසිල් පිල අතර ඇතිවී තිබෙන ගැටලුව නිසාත් එය දෙදරායාම පටන් අරන් තියෙනවා. ඒ නිසාත් එතන ජන කණ්ඩායම් අපේ ළඟට එනමින් ඉන්නවා. ඒ වගේම ආණ්ඩුව ඉතාමත් බරපතළ ලෙස පිරිහීම නිසාත් ජනතාව විශේෂයෙන්ම යූ.එන්.පී.යට සම්බන්ධ ජන කොටස් අපේ ජනහමුවලට සහභාගි වෙනවා.

ඒ වගේම තමයි අපි මේ ජනහමු වැඩි වශයෙන් පවත්වන්නෙ ඉතාම ගම්බදව. ග්‍රාමීය ප්‍රදේශවල. ඒවයේදි අපි දැක තිබෙනවා, විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණේ අපේ අලුත් තරුණ මන්ත්‍රීවරු මේ ජනහමු සංවිධානය කිරීමේ විශාල කාර්යභාරයක් ඉටුකරනවා. ඒ වගේම අපේ අපේක්ෂක අපේක්ෂිකාවන් ඔවුන් විශේෂයෙන්ම අලුත් අය සංවිධානය කරන එවැනි ජනහමුවල සාර්ථකභාවය සහ ඒවාට සහභාගි වන පිරිස අපිට පේනවා. අපි දැක්ක පළාත් පාලන මැතිවරණයේදි ජනතා විමුක්ති පෙරමුණට විශාල රැල්ලක් තිබ්බා. හැබැයි ඒ රැල්ල ඡන්ද ප්‍රතිඵලය තුළ පෙනුණෙ නැහැ. සමහර අය අපිට සමහර අය කිවුවා, අපිත් හිතුවා ඡන්දෙදි ළං වෙච්ච පිරිස ජ.වි.පෙ.න් ඈත් වෙලා කියලා. නමුත් අපිට පැහැදිලිව පේනවා, ජනහමු මාලාවට ගියාම එහෙම නැහැ එම පිරිස ජ.වි.පෙ.ත් සමග ඉන්නවා කියලා. ඒ වගේම අලුතෙන් වෙනත් පක්ෂවලට ඡන්දය දුන්නු අය පවා අප වෙත ආකර්ෂණය වෙමින්, ජනහමුවල අපි පවසන දේ ගැන උනන්දුවක් දක්වනවා.

මේ ජනහමුවල අපි කරමින් ඉන්නෙ පවතින පාලනය හෝ පසුගිය පාලනය විවේචනය කිරීමට වඩා විශේෂයෙන්ම 2020 දේශපාලන පරිවර්තනය කරන විදිහත් ඒ දේශපාලන පරිවර්තනය මගින් රට හදන විදිය තමයි අපේ සාකච්ඡාව වෙන්නෙ. ජනතාව තුළ ඒ ගැන විශාල උනන්දුවක් තිබෙන බව පේනවා. කොහොමද රට හදන්නෙ, කොහොමද ප්‍රවාහන ප්‍රශ්න විසඳන්නෙ, කොහොමද රටේ කෘෂිකර්මාන්තයේ ප්‍රශ්න විසඳන්නෙ කියන එක පිළිබඳව ජනතාව තුළ විශාල උනන්දුවක් තිබෙන බව පේනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරියේදී මේ ජනහමු මාලාවට අපේ මේ විද්වත් කණ්ඩායමේ උගතුන් විශාල වශයෙන් සම්බන්ධ කර ගන්න. ජනතා විමුක්ති පෙරමුණේ කථිකයන්ට අමතරව විශ්වවිද්‍යාල උගතුන්, විවිධාකාර පරිපාලන ක්ෂේත්‍රයේ උගතුන්, කෘෂි විද්‍යාඥයන්, ආර්ථික විද්‍යාඥයන් වැනි විද්වතුනුත් මේ ජනහමු මාලාවට සම්බන්ධ කර ගන්න පක්ෂය මෑතකදී තීරණයක් ගත්තා. අපි ඒ විද්වත් මණ්ඩලවලින් ඉල්ලා සිටියා මේ ජනහමුවලට සහභාගි වෙන්න කියලා.

ඒ අනුව අපි බලාපොරොත්තු වෙනවා, මේ ජනහමු මාලාව ඉදිරි මාස දෙක තුළත් අලුත් ගුණයකින් ගම්වලට ගෙනියන්න. ඊට අමතරව අපි ගෙන් ගෙට ගිහිල්ලා කැන්වසින් ව්‍යාපාර ආරම්භ කරලා තිබෙනවා, යාපනයේ සිට හම්බන්තොට දිස්ත්‍රික්කය දක්වාම හැම දිස්ත්‍රික්කයකම. එහිදී අපි විසිවෙනි සංශෝධනය පිළිබඳවත් රටේ ආර්ථිකය විනාශ කරන මෛත්‍රී-රනිල් පාලනයේ ආර්ථික පාවාදීම සම්බන්ධවත් මේ 2020 වැඩපිළිවෙළ පිළිබඳවත් ජනතාව දැනුවත් කරනවා. ඒ නිසා අපිට කියන්න පුළුවන් ජනහමු මාලාව සැලසුම් කරන මොහොතේ අපේ අදහසේ තිබුණාට වඩා සාර්ථකත්වයක් භූමියේදී අත්පත් කරගනිමින් ඉන්නවා කියලා.

## සමාජවාදය තුළ..

9 පිටුවෙන්

ගොඩනගාදීම සමාජවාදය විසින් සිදුකළ තවත් එක් දැවැන්ත කාර්ය භාරයකි. එය ඉතිහාසයේ ඉන් පෙර අත් නොදුටුවකි. ඉන්පසු කිර්ගීස් භාෂාවෙන් උසස් අධ්‍යාපනය දක්වා අධ්‍යාපනය ලැබීමටද නිර්මාණකරණයේ යෙදීමටද කිර්ගීස් ජාතිකයන්ට හැකි විය. චින්ගීස් අයිත්මාතව් වැනි ශ්‍රේෂ්ඨ සාහිත්‍යධරයෙකු ලොවට බිහිවූයේ එහි ප්‍රතිඵලයක් ලෙසටය.

### චීනයේ අත්දැකීම්

සමාජවාදය යටතේ චීනයද කියවීම දිරිගැන්වීම සඳහා විවිධ අයුරින් මැදිහත් වෙමින් සිටී. විශේෂයෙන් ඩිජිටල් තාක්ෂණය හමුවේ කියවීම ජනතාවගෙන් දුරස්වීමේ ප්‍රවණතාව වෙනස් කිරීමට චීනය ක්‍රියාමාර්ග ගනු ලැබ තිබේ.

ඉන් එක් සංකල්පයක් වන්නේ, පැය 24 පුරාම විවෘතව තැබෙන පුස්තකාල හා පොත්හල් ආරම්භ කිරීමය. මීට අමතරව මෙම පොත් සාප්පුවලදී පොත් මිලදී නොගෙන පොත් කියැවීමට පාරිභෝගිකයන්ට ඉඩ ලබාදී තිබේ. ඒ සඳහා මෙම පොත් සාප්පු තුළ කෝපි අවහන්හල් පිහිටුවා ඇති අතර, ඒවායේ සිට පොත් කියැවීමට පාඨකයන්ට ඉඩ ලැබේ.

එසේම We chat වැනි සමාජ මාධ්‍ය උපයෝගී කර ගනිමින් ලොව පුරා සිටින පාඨකයන්ට සාහිත්‍ය කියැවීමේ සමිති හා සංගම් ගොඩනගා ගැනීමට ඉඩ ලබාදී තිබේ. මෙම සාහිත්‍ය හා කියැවීමේ කණ්ඩායම්වලට බැඳෙන සාමාන්‍ය ජනතාවට උසස් සාහිත්‍ය කෘති කියැවීමටත් ඒ පිළිබඳ සංවාදයෙහි නියැලීමටත්, ඒවායේ කර්තෘවරුන් සමග සංවාදයේ යෙදීමටත් අවස්ථාව සැලසේ.

## විපක්ෂ නායක ධුරය...

13 පිටුවෙන්



සන්ධානයේ 70දෙනෙක් ඒකාබද්ධ විපක්ෂයේ ඉන්නවා නම්, 23දෙනෙක් ආණ්ඩුවේ ඉන්නවා නම් -96ක් හැදෙන්න නම් 26දෙනෙක් ඉන්න ඕනෑ. ඇත්ත ගණන මම දන්නේ නැහැ 70යි,26යි නම්, පළමු ප්‍රශ්නය බේරා ගන්න. මෙතැනට ඇවිල්ලා කෑ ගහන්නේ නැතිව ඔය 26දෙනා යටත් කරලා එක්සත් ජනතා නිදහස් සන්ධානයේ බලය ගන්න.

ඔබතුමන්ලාට මන්ත්‍රීවරු 70දෙනෙක් ඉන්නවා; අවුරුදු 36ක දීර්ඝ පළපුරුද්දක් තිබෙන ආසන සංවිධායකවරු ඉන්නවා; දැවැන්ත ඇමතිවරු ඉන්නවා; හිටපු ජනාධිපතිවරු ඉන්නවා; ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු නායකයා ඉන්නවා; ජනාධිපති ධුරය අවුරුදු 10ක් දරපු අය ඉන්නවා. මේ සියල්ලම තියාගෙන, මන්ත්‍රීවරු 70දෙනෙකුත් තියාගෙන මේ 26කට යටවෙලා ඉන්නේ මොකටද? ඒ නිසා මෙතැන නොවෙයි, ප්‍රශ්නය බේරා ගන්න ඕනෑ. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ විධායක කාරක සභාව ඇතුළේ මේ ප්‍රශ්නය බේරා ගන්න.

ඒ බලය අරගෙන ඇවිත් මෙතැනදී කියන්න, "දැන් අපි එක්සත් ජනතා නිදහස් සන්ධානයේ බලය අරගෙන තිබෙනවා, අපට දැන් විපක්ෂ නායකකම දෙන්න" කියලා. එතකොට ඒකට සාධාරණයක් ඉෂ්ට කරන්න ඕනෑ. අපි කියන්නේ, හෙටත් එක්සත් ජනතා නිදහස් සන්ධානය හැටියට තීරණයක් අරගෙන, විපක්ෂයේ වාඩිවෙලා, විපක්ෂ නායක ධුරය අයිතියි කියා කියනවා නම් ඒක සාධාරණයි කියලයි. ඒ පිළිබඳව කිසිදු විවාදයක් නැහැ.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com





පරාධීනත්වයට එරෙහිව...



කිරි ගොවීන් ආරක්ෂා කරගැනීම වෙනුවෙන්...



ජාතිවාදයට එරෙහිව කඳවුරු බඳිමින්...



යාපනයේ දමිළ ජනතාවගේ ගැටලුවලට සවන් දෙමින්...



කෑගල්ලේ වගා ආරක්ෂා කරගැනීමට මැදිහත් වෙමින්...




දැයේ දරුවන්ට අතහිත දෙමින්...

## අසාර්ථක ආණ්ඩුවට එරෙහිව ජනතාව සංවිධානය කිරීමට ජ.වි.පෙ. සූදානම්

### ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා

ගතවූ වසර තුන මුළුල්ලේම ආණ්ඩුව ඔප්පු කර තිබෙන්නේ තමන්ගේ අසමත්කම බව පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා එම කාලය තුළ ආණ්ඩුව සැබැවින්ම කළේ ආණ්ඩුවක් නොකිරීම යැයිද ආණ්ඩුව නිසි පරිදි පාලනය ගෙන ගියේනම් රට මේ තරම් අර්බුදයකට නොයන බවද ඉදිරියේදී වත්මන් අසාර්ථක ආණ්ඩුවට එරෙහි විශාල සටනකට ජනතාව සංවිධානය කිරීමට ජ.වි.පෙ. සූදානම් බවද කියා සිටියේය.

විජිත හේරත් සහෝදරයා මේ බව පැවසුවේ ආණ්ඩුවේ වසර පසුගිය 23වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද ජනමාධ්‍ය හමුවකදීය. එහිදී වැඩිදුර අදහස් පළ කළ විජිත හේරත් සහෝදරයා මෙසේද පැවසීය.

"පසුගිය වසර තුන තුළ ආණ්ඩුව ජනතාවගේ බලාපොරොත්තු කඩකළා. හොරකම් නතර කරනවා කියලා ඇවිත් හොරකම් කරන්න පටන් ගත්තා. හොරු අල්ලපු නැති නිසා ඒ හොරුන්ම අද ආණ්ඩුව හොරු ඇල්ලුවේ නැහැ කියලා පෝස්ටර් ගහන තත්වයකට පත්වෙලා තිබෙනවා. ඒ නිසා මේ ආණ්ඩුව ජනතාවගෙන් සමාව ගත යුතුයි. ඒ වගේම ආණ්ඩුව ඉල්ලා අස්විය යුතුයි. මේ ආණ්ඩුවට තවදුරටත් ජනතාවගේ ප්‍රශ්න විසඳන්න පුළුවන්කමක් නැහැ. මාස 60න් රට හදනවා කිවුවාට දැන් මාස 36ක් ගෙවිලා ඉවරයි.

ජනතාවගේ දුප්පත්කම නැති කරන්න වැඩපිළිවෙළක් ආණ්ඩුවට නැහැ. ජනතාවගේ ජීවන වියදම වැඩිවීමේ ප්‍රශ්නයට විසඳුම් දුන්නේ නැහැ. දවසින් දවස අසමත් වුණු මේ ආණ්ඩුව ඡන්දවලට යන්න බය වුණා. ඒ නිසා ඡන්ද කල් දාන ක්‍රියාමාර්ගයකට යන්න පෙළඹුණා. මේ වෙනකොට පළාත් සභා මැතිවරණයත් දිනෙන් දින කල් දමමින් තිබෙනවා. මේ ආණ්ඩුව ජනතාවගේ පරමාධිපත්‍ය බලය එක්ක සෙල්ලම් කරන්න පටන් අරගෙන.

අපි පක්ෂයක් විදිහට මෙම අර්බුදය සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කරනවා. මහ බැංකු හොරකමේ ඉඳලා බස්නාහිර පළාත් සභාවේ රු. හයලක්ෂ හතළිස් දාහේ පුටුව දක්වා හෙළිදරව් කළේ ජනතා විමුක්ති පෙරමුණයි. පාර්ලිමේන්තුව ඇතුළු සියළුම ආයතනවලදී අපි අපේ කාර්යභාරය



හරියට කරනවා. ඒ විතරක් නෙවෙයි ඉදිරියේදී ජනතාව සහභාගි කරවා ගනිමින් ආණ්ඩුවට එරෙහි විශාල සටනකට ජනතාව සංවිධානය කරනවා.

මේ වනවිටත් අපි රට හදන, රට රකින ජනතාවාදී පාලනයක් මැයෙන් ජනතාව දැනුවත් කිරීමේ ජනහමු දස දහසක් රට පුරා පවත්වමින් යනවා. ඒ වගේම උගතුන්, බුද්ධිමතුන් ඒකරාශී කරගනිමින් රට ගොඩනැගීමේ ජාතික වැඩපිළිවෙළක් සකස් කිරීම අපි ආරම්භ කොට තිබෙනවා. ඉදිරි මාස 06 තුළ එම වැඩපිළිවෙළ රටට ඉදිරිපත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා."

## බහුජාතික සමාගමට ඉඩම් දීමේ කුමන්ත්‍රණය ගැන විවාදයකට සූදානම්

### ජ.වි.පෙ. මධ්‍යම කාරක සභික සමන්ත විද්‍යාරත්න සහෝදරයා

ඌව පළාතේ ජනතාව දහස් ගණනක් පරම්පරා 10ක ඉඩම් හිමිකමක් නොමැතිව සිටියදී බහුජාතික සමාගමකට රිදීමාලියද්ද දෙහිගම ප්‍රදේශයේ ඉඩම් අක්කර 65,000ක් ලබාදීමට යන බවට චෝදනා කළ ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික සමන්ත විද්‍යාරත්න සහෝදරයා මෙම කුමන්ත්‍රණය පිළිබඳව ප්‍රසිද්ධ විවාදයකට පැමිණෙන ලෙස එහි හවුල්කරුවන් බවට පත්ව සිටින ඌව පළාත් මහ ඇමැති චාමර සම්පත් දසනායකට සහ විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය ඇමැති ලක්ෂ්මන් සෙනෙවිරත්නට අභියෝග කර සිටියේය.

සමන්ත විද්‍යාරත්න සහෝදරයා මේ බව පැවසුවේ පසුගියදා බදුල්ලේ පැවති මාධ්‍ය හමුවකදීය. මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ ඔහු මෙසේද පෙන්වා දුන්නේය.

"බිබිල සීනි සමාගම ස්ථාපිත කිරීම සඳහා රිදීමාලියද්දේ අහිංසක හේන් ගොවියාගේ ඉඩම් ටික උදුරාගෙන බහුජාතික සමාගමකට ලබාදීමට පළාතේ ජනතාවගේ ඡන්දයෙන් ඉහළට ගිය ඌව පළාත් මහ ඇමැති සහ රාජ්‍ය ඇමැති ලක්ෂ්මන් සෙනෙවිරත්නද මේ වන විට හවුල් වී තිබෙනවා. එම ඉඩම් ලබාදීමට විරෝධතාව පළකරන මට එරෙහිව පසුගියදා රිදීමාලියද්ද ඌරණිය ප්‍රදේශයේදී උද්ඝෝෂණයක් පැවැත්වුවා. ඒක ලංකාවේ ප්‍රථම වරට බහුජාතික සමාගමක වුවමනාවට රාජ්‍ය අනුග්‍රහයෙන් පවත්වපු උද්ඝෝෂණයක්.

එදා උඩරට ගිවිසුමෙන් පස්සෙ සුද්දට විරුද්ධව මුලින්ම අරගල කරන්න පටන් ගත්තෙ ඌව වෙල්ලස්සෙ මිනිස්සු. අවුරුදු 200ක් ගතවෙලත් තාම ඒ අරගලය ඉවර නැහැ. අදටත් තමන්ගෙ උපන් බිම රැකගන්න අරගල කරන්න ඌව වෙල්ලස්සෙ මිනිස්සුන්ට සිද්ධ වෙලා. ඇයි? මේකෙ ඉන්න කළු සුද්දන්ට ඕනැ සුද්දන්ට මේකෙ ඉඩම් ටික දෙන්න. ඇමෙරිකානු ඩෝල් සමාගමට අක්කර දහස් ගාණක් දීලා. උන් අපේ මිනිස්සුන්ගේ ශ්‍රමය කුණු කොල්ලෙට අරන් අපේ පසේ සාරය සූරාගෙන උන්ගෙ රටට අරන් යනවා. ඌව පළාත් සභාවට එක සත පහක බද්දක් දෙන්නේ නැහැ. අපේ පළාතෙ පෙට්ටි කඩයටත් බදුගහන



ඇමැතිලා ඒවා ගැන කතා කරන්නෙත් නැහැ. එදා සුද්දා බලෙන් කළ දේ අදත් උන් කරනවා කළු සුද්දන්ට කොමිස් දීලා.

දැන් ඌවේ මහ ඇමැති ඇතුළු දේශපාලන බලධාරීන් ඒ කොන්ත්‍රාත්තුව භාරගෙන මුදල් හා වරප්‍රසාද ලබමින් මෙම ඉඩම් කොල්ලය සාර්ථක කර ගැනීමට කටයුතු කරමින් සිටිනවා. එයාලගෙ සාක්කුවට ගාණ වැටෙනකොට ගම්වැසියෝ රවට්ටලා සමහර හාමුදුරුවරුත් රවට්ටලා මේ ඉඩම් කොල්ලය කරගෙන යනවා."

## ජනමාධ්‍යවලින් ජනතාවට නිවැරදි තොරතුරු ලැබෙනවා අඩුයි

### ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික වසන්ත සමරසිංහ සහෝදරයා



ජනමාධ්‍ය ආයතන තම තමන්ගේ දේශපාලන වුවමනාකම් අනුව ජනතාවගේ තොරතුරු දැනගැනීමේ අයිතිය උල්ලංඝනය කරන බව පැවසූ ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික වසන්ත සමරසිංහ සහෝදරයා පැය එකහමාරක පමණ කතාවෙන් තමන්ට වුවමනා තප්පර 10ක කොටසක් කපාගන්නා මාධ්‍යකරණයක් ක්‍රියාත්මක වන බැවින් ජනතාවට නිවැරදිව සියලු තොරතුරු ලැබේයැයි සිතිය නොහැකි බව ප්‍රකාශ කළේය.

වසන්ත සමරසිංහ සහෝදරයා මේ බව පැවසුවේ පසුගියදා හෙම්මාතගමදී පැවති ජනහමුවකදීය. ඔහු වැඩිදුරටත් මෙසේද පැවසීය.

"ගෙවුණු අවුරුදු 70දි පාලකයො තට්ටු මාරු ක්‍රමයට එහාට මෙහාට පනිමින් ජනතාවට බොරු කළා. ජනතාව රැවැට්ටුවා. මෛත්‍රිපාල මහත්තයා මීට මාසයකට විතර කලින් කීවා ආර්ථිකය හසුරුවන යාන්ත්‍රණය මං අතට ගන්නවා කියලා. දැන් එල්ලුම් ගහ බදා ගෙන ඉන්නේ හිරේ ඉඳන් කුඩු විකුණන අයට එල්ලුම් ගහ ක්‍රියාත්මක කරනවා කියලා. මේ කෙරෙන වැඩ නෙවෙයි.

අපේ රටේ මාළු මිලත් එක්ක බැලුවොත් ලෝකයේ මුහුදු නැති රටවල මාළු මිල ලංකාවට වඩා අඩුයි. 2016 වසරේ අපේ රටට කරවලයි මාළුයි ගෙනත් තියෙනවා රුපියල් කෝටි 3160ක. එතකොට මාලදිවයිනේ අපේ රටට උම්බලකඩ කරවල එවනවා. චීනයේ එක පැත්තක මුහුද තියෙන්නේ චීනයෙන් මුහුදු මාළු අපේ රටට එවනවා. චිලී රටේ එක පැත්තක මුහුද තියෙන්නේ මුහුදු මාළු අපේ රටට එවනවා. රට හදනවා නම් මාළු ටික ඇල්ලුවත් රට යම් තරමකින් හරි ගොඩගන්න පුළුවන්. එහෙම ඉලක්කයක් නැහැ. කෘෂිකර්මය ගත්තොත් ඒ ගැනත් ඔය ටික තමයි කියන්න තියෙන්නේ.

වෙනත් රටවල මිනිස්සු දින 365ම වැඩ කරන්නේ නැහැ. නිවාඩු තියෙනවා. වෙනත් රටවල ඇවිදින්න ගිහින් විනෝද වෙනවා. නමුත් අපේ රටවල මිනිස්සු හැමදාම වැඩ කරනවා. නිදහසක් නැහැ. නිදහස ගන්නේ දේශපාලනඥයන් හා ඔවුන්ගෙන් උදවු ඇති අය පමණයි. අපි අවුරුදු 70ක් තිස්සේ තට්ටු මාරු ක්‍රමයට මේ පක්ෂ දෙක බලයට පත් කරලා රට විනාශ කරන්න ඉඩ දීලා බලා හිටියා. එහෙම නම් දැන් හොඳින් සිතිය යුතු කාලය උදා වෙලා තියෙනවා."


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිලියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.